# භූගෝල විද්‍යාව

## ගුරු මාර්ගෝපදේශය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

### මූලික පිරිවෙන

### 5 ශ්‍රේණිය

මුද්‍රණය සහ බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# භූගෝල විද්‍යාව

## මූලික පිරිවෙණ

## ගුරු මාර්ගෝපදේශය

## 5 ශ්‍රේණිය

**(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**


**පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකාව**

**පිරිවෙන් අධ්‍යාපන ඒකකය**
**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**



වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

වෙබ් අඩවිය : www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : Pirivena@moe.gov.lk



මුද්‍රණය හා බෙදා හැරීමේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

භූගෝල විද්‍යාව
මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය
5 ශ්‍රේණිය
ප්‍රථම මුද්‍රණය : 2020

© ජාතික අධ්‍යාපන ආයතනය
© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය
ISBN 978-955-25-0572-0

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් ලිපිනය** : info@nie.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
ගාල්ල, අම්බලන්වත්ත, මොරිස් පාර, නො 217/A,
එච්.ඒ.සී. කර්මාන්තායතනයෙහි මුද්‍රණය කරවා
ප්‍රකාශයට පත් කරන ලදී.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකීය බෞද්ධ ජාතික අනන්‍යතාවේ සංකේතය භික්ෂූන් වන්සේ ය. භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය කේන්ද්‍ර කර ගනිමින් සමස්ත ජාතියට ම අධ්‍යාපනික මංපෙත විවර කර දුන් ජාතික පිරිවෙන් අධ්‍යාපනයට දුරාතීතයක් ඇත. අනුරාධපුර යුගයේ සිට ම භික්ෂූන් වහන්සේගේ නායකත්වය යටතේ පිරිවෙන් අධ්‍යාපනය කෙතරම් සුහුඹුල් ව වැඩී ගියා ද කිවහොත් විදේශික යන් පවා මෙරටට පැමිණ අධ්‍යාපනය හදාළ බව පුරාවෘත්තවලින් පැහැදිලි වේ.

වර්තමානය වන විට පාසල් අධ්‍යාපනය හා සමාන පහසුකම් ලබමින් විහාරස්ථාන කේන්ද්‍ර කොට ගත් පිරිවෙන් ආයතන අධ්‍යාපන අමාත්‍යාංශයේ නිගමනය යටතේ සිය අතීත උරුමයන් එලෙසින් ම ආරක්ෂා කර ගනිමින් පවත්වා ගැනීමට ලැබීම අපගේ සතුටට කරුණකි.

පිරිවෙන් අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් කාලීන අවශ්‍යතා සපුරා ගැනීමට සුදුසු වියත් යතිවර පරපුරක් හා උගත් විනයවත් ගිහි සමාජයක් බිහිකරලීම අපගේ පරම අභිලාෂය විය යුතුය. එයට ශක්තියක් වෙමින් 2018 නව විෂයමාලා සංස්කරණය යටතේ ඔබ අතට පත් කෙරෙන මෙම ගුරු මාර්ගෝපදේශය නව ඉගෙනුම් ක්‍රම ඔස්සේ ශිෂ්‍යයාට අවශ්‍ය දැනුම ලබාදීම සඳහා පරිවෙණාචාර්යවරයාට ආධාරකයක් වනු ඇතැයි අපගේ විශ්වාසයයි. මෙය මැනවින් පරිශීලනය කර නිවැරදි අවබෝධයක් ශිෂ්‍ය ප්‍රජාවට ලබාදීම පරිවෙණාචාර්යවරුන් වන ඔබගේ වගකීමක් සේ දකිමි.

මෙම භාරදූර කාර්ය සම්පූර්ණ කිරීම සඳහා ඇපකැප වූ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවට, ජාතික අධ්‍යාපන ආයතනයට හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

එන්.එච්.එම්. චිත්‍රානන්ද
අධ්‍යාපන ලේකම්

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

පිරිවෙන් ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණීතලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසුකර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්නව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දැ හිතකාමී ජන සමාජයක් පිරිවෙණ මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේ සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙණ මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂාකර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදකව නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙණ සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදක ව නව විෂය මාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදුවන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක්ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මාගේ ස්තුතිය පිරිනමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකේය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණ.

පිරිවෙන් අංශයක් හෝ දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුමන් එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් අධ්‍යාපන ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුද්ද, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි විධිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්හි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මක ව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් අධ්‍යාපන ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය

පෙරදිග ලෝකයේ පැවති ඉතා ප්‍රශස්ත අධ්‍යාපන ආයතන අතර පිරිවෙණට හිමිවන්නේ සුවි ශේෂ ස්ථානයකි. මෙම අධ්‍යාපන ආයතන ක්‍රමයෙන් වැඩී ගොස් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල මට්ටමට සංවර්ධනය වූ බව නොරහසකි. ශ්‍රී ලාංකේය භික්ෂු අනන්‍යතාව හා දේශීය ජන විඥානය පුබුදුවාලීමට එදා සිට අද දක්වා ම පිරිවෙන් අධ්‍යාපනය සමත් වී ඇත. අෂ්ට මූලායතන කේන්ද්‍ර කරගත් අතීත පිරිවෙන් අධ්‍යාපනය ආධ්‍යාත්මික ගුණයෙන් මෙන්ම ධර්මඥානයෙන් ද හෙබි පරපුරක් මෙරටට දායාද කළේ ය.

නූතන පිරිවෙන් අධ්‍යාපනය ජාතික අධ්‍යාපන ප්‍රවාහයේ තවත් එක් සුවිශේෂ පැතිකඩකි. පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධශාසනෝන්තිය උදෙසා අවශ්‍ය භික්ෂූන් වහන්සේ ජාතියට දායාද කිරීම හා උගත් වියත් බුද්ධිමත් පිරිසක් බිහිකිරීම පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රමුඛ අභිලාෂය යි.

සෞභාග්‍යවත් දේශයක් කරා යන මේ ගමනේ දී ආකල්ප සම්පත්තියෙන් යුතු ප්‍රජාවක් නිර්මාණය කිරීමට මග පෙන්වීම භික්ෂූන් වහන්සේගේ ප්‍රබල වගකීමකි. ඒ සඳහා උන්වහන්සේලා අවශ්‍ය දැනුම් සම්භාරයක් පෝෂිත කරවීමට පිරිවෙන පෙරටත් වඩා ශක්තිමත් ව ක්‍රියාත්මක විය යුතුය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යාවත්කාලීන කරමින් නව විෂය නිර්දේශය යටතේ ඉදිරි පියවර රාශියක් තැබීමට අපට හැකිවීම සතුටට හේතුවකි. විවිධ උපාය මාර්ග ඔස්සේ ඉදිරි අනාගත පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමට අප ගන්නා උත්සාහයේ දී ඔබ අතට පත් කෙරෙනනව ගුරු මාර්ගෝපදේශය ශිෂ්‍ය සාධනය ඉහළ මට්ටමකට ඔසවා තැබීමට ප්‍රබල ගුණාත්මක යෙදවුමක් වනු ඇතැයි මාගේ විශ්වාසයයි. සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රම මෙන් ම නූතන ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳව ද පරිවේණාචාර්යවරුන්ගේ දැනුම යාවත්කාලීන කරගනිමින් ක්‍රියාකිරීම ඔබ සතු වගකීමක් බව ද අවධාරණය කරමි. ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට මෙය මැනවින් භාවිත කර ගන්නා ලෙස ද සිහිපත් කරමි.

මෙවන් ගුරුමාර්ගෝපදේශයක් සකස්කර ඔබ අතට පත්කිරීම ඉතා භාරධූර ක්‍රියාවලියකි. මේ සඳහා මූලික ව ක්‍රියාකළ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ විෂය සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වරුන්ටත්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියටත්, නියෝජ්‍ය අධ්‍යක්‍ෂ හිමියන්ටත්, පිරිවෙන් ශාඛා ප්‍රධානී හිමියන් හා අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමන් ප්‍රධාන කාර්ය මණ්ඩලයට ද පිරිවෙන් අධ්‍යාපන ශාඛාව වෙනුවෙන් ගෞරවනීය ප්‍රසංසාව පිරිනමමින් ආශිර්වාදය මෙසේ පළකරමි.

පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි
පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

## ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

**උපදේශකත්වය හා අනුමැතිය** : ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**මෙහෙයවීම** : පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි
අධ්‍යක්ෂ
පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** : ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම
අධ්‍යක්ෂ
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** : පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඒකක ප්‍රධාන
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය නියාමනය** : එම්. පී. රංජනී ධනවර්ධන
අධ්‍යක්ෂ,
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ගමගේ වික්‍රම් සම්පත්
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික විෂය)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

**විෂය විශේෂඥ උපදේශනය** : එන්. කේ. දංගල්ල
සම්මානිත මහාචාර්ය (විශ්‍රාමික)
කැලණිය විශ්වවිද්‍යාලය

ආර්. පී. පීරිස්
නියෝජ්‍ය විභාග කොමසාරිස් (විශ්‍රාමික)

**ලේඛක මණ්ඩලය :** එම්. පී. රංජනී ධනවර්ධන
අධ්‍යක්ෂ,
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ඩී. ඩබ්ලිව්. ජී. ජේ. බණ්ඩාර
සහකාර කථිකාචාර්ය
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

ගමගේ වික්‍රම් සම්පත්
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

වනිතා වල්පිටගේ
ගුරු උපදේශක
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය
බණ්ඩාරගම

සී. ඒ. අබේසේකර
පරිවේණාචාර්ය
බප/කැල/ විද්‍යාලෝක පිරිවෙණ
කැලණිය

කේ. එන්. කරුණාසේන
අ/ශ්‍රී මේඝවර්ණ මග පිරිවෙණ
මී වැව, පලාගල

**භාෂා සංස්කරණය :** මංගල ගුණරත්න
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**සෝදුපත් කියවීම :** එම්. පී. රංජනී ධනවර්ධන
සමාජ විද්‍යා අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**පරිගණක වදන් :** එල්. ඒ. සඳුනි නිලංකා පත්මසිරි
පරිගණක අංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පිටකවර නිර්මාණය : තරිඳු හසංග
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිගණක විද්‍යාව)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**විවිධ සහාය** : අති පූජ්‍ය ලෙව්වන්දූවේ චන්දවිමල නාහිමි, විහාරාධිපති
මැදගොඩලන්ද පුරාණ විහාරය, අතුරුගිරිය

පූජ්‍ය මාදෝවිට වජිරබුද්ධි හිමි, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
කොළඹ දිස්ත්‍රික්කය

පූජ්‍ය හල්වල ආනන්ද හිමි,
විහාරාධිකාරි
පුරාණ විහාරය මැදගොඩලන්ද,
අතුරුගිරිය

දයාසේන විදානගේ
වෛකල්පිත විෂය ගුරු උපදේශක (මාතර)
මාර/ විද්‍යාතිලක මහා පිරිවෙණ
බාතීගම, දික්වැල්ල

# හැඳින්වීම

තමා මෙන් ම තමා අවට ලෝකය ගැන දැන ගැනීම අප හැම දෙනාට ම අත්‍යවශ්‍ය දෙයකි. තමා ගැන දැන ගැනීම, අභ්‍යන්තර ලෝකය දැන ගැනීමයි. හඳුනා ගැනීමයි. තමා අවට ලෝකය දැන ගැනීම, බාහිර ලෝකය දැන ගැනීමයි, හඳුනා ගැනීමයි. භික්ෂූන් වහන්සේට බුදුරජාණන් වහන්සේගේ නිබඳ, නිරතුරු, අවවාදය දී ඇත්තේ සතිමත් ව, අවධිමත් ව, ජීවත් වීමයි. තමා අවට පරිසරය හෙවත් තමා අවට ලෝකය යනු සමස්ත විශ්වය ම ය. සමස්ත විශ්වය පුරා ජීවත් වන සියලු සතුන් වෙත මෙත් වඩවන්න අනුගත ව අපේ පිරිවෙන්වල අධ්‍යාපනය ලබන පොඩි හාමුදුරුවරුන්ට අදාළ නව විෂය නිර්දේශය, නිපුණතා හා නිපුණතා මට්ටම්වලට අනුව සකස් කර ඇත.

භික්ෂුවට ද අද ලෝකයේ විවිධ ක්ෂේත්‍රවලට පිවිසීමට ඉඩ කඩ විවර වී ඇත. යම් කුඩා සාමණේර භික්ෂුවක් වුව ද නියම ආකාරයෙන් සම්බුද්ධ ශාසනයෙහි හැසිරෙන්නේ නම් හෙතම පූර්ණ චන්ද්‍රයා සේ බබලන බව අපි තේරුම් ගනිමු.

වෙනස් වෙමින් පවතින ලෝකයට මුහුණ දෙමින් තම යුතුකම් හා වගකීම් සමාජ ගත කිරීමේ ද දී වත්මන් භික්ෂූන් වහන්සේට හිමිවන්නේ සුවිශේෂ කාර්යභාරයක් බව අපි කිසිසේත් අමතක නොකරමු.

ඒ සඳහා විශේෂයෙන් භූගෝල විද්‍යා විෂයයට අදාළ නිපුණතා හා නිපුණතා මට්ටම් ඔස්සේ ඉගෙනුම් පල කරා ළඟා වීමට ශිෂ්‍ය භික්ෂූන් වහන්සේට වඩාත් පහසු වන ආකාරයෙන් සකස් වී තිබීම මහත් සැනසිල්ලකට කරුණකි. පරිසරය හා මිනිසා අතර සම්බන්ධතාව හදාරණ විෂයයක් ලෙසත්, පෘථිවි ගෝලයේ ස්ථානගත පිහිටීම හා වේලාව දැක්වීම සඳහා ඇති ක්‍රමවේද අධ්‍යයන කිරීමටත් මේ මගින් ඉඩ ප්‍රස්තා ලැබී ඇත.

අද පිරිවෙනෙහි ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහු වාර්ගික සමාජයක සාමාජිකයන් වශයෙන් ජීවත්වීම, යුක්තිය හා සාධාරණය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා ආදිය පරිසරය හා බැඳුණු නිපුණතා යටතේ හදාරති. එසේ ම සජීවී ලෝකයේ ජෛව පද්ධතිය හා මිනිස් ජීවිත අතර සම්බන්ධය පිළිබඳ අවබෝධය ද ලබා ගනිති. එය භික්ෂුවගේ ඥාණා ලෝකයේ නිම්වළලු පුළුල්වීමකි. ඥාණාලෝකයෙන් ප්‍රඥාලෝකය විවර කර ගැනීම භික්ෂුවගේ පරමාර්ථය යි.

අද ථේරවාදී භික්ෂුවට ලෝකයේ හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. බුදු දහම ලෝකයට ගෙන එන සුවිශේෂ දහම් වාහකයාණෝ උන්වහන්සේ ය. එබැවින් විශ්ව දැනුම උන්වහන්සේට අත්‍යවශ්‍යය ම ය. අනාගත, සාර්ථක ධර්ම දූතයාණන් වහන්සේ බිහිවන්නේ මෙලෙස බව අපි අමතක නොකරමු.

විෂයමාලා කමිටුව

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

භූගෝල විද්‍යා විෂයය මූලික පිරිවෙන් විෂය මාලාවට අයත් වෛකල්පික විෂයයක් ලෙස හඳුන්වා දී ඇත. ඒ අනුව මූලික පිරිවෙන්හි 3,4,5 ශ්‍රේණි සඳහා භූගෝල විද්‍යා විෂය නිර්දේශය නිපුණතා පාදක ව සකස් කර ඇත.

භූගෝල විද්‍යාව යනු ස්ථානීය, ප්‍රාදේශීය හා ගෝලීය පරිමාණයන්ගෙන්, ස්වභාවධර්මය හා සමාජය අතර ඇති අන්තර් සම්බන්ධතාව සහ ඒවායේ රටා හා ක්‍රියාවලි අවකාශීය හා කාලීක යථාදර්ශයකින් අධ්‍යයනය කිරීම ලෙස අර්ථ දැක්විය හැකි වේ.

මූලික පිරිවෙන් 5 ශ්‍රේණිය භූගෝල විද්‍යාව විෂය නිර්දේශයට අදාළ ව සම්පාදනය කර ඇති මෙම ගුරුමාර්ගෝපදේශය පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ගුණාත්මක ව පවත්වා ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන පරිදි සකස් කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකය 2016 දී සම්පාදනය කරන ලද භූගෝල විද්‍යා විෂය නිර්දේශය, ගුරුමාර්ගෝපදේශය සඳහා මූලික පදනම වූ අතර, මෙම ගුරු මාර්ගෝපදේශය ලිවීමට පෙර පවත්නා එම විෂය නිර්දේශවල සංශෝධන කිහිපයක් ද සිදු කරන ලදි. ඒ අනුව සංශෝධිත නව විෂය නිර්දේශය මෙම ගුරුමාර්ගෝපදේශයට ඇතුළත් කර ඇති අතර ඒ සඳහා මෙහි ක්‍රියාකාරකම් සම්පාදනය කොට ඇත.

2016 වර්ෂයේ දී හඳුන්වා දී ඇති 5 ශ්‍රේණිය පෙළපොත ඉගෙනුම් මූලාශ්‍රයක් ලෙස පමණක් භාවිතයට ගැනීම සුදුසු වේ. මෙම ගුරුමාර්ගෝපදේශයේ ඇතුළත් නව තොරතුරු හා අන්තර්ගතය යෝජිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඵලදායි ඉගෙනුමක් කරා ශිෂ්‍යයා යොමු කර ලීමට උපකාර වනු ඇත.

නිපුණතා මට්ටම් හා ඉගෙනුම් පල මැනීමට සුදුසු නිර්ණායක ද ඇතුළත් වන සේ ක්‍රියාකාරකම් යෝජනා කර ඇති අතර තවදුරටත් නිර්මාණාත්මක හා ගුණාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගැනීමට ද ඔබට නිදහසක් ඇත. එමගින් වඩාත් ඵලදායි ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුමකට මෙය මග පැදෙනු ඇත.

එසේ ම, ශිෂ්‍යයාගේ මතකය හා අත්දැකීම්වලින් විමර්ශනාත්මක ව නිවැරදි ගවේෂණයකින් භූගෝල විද්‍යා සංකල්ප පිළිබඳ ඉගෙනුමක් ද ලබා ගැනීමට හැකිවනු ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිදු කෙරෙන තක්සේරුකරණවලින් ශිෂ්‍යයාගේ ප්‍රබලතා හා දුබලතා හඳුනා ගත හැකි වන අතර ඊට අදාළ ප්‍රතිපෝෂණ ලබා දීමට යොමුවීමෙන් ඉගෙනුම් පල කරා ශිෂ්‍යයා ළඟා කරවීම ද ගුරුවරයා සතු වගකීමකි.

ක්‍රියාකාරකම් සිදුකිරීමේ දී විෂය අන්තර්ගතයට අදාළ ව ඉගැන්වෙන බෞද්ධ ඉගැන්වීම් හා සංකල්ප තවදුරටත් භාවිත කිරීම අවධාරණය කෙරෙන අතර, ආධ්‍යාත්මික ශික්ෂණයට මෙන්ම භෞතික දියුණුව කෙරෙහි ද සිසු අවධානය යොමු කිරීමට එය මහෝපකාරී වනු ඇත.

එම්. පී. රංජනී ධනවර්ධන
අධ්‍යක්ෂ
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

# පටුන


- අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය III
- අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය IV
- අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය V
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය VI
- පිරිවෙන් අධ්‍යක්ෂගේ පණිවිඩය VII
- ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය VIII - X
- හැඳින්වීම XI
- ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් XII
- පටුන XIII
- භූගෝල විද්‍යාව 5 ශ්‍රේණිය - වාර නියමය XIV
- විෂය නිර්දේශය - 5 ශ්‍රේණිය XV
- පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු XVI
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ජාතික පොදු අරමුණු XVII
- මූලික නිපුණතා XVIII-XIX
- භූගෝල විද්‍යා විෂයයේ අරමුණු XX
- විස්තරාත්මක විෂය නිර්දේශය - 5 වන ශ්‍රේණිය XXI-XXXVII
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් XXXVIII

1. ලෝක ජන සංඛ්‍යාවේ ස්වභාවය 01 - 19
2. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ස්වභාවය 20 - 33
3. ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රම 34 - 52
4. ලෝකයේ ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත 53 - 67
5. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත 68 - 94
6. ස්වාභාවික උපද්‍රව හා ආපදා 95 - 118
7. තිරසාර සංවර්ධනය 119 - 129
8. සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප 130 - 154

## භූගෝල විද්‍යාව 5 ශ්‍රේණිය - වාර නියමය

| වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද |
|---|---|---|
| I වාරය | 1.1 , 1.2 , 1.3 , 1.4 | 8 |
| | 2.1 , 2.2 , 2.3 , 2.4 | 6 |
| | 3.1 , 3.2 | 8 |
| II වාරය | 4.1 | 10 |
| | 5.1 , 5.2 , 5.3 | 14 |
| | 6.1 , 6.2 , 6.3 | 11 |
| III වාරය | 7.1 , 7.2 , 7.3 | 10 |
| | 8.1 , 8.2 , 8.3 | 10 |

# භූගෝල විද්‍යාව

## මූලික පිරිවෙණ

## විෂය නිර්දේශය

## 5 ශ්‍රේණිය

(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

## පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු

2. (අ) භික්ෂූන් වහන්සේලාට, සහ

(ආ) පිරිවෙනක පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කැමැත්තෙන් සිටින්නා වූ ද බෞද්ධ පරිසරයක ස්වකීය අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නා වූ ද වයස අවුරුදු දහහතර ඉක්ම වූ ගිහි පිරිමි ශිෂ්‍යයන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු වන්නේ ය.

3. (අ) පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම.

(ආ) සැරියුත් මහ මුගලන් තෙර පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්න ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්ම ගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම.

(ඇ) දේශීය සහ විදේශීය ධර්මදූත මෙහෙයෙහි මෙන් ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරත වීම සඳහා අවශ්‍ය ප්‍රයෝගික දැනුම සඳහා ශික්ෂණයක් දීම, සහ

(ඈ) බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබා ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සලසා දීම, පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ වන්නේ ය.

**(1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත)**

## ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ජාතික පොදු අරමුණු

(I) සෑම (ළමයෙකුට ම) දෙනාට ම පාසල් අධ්‍යාපනයට ඇති සර්ව සහ සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.

(II) සංස්කෘතික විවිධත්වය හඳුනා ගනිමින් ජාතික සහජීවනය පෝෂණය කිරීම, ජාතික අඛණ්ඩතාව සහ ජාතික සමගිය වර්ධනය කිරීම තුළින් මව්බිමට ආදරය, ගෞරවය හා කැපවීමෙන් යුතු ශ්‍රී ලාංකික පුරවැසියෙකු නිර්මාණය කිරීම.

(III) දේශීය හා ගෝලීය අභියෝගයන්ට ප්‍රතිචාර දක්වමින් ජාතියේ සංස්කෘතික හා පාරිසරික උරුමයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

(IV) නිර්මාණශීලිත්වය, නවෝත්පාදනය සහ විචක්ෂණශීලී චින්තනය සහිත ඵලදායී පුද්ගලයින් නිර්මාණය කිරීම.

(V) තෘප්තිමත් ජීවන රටාවකට අවශ්‍ය ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික යහපැවැත්ම පුද්ගලයන් තුළ ප්‍රචලිත කිරීම.

(VI) ගෝලීය ප්‍රවණතාවන්ට සරිලන පරිදි සමාජ, ආර්ථික හා සංස්කෘතික උන්නතිය සඳහා දැනුම, කුසලතා, ආකල්ප සහ මානව ගුණාංග සංවර්ධනය කිරීම.

(VII) මානව හිමිකම්, රටේ නීතිය හා යුතුකම් සහ වගකීම්වලට ගරු කරන, සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවකට අවශ්‍ය සාධක නිර්මාණය කිරීම හා ඒ සඳහා අනුබල දීම.

(VIII) සංකීර්ණ හා අනපේක්ෂිත තත්ත්වයන්ට මුහුණ දීම සඳහා වෙනස්වීම් කළමනාකරණය සහ ඉගෙනුමට ඉගෙනීමේ පුද්ගල හැකියාවන් සංවර්ධනය කිරීම.

**(ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2019)**

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

## (I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම



## (II) පෞරුෂ වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය,
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

## (III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරයට : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය ශාක, සත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිකලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාවන් ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගය උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## භූගෝල විද්‍යාව විෂයයේ අරමුණු

01. පරිසරය හා මිනිසා අතර සබඳතාව හඳාරන විෂයක් ලෙස භූගෝල විද්‍යාව විෂයය අධ්‍යයනය කිරීම.

02. භෞතික හා මානුෂ භූ දර්ශනයේ සංරචක ගති ලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීම.

03. සෞරග්‍රහ මණ්ඩලයේ ස්වභාවය හා එහි ක්‍රියාකාරීත්වය විමර්ශනය කිරීම.

04. ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් හඳුනා ගැනීම.

05. තමා ජීවත් වන ලෝකයේ විවිධත්වය තේරුම් ගෙන, එකිනෙකා සමගත්, පරිසරය සමගත් සුසංයෝගී ව ජීවත් වීමට හුරුවීම.

06. ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා ජය ගැනීමට උපකාරී වන සුවිශේෂ ජීවිත ආරක්ෂා කර ගැනීමේ කුසලතා වර්ධනය කර ගැනීම.

07. භූගෝලීය තොරතුරු ව්‍යාප්තිය නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් භාවිත කිරීමට හුරුවීම.

08. දත්ත හා තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිතයට හුරුවීම.

09. වැඩ ලෝකයට සක්‍රීය ලෙස සහභාගී වීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම.

## විස්තරාත්මක විෂය නිර්දේශය - 05 - ශ්‍රේණිය - භූගෝල විද්‍යාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. ලෝක ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරමින් එහි සම්පත් අගය විමර්ශනය කරයි | 1.1 ලෝක ජන සංඛ්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි | • ලෝක ජන සංඛ්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත් කම | • ජන සංඛ්‍යාව යනු කුමක් දැයි අර්ථ දක්වයි<br>• ලෝක ජන සංඛ්‍යාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි<br>• දත්ත හා තොරතුරු අසුරින් ජන සංඛ්‍යාව ආශ්‍රිත ගැටලු ඉදිරිත් කරයි | 08 |
| | 1.2 ලෝක ජන සංඛ්‍යාවේ සම්පත් අගය අධ්‍යයනය කරයි | • ලෝක ජන සංඛ්‍යාව සම්පතක් ලෙස | • ජන සංඛ්‍යාවේ සම්පත් අගය පැහැදිලි කරයි | |
| | 1.3 ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ පරීක්ෂා කරයි | • ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ<br>» විශාලත්වය<br>» ව්‍යාප්තිය<br>» වර්ධනය<br>» ව්‍යුහය හා සංයුතිය | • ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ විස්තර කරයි<br>• ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණවලට අදාළ වගු සටහන් ඉදිරිපත් කරයි<br>• ලෝක ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරයි<br>• ජන ඝනත්වය යනු කුමක් දැයි විස්තර කරයි<br>• ලෝකයේ ජනාධික කලාප ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | | • ලෝකයේ ජනහීන කලාප පිළිබඳ විස්තර කරයි<br>• ලෝකයේ ජනහීන කලාප ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරයි | |
| | 1.4 ලෝක ජන සංඛ්‍යාවේ ගතිකත්වය පරීක්ෂා කරයි | • ලෝක ජන සංඛ්‍යාවේ ගතිකත්වය උපත්, මරණ, සංක්‍රමණ | • ලෝක ජන සංඛ්‍යාවේ උපත් මරණ හා සංක්‍රමණවල අදාළ තොරතුරු පැහැදිලි කරයි | |
| 2. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරමින් එහි සම්පත් අගය විමර්ශනය කරයි | 2.1 ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ප්‍රධාන ගති ලක්ෂණ පරීක්ෂා කරයි | • ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව<br>» විශාලත්වය<br>» ව්‍යාප්තිය (පළාත්, දිස්ත්‍රික්ක අනුව)<br>» ව්‍යුහය හා සංයුතිය (ස්ත්‍රී පුරුෂ, වයස, ජනවර්ග හා ආගම්) | • ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පිළිබඳ විස්තර කරයි<br>• ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව හා සම්බන්ධ තොරතුරු වගු ඇසුරින් ඉදිරිපත් කරයි<br>• ශ්‍රී ලංකාව බහුවාර්ගික හා බහු ආගමික රටක් වීමේ අගය පැහැදිලි කරයි | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | | • ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය පිළිබඳව විස්තර කරයි<br>• ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය සිතියම් ගත කරයි<br>• ශ්‍රී ලංකාවේ ජන සංයුතිය පිළිබඳ තොරතුරු විස්තර කරයි<br>• ජන සංඛ්‍යාව හා සම්බන්ධ තොරතුරු නිර්මාණශීලි ව ඉදිරිපත් කරයි | |
| | 2.2 ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ සම්පත් අගය අධ්‍යයනය කරයි | • ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ සම්පත් අගය | • ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ සම්පත් අගය තොරතුරු ඇසුරින් අධ්‍යයනය කර ඉදිරිපත් කරයි | |
| | 2.3 ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ගතිකත්වය පැහැදිලි කරයි | • ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ගතිකත්වය<br>» උපත්<br>» මරණ<br>» සංක්‍රමණ | • ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ගතිකත්වය විස්තර කරයි<br>• ශ්‍රී ලංකාවේ උපත් හා මරණ සංඛ්‍යාව හා සංක්‍රමණය කෙරෙහි බලපෑ සාධක ඉදිරිපත් කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 2.4 ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ මෑත කාලීන ප්‍රවණතා විමර්ශනය කරයි | • ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ මෑත කාලීන ප්‍රවණතා<br>» ජන සංඛ්‍යාන වියපත් වීම<br>» නාගරික ජන සංඛ්‍යාව වැඩි වීම<br>» සාඵල්‍යතාව අඩු වීම | • ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ මෑත කාලීන ප්‍රවණතා නම් කරයි<br>• ජන සංඛ්‍යාවේ මෑත කාලීන ප්‍රවණතාවලට බලපෑ හේතු විස්තර කරයි<br>• ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පිළිබඳ ගැටලු ඉදිරිපත් කරයි | |
| 3. ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රම විමර්ශන කරයි | 3.1 ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රමවල ගති ලක්ෂණ පරීක්ෂා කරයි | ■ ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික කටයුතු<br>» හැඳින්වීම<br>» විකාශය හා වැදගත්කම<br>» ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝජනය<br>» ධාන්‍ය වගාව (වී, තිරිඟු) | ■ ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික කටයුතු හඳුන්වා එහි වැදගත්කම විස්තර කරයි<br>■ ලෝක කෘෂිකාර්මික කටයුතුවල ව්‍යාප්තිය සිතියම් ඇසුරින් විස්තර කරයි<br>■ ලෝකයේ කෘෂිකාර්මික කටයුතුවල විකාශය විස්තර කරයි<br>■ බුදු දහමෙහි කෘෂිකර්මයට හිමි ස්ථානය පිළිබඳව සාකච්ඡා කිරීම<br>■ වී ගොවිතැනෙහි ප්‍රධාන ලක්ෂණ විස්තර කරයි | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | » ව්‍යාපාරික කිරිපට්ටි පාලනය<br>» වතු කෘෂිකර්මය (තේ, රබර්) | ■ වී වගාවේ විකාශය එහි වැදගත්කම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි<br>■ බුද්ධ දේශනාවල වී වගාවේ වැදගත්කම අවධාරණය කර ඇති ආකාරය පැහැදිලි කරයි<br>■ වී වගාවේ ව්‍යාප්තිය සිතියම් ඇසුරින් දක්වයි<br>■ තිරිඟු වගාවේ ප්‍රධාන ලක්ෂණ හා ව්‍යාප්තිය විස්තර කරයි<br>■ තිරිඟු වගාවේ ව්‍යාප්තිය සිතියම් ඇසුරින් දක්වයි<br>■ බුදු දහමෙහි ගව පාලනයට හිමිවූ ස්ථානය විචාර කරයි<br>■ කිරිපට්ටි පාලනයේ වර්තමාන තත්ත්වය සාකච්ඡා කරයි<br>■ ලෝකයේ තේ වගාවේ ප්‍රධාන ලක්ෂණ හඳුන්වයි<br>■ ලෝකයේ තේ වගාවේ ව්‍යාප්තිය සිතියමකින් දක්වයි<br>■ තේ වගාව සම්බන්ධ ගැටලු හා ප්‍රවණතා විස්තර කරයි<br>■ ලෝකයේ රබර් වගාවේ ලක්ෂණ විස්තර කරයි<br>■ රබර් වගාවේ වැදගත්කම පැහැදිලි කරයි<br>■ රබර් වගාවේ ලෝක ව්‍යාප්තිය සිතියමකින් දක්වයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 4. ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරයි | 4.1 ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ප්‍රධාන ගති ලක්ෂණ විමර්ශනය කරයි | • ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ගති ලක්ෂණ<br>» නිෂ්පාදන කර්මාන්ත හැඳින්වීම<br>» යකඩ හා වානේ කර්මාන්තය<br>» ඇඟලුම් කර්මාන්තය | • නිෂ්පාදන කර්මාන්ත යනු මොනවා දැයි විස්තර කරයි<br>• ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත කිහිපයක් නම් කරයි<br>• බුදු දහමෙහි කර්මාන්තවලට හිමි වූ ස්ථානය පැහැදිලි කරයි<br>• යකඩ හා වානේ කර්මාන්තයේ ලක්ෂණ පැහැදිලි කරයි<br>• යකඩ හා වානේ කර්මාන්තයේ ලෝක ව්‍යාප්තිය සිතියම් කර දක්වයි<br>• යකඩ හා වානේ කර්මාන්තය පරිසර හිතකාමී ව පවත්වා ගෙන යන ආකාරය විස්තර කරයි<br>• ලෝක ඇඟලුම් කර්මාන්තයේ ලක්ෂණ පරීක්ෂා කරයි<br>• ඇඟලුම් කර්මාන්තයට ලෝක ආර්ථිකයෙහි හිමි වන ස්ථානය පිළිබඳ අදහස් දක්වයි | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | | • ඇඟලුම් කර්මාන්තයට ලෝක ව්‍යාප්තිය සිතියමකින් දක්වයි | |
| | | » මෝටර් රථ කර්මාන්තය | • මෝටර් රථ කර්මාන්තයේ ලක්ෂණ පරීක්ෂා කරයි | |
| | | | • මෝටර් රථ කර්මාන්තයේ ව්‍යාප්තිය සිතියමකින් දක්වයි. | |
| | | | • මෝටර් රථ කර්මාන්තයේ නව ප්‍රවණතා ඉදිරිපත් කරයි. | |
| | | | • මෝටර් රථ කර්මාන්තය පරිසරයට හිතකර අයුරින් සිදු කළ යුතු ආකාරය විස්තර කරයි | |
| | | » විද්‍යුත් කර්මාන්තය (ඉලෙක්ට්‍රොනික / පරිගණක) | • විද්‍යුත් කර්මාන්තය හා එහි ලක්ෂණ පරීක්ෂා කරයි | |
| | | | • විද්‍යුත් කර්මාන්තය නිසා දියුණු වූ විවිධ ක්ෂේත්‍ර විස්තර කරයි | |
| | | » ලෝක ආකෘති සිතියම්වල නිෂ්පාදන කර්මාන්ත ලකුණු කර නම් කිරීම | • විද්‍යුත් කර්මාන්තයේ ලෝක ව්‍යාප්තිය සිතියමකින් දක්වයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 5. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි කාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කරයි | 5.1 ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි කාර්මික භූමි පරිභෝගවල ස්වභාවය හා ගැටලු විමර්ශනය කරයි | • ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු<br>» හැඳින්වීම<br>• ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූමි පරිභෝග වර්ග හා ගැටලු<br>» යැපුම් කෘෂිකර්මය<br>» වී වගාව<br>» හේන්<br>• වාණිජ කෘෂිකර්මය<br>» තේ<br>» රබර්<br>» පොල් | • ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු කිහිපයක් නම් කරයි<br>• ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූමි පරිභෝග වර්ග නම් කර යැපුම් කෘෂිකර්මය හඳුන්වයි<br>• ශ්‍රී ලංකාවේ වී වගාව හා ඊට බලපාන සාධක ඉදිරිපත් කරයි<br>• ශ්‍රී ලංකාවේ වී වගාව ආශ්‍රිත නව ප්‍රවණතා ගැටලු හා ඒවාට විසඳුම් ඉදිරිපත් කරයි<br>• ශ්‍රී ලංකාවේ වී වගාව ව්‍යාප්තිය සිතියමකින් දක්වයි<br>• ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ භෝග වර්ග නම් කරයි<br>• වාණිජ භෝග සඳහා යෝග්‍ය සාධක පිළිබඳ සාකච්ඡා කරයි<br>• ප්‍රධාන වෙළෙඳ භෝගවල ආර්ථික වටිනාකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | » සුළු අපනයන භෝග | • ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ භෝගවල ව්‍යාප්තිය ආකෘති සිතියමකින් පෙන්වයි<br>• ධාර්මික ව කෘෂිකර්මාන්තයේ යෙදීමේ වැදගත්කම අගය කරයි<br>• ශ්‍රී ලංකාවේ ප්‍රධාන සුළු අපනයන භෝග වර්ග උදාහරණ ඇසුරින් පැහැදිලි කරයි<br>• සුළු අපනයන භෝග ආශ්‍රිත ගැටලු හා ඒවාට විසඳුම් යෝජනා කරයි<br>• ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝගවල ව්‍යාප්තිය සිතියමකින් දක්වයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 5.2 ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ගති ලක්ෂණ හා ගැටලු විමර්ශනය කරයි. | • ශ්‍රී ලංකාවේ තෝරා ගත් කර්මාන්ත කිහිපයක ගති ලක්ෂණ හා ගැටලු<br>» කෘෂිපාදක කර්මාන්ත<br>» තේ, පොල්, රබර් ආශ්‍රිත සැකසුම්<br>» ඇඟලුම් හා කඩදාසි කර්මාන්ත<br>» ආකර හා පතල් කැණීම්<br>» ආහාර හා පාන වර්ග<br>» සේවා කර්මාන්ත සංචාරක හා සන්නිවේදන | • ශ්‍රී ලංකාවේ ආර්ථික කෘෂි පාදක කර්මාන්ත කිහිපයක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි<br>• කෘෂි පාදක කර්මාන්ත වල වැදගත් කම ප්‍රකාශ කරයි<br>• ශ්‍රී ලංකාවේ කෘෂි පාදක කර්මාන්තවල ව්‍යාප්තිය සිතියමකින් දක්වයි<br>• ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ගැටලු ඉදිරිපත් කරයි.<br>• කෘෂි භෝග ආශ්‍රිත ගැටලු සඳහා විසඳුම් යෝජනා කරයි<br>• ශ්‍රී ලංකාවේ කර්මාන්තවලට අදාළ තොරතුරු සොයා ඉදිරිපත් කරයි<br>• ශ්‍රී ලංකාවේ තෝරා ගත් කර්මාන්ත කිහිපයක ආශ්‍රිත ගැටලු සාකච්ඡා කරයි<br>• ශ්‍රී ලංකාවේ කර්මාන්තවල ව්‍යාප්තිය සිතියමකින් දක්වයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 5.3 ශ්‍රී ලංකාවට ආර්ථික කටයුතු සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු සුබවාදී ව විසඳා ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරයි | • ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු සම්බන්ධ පොදු ගැටලු හා ඒවා විසඳා ගත හැකි ක්‍රියාමාර්ග | • ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික කටයුතු නම් කර වර්ග කරයි<br>• ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතුවලට අදාළ තොරතුරු වගු ගත කර ඉදිරිපත් කරයි<br>• ආර්ථික කටයුතුවලට අදාළ ගැටලු සඳහා තිරසර විසඳුම් යෝජනා කරයි | |
| 6 ස්වාභාවික උපද්‍රව හා ආපදා පිළිබඳ අවබෝධයෙන් යුතුව කටයුතු කරයි | 6.1 ස්වාභාවික උපද්‍රවය හා ආපදාව හඳුන්වයි | • ස්වාභාවික උපද්‍රවය හා ආපදාව<br>» හැඳින්වීම<br>» උපද්‍රව වර්ග | • ස්වාභාවික උපද්‍රවය හා ආපදාව අතර වෙනස දක්වයි<br>• උපද්‍රව වර්ගීකරණය කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 6.2 ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික උපද්‍රව හා ආපදාවල ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි | • ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික උපද්‍රව<br>» ජල ගැලීම්<br>» සුනාමි | • ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික උපද්‍රව හා ආපදා නම් කරයි<br>• ජලය ගැලීම් නිසා ඇති වන හානි විස්තර කරයි<br>• ජල ගැලීම් හානි අවම කර ගත හැකි ආකාරය ඉදිරිපත් කරයි<br>• ජල ගැලීම් බහුල ව සිදු වන ප්‍රදේශ සිතියම්වල ලකුණු කර නම් කරයි<br>• සුනාමි ආපදාව පිළිබඳව විස්තර කරයි<br>• සුනාමි ආපදාවකින් සිදු වන හානි විස්තර කරයි<br>• සුනාමි ආපදා හානි අවම කර ගත හැකි ආකාරය විස්තර කරයි<br>• සුනාමි ආපදාවලට ලක් වන ප්‍රදේශ සිතියමක ලකුණු කර නම් කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | » සුළි සුළං (වාසුළි) | • ශ්‍රී ලංකාවට බලපාන වාසුළි උපද්‍රවය පිළිබඳව විස්තර කරයි<br>• වාසුළි ආපදා හානි වැඩි වීමට බලපාන හේතු අවබෝධයෙන් විස්තර කරයි<br>• වාසුළි ආපදා හානි අවම කර ගත හැකි ආකාර පැහැදිලි කරයි<br>• වාසුළි බලපාන ප්‍රදේශ සිතියමක ලකුණු කර නම් කරයි | |
| | | » නායයෑම් | • ශ්‍රී ලංකාවට බලපාන නායයෑම් පිළිබඳව විස්තර කරයි<br>• නායයෑම් සිදු වන ප්‍රදේශ ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරයි<br>• නායයෑම් ආපදා හානි වැඩි වීමට බලපාන හේතු විස්තර කරයි<br>• නායයෑම් හානි අවම කර ගත හැකි ආකාරය පැහැදිලි කරයි | |
| | | » අකුණු ආපදා | • ශ්‍රී ලංකාවට බලපාන අකුණු අනතුරු පිළිබඳ විස්තර කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- |
| | | I අකුණු ආපදා | ■ අකුණු අනතුරු හානි බහුල ප්‍රදේශ සිතියමකින් දක්වයි<br>■ අකුණු අනතුරු හානි වීමට හේතු ඉදිරිපත් කරයි<br>■ අකුණු හානි අවම කර ගත හැකි ආකාරය විස්තර කරයි | |
| | | I නියඟය | ■ නියඟය ඇති වීමට බලපාන හේතු විස්තර කරයි<br>■ ශ්‍රී ලංකාවේ නියඟය බලපාන ප්‍රදේශ සිතියමකින් දක්වයි<br>■ නියඟයේ හානි වැඩි වීමට බලපාන කරුණු පැහැදිලි කරයි<br>■ නියඟයේ හානි අවම කර ගත හැකි ආකාරය විස්තර කරයි | |
| | 6.3 ආපදා කළමණාකරණය හා සම්බන්ධ ආයතන වල ක්‍රියාකාරිත්වය හා ආපදා කළමණාකරණ චක්‍රය පිළිබඳ අධ්‍යයන කරයි. | » ආපදා කළමනාකරණය හා සම්බන්ධ ආයතන ආපදා කළමනාකරණ චක්‍රය ඇසුරින් ආපදා කළමනාකරණය | ■ ආපදා කළමනාකරණය සම්බන්ධ ශ්‍රී ලංකාවේ ආයතනික ස්වභාවය විස්තර කරයි<br>■ ශ්‍රී ලංකාවට බලපාන ආපදා කළමනාකරණය කරන ආකාරය ආපදා කළමණාකරණ චක්‍රය ඇසුරින් පැහැදිලි කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 7. තිරසාර සංවර්ධනය පිළිබඳ ධනාත්මක ආකල්ප සහිත ව කටයුතු කරයි | 7.1 ජීවන දර්ශනයක් වශයෙන් තිරසාර සංවර්ධනයක අවශ්‍යතාව පැහැදිලි කරයි | • මිනිස් පරිසර සම්බන්ධතා | • මිනිසා හා පරිසරය අතර සම්බන්ධතා විස්තර කරයි | 10 |
| | | • මිනිසා පරිසරය භාවිත කරන ආකාරය | • මිනිසා පරිසරය ප්‍රයෝජනයට ගන්නා ආකාරය පැහැදිලි කරයි | |
| | | • තිරසර සංවර්ධනය | • තිරසර සංවර්ධනය අර්ථ දක්වයි | |
| | | • තිරසර සංවර්ධනයක අවශ්‍යතාව | • තිරසර සංවර්ධනයක අවශ්‍යතාව පැහැදිලි කරයි | |
| | | • තිරසර පරිසර සංරක්ෂණ පිළිවෙත් | • යහපත් ලෙස ජීවත්වීමට තිරසර පරිසර සංරක්ෂණ පිළිවෙත් අනුගමනය කළ යුතු ආකාර යෝජනා කරයි | |
| | 7.2 පරිසර ආචාර ධර්මවලට අනුගත වෙයි | • පරිසර ආචාර ධර්ම යනු කවරේ ද? | • පරිසර ආචාර ධර්ම යනු මොනවා දැයි හඳුන්වා දෙයි | |
| | | • ආගම් අනුව ඉගැන්වෙන ආචාර ධර්ම | • විවිධ ආගම්වල ඉගැන්වෙන පරිසර ආචාර ධර්ම විස්තර කරයි | |
| | | • පරිසර ආචාර ධර්ම පිළිපැදීමේ අවශ්‍යතාව | • පරිසර ආචාර ධර්ම පිළිපැදීමේ අවශ්‍යතාව අවධාරණය කරයි | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 7.3 ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය සඳහා සක්‍රිය ව දායක වීම | • ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය පිළිබඳ ආයතන හා අණපනත්<br>• පරිසර සංරක්ෂණයට පුරවැසි සහභාගිත්වය | • ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය පිළිබඳ සංවිධාන ආයතන හා අණපනත් විස්තර කරයි<br>• පුරවැසියෙකු ලෙස පරිසර සංරක්ෂණයට සක්‍රිය ව දයක වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි | |
| 8. දත්ත හා තොරතුරු විශ්ලේෂණයට අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිත කරයි | 8.1 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක තොරතුරු විවරණය කරයි | • 1 : 50,000 භූ ලක්ෂණ සිතියම් විවරණය<br>• භෞතික ලක්ෂණ<br>• සංස්කෘතික ලක්ෂණ<br>• භූ ලක්ෂණ සිතියමක භෞතික හා සංස්කෘතික ලක්ෂණවල සම්බන්ධතා | • 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක භෞතික ලක්ෂණ හඳුනාගෙන ප්‍රකාශ කරයි<br>• භූ ලක්ෂණ සිතියමක භෞතික ලක්ෂණ විස්තර කරයි<br>• සිතියමක සංස්කෘතික ලක්ෂණ නිරූපණය කරයි<br>• 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක දක්වෙන භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර ඇති සම්බන්ධතා විස්තර කරයි | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | • භෞතික ලක්ෂණ පැහැදිලි කිරීම (කියවීම) | • 1 : 50,000 හු ලක්ෂණ සිතියමක දෙන ලද භෞතික ලක්ෂණ පැහැදිලි කරයි | |
| | | • සංස්කෘතික ලක්ෂණ පැහැදිලි කිරීම (කියවීම) | • 1 : 50,000 හු ලක්ෂණ සිතියමක දෙන ලද සංස්කෘතික ලක්ෂණ විස්තර කරයි | |
| | 8.2 විවිධ සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්පවල ඇති ප්‍රයෝජන සොයා බලයි | • නව සිතියම් විද්‍යාත්මක ක්‍රම හැඳින්වීම | • නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප විස්තර කරයි | |
| | | • නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්පවල ප්‍රයෝජන | • නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්පවල ප්‍රයෝජන විස්තර කරයි | |
| | | • නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප වල විකාශනය (සරලව) | • නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්පවල විකාශනය පැහැදිලි කරයි | |
| | | • නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භූගෝල විද්‍යාවට ප්‍රයෝජනවත් වන ආකාරය | • නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භූගෝල විද්‍යාවට වැදගත් වන ආකාරය සාකච්ඡා කරයි | |
| | 8.3 ප්‍රස්තාර යොදා ගනිමින් දත්ත අර්ථ කථනය කරයි | • ප්‍රස්තාර හැඳින්වීම | • ප්‍රස්තාර හඳුන්වයි සරල ප්‍රස්තාර නිර්මාණය කරන ආකාරය පැහැදිලි කරයි | |
| | | • සරල තීරු, සරල රේඛා, වෘත්ත | • ප්‍රස්තාරවල ප්‍රයෝජන විස්තර කරයි | |
| | | • ප්‍රස්තාරවල ප්‍රයෝජන | • ප්‍රස්තාර පිළිබඳව අවබෝධය ප්‍රකට කරයි | |
| | | • ප්‍රස්තාර කියවීම | • ප්‍රස්තාර භාවිතයෙන් දෙන ලද දත්ත විස්තර කරයි | |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 5.1 ලෝක ජන සංඛ්‍යාව

**නිපුණතාව -** ලෝක ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරමින් එහි සම්පත් අගය විමර්ශනය කරයි.

**හැඳින්වීම -**

ජන සංඛ්‍යාව සම්පතකි. ලෝක ජන සංඛ්‍යාව යනු පෘථිවිය මත වෙසෙන මුළු මිනිස් ගහණයයි. ජන සංඛ්‍යාව විචල්‍ය සාධකයකි. එය ප්‍රමාණාත්මක ව හා ගුණාත්මක ව වෙනස් වේ. ජන සංඛ්‍යාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී එහි ඇති මූලික ලක්ෂණ අනුව ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර දෙකකට බෙදිය හැකි ය. මිනිසාට උපතින් ම හිමි වන ජෛවීය සාධක එනම් ස්ත්‍රී පුරුෂභාවය (පුමිතිරි බව) මානව වර්ගය, ස්වරූපය හා වයස ආදිය හා උපතින් පසුව සංස්කෘතිකමය වශයෙන් හිමි වන සාධක එනම් ජාතිය, ආගම, භාෂාව යනාදිය හැඳින්විය හැකි ය.

පෘථිවිය මත වෙසෙන මිනිසා භෞතික සම්පත් පරිභෝජනය කරන අතර භෞතික සම්පත්වල ස්වරූපය වෙනස් කිරීමට ද බලපාන සාධකයක් වේ. මිනිසා මත පදනම් වී ලෝකයෙහි සියලු ම කාර්ය සිදුවන අතර රටක සංවර්ධනයට ජන සංඛ්‍යාවේ ප්‍රමාණාත්මකභාවය හා ගුණාත්මකභාවය බෙහෙවින් බලපායි. ලෝක ජන සංඛ්‍යාවේ වර්ධනය සිදු වන අතර ව්‍යාප්තිය අනුව ජනාධික ප්‍රදේශ හා ජනහීන ප්‍රදේශ ද ලෝකයෙහි පවතී. ඒ අනුව ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය, වර්ධනය හා සංයුතිය ආදි ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ පරීක්ෂා කිරීම හා ජන සංඛ්‍යාවේ ගතිකත්වය එනම් උපත් මරණ හා සංක්‍රමණවලට අදාළ තොරතුරු හා බෞද්ධ දර්ශනය අනුව ජන සංඛ්‍යාවේ සම්පත් වටිනාකම පිළිබඳ අධ්‍යයනය කිරීම ද මෙම ඒකකයෙන් සිදු කිරීමට අපේක්ෂිත ය.



**නිපුණතාව -** ලෝක ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරමින් එහි සම්පත් අගය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** ලෝක ජන සංඛ්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. ලෝක ජන සංඛ්‍යාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.
2. ජන සංඛ්‍යාව යනු කුමක් දැයි අර්ථ දක්වයි.
3. දත්ත හා තොරතුරු ඇසුරින් ජන සංඛ්‍යාව ආශ්‍රිත ගැටලු ඉදිරිපත් කරයි.
4. ජන සංඛ්‍යාවේ සම්පත් අගය පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම -** 5.1.1 ජන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු දැන ගනිමු.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- ප්‍රශ්නකරණය
- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ජන සංඛ්‍යාව වටිනා සම්පතක් බව අවබෝධ කර ගැනීම
2. ලෝකය වෙනස් කිරීමට දායක වන සාධකයක් ලෙස ජන සංඛ්‍යාව අගය කිරීම
3. ලෝක ජන සංඛ්‍යාව ගුණාත්මක ව පවත්වා ගැනීම සම්බන්ධව යහපත් ආකල්ප වර්ධනය වීම

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ පටය - ජන සංඛ්‍යාවේ විකාශය පිළිබඳ
- (5 ශ්‍රේණිය) පෙළපොත
- ඩිමයි කොළ
- ෆෙල්ට් පෑන්
- ඇමුණුම 5.1.1.1 (කණ්ඩායම්වලට අදළ මූලාශ්‍ර පිළිබඳ තොරතුරු)
- ඇමුණුම 5.1.1.2 (කණ්ඩායම් කාර්ය පත්‍රිකා)

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

ලෝක ජන සංඛ්‍යාව හා එය අධ්‍යයනය කිරීමේ අරමුණු මෙන්ම, එහි වැදගත්කම පිළිබඳවත් ශිෂ්‍යයන් දැනුවත් කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

පියවර I

- අතීතයේ දී ලෝකයේ ජන සංඛ්‍යාව අඩු මට්ටමක පැවති බවත්, එය සෙමෙන් වර්ධනය වූ බවත්, එහෙත් පසුකාලීන ව ඉහළ ශීඝ්‍රතාවකින් වර්ධනය වෙමින් එය අති විශාල ජන සංඛ්‍යාවක් බවට පත් වූ ආකාරයත් පැහැදිලි කරන වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කිරීම. පහත කරුණු ඉස්මතු වන අකාරයට සාකච්ඡාවක් ගොඩනගා පාඩමට පිවිසෙන්න.

    - පෘථිවියෙහි වාසය කරනු ලබන සියලු ම මිනිසුන් ලෝක ජන සංඛ්‍යාවට අයත් වන බව
    - ජන සංඛ්‍යාව වටිනාම සම්පතක් බව
    - රටක සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනයට ජන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු අත්‍යවශ්‍ය බව
    - ජන සංඛ්‍යාව පිළිබඳව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර රාශියක් ඇති බව

පියවර II

- පාඩමට උචිත වන පරිදි පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් හතරකට වෙන් කරන්න.
- ඇමුණුම 5.1.1.1 හා 5.1.1.2 ශිෂ්‍යයන්ට ලබා දී පන්ති කාමරයේ දී ඉදිරිපත් කිරීම් සඳහා උපදෙස් ලබා දෙන්න.

පියවර III

- ශිෂ්‍ය ක්‍රියාකාරකම පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය කරන්න.

පියවර IV

ශිෂ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා ඌනපූරණ ලබා දෙමින් පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනය කරන්න

- ජන සංඛ්‍යාව පිළිබඳව අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් වැදගත් ක්ෂේත්‍ර හා ඒවායේ ඇති ප්‍රයෝජන
- විද්‍යාවේ දියුණුව ලෝක ජන සංඛ්‍යාව වර්ධනයට බලපා ඇති බව
- ජන සංඛ්‍යාවේ විවිධ වූ ස්වභාව අනුව ගැටලු රාශියක් ලෝකයෙහි ඇති වන ආකාරය
- භූගෝල විද්‍යාවේ දී ජන සංඛ්‍යාව පිළිබඳ අධ්‍යයනය වැදගත් වන ආකාරය

**තක්සේරුකරණය හා ඇගයීම්**

- ජන සංඛ්‍යාව යනු කුමක් දැයි හැඳින්වීම
- ජන සංඛ්‍යාව පිළිබඳ අධ්‍යයනයේ වැදගත්කම ප්‍රකාශ කිරීම
- ජන සංඛ්‍යාවේ වර්ධනය ආශ්‍රිත ගැටලු ඉදිරිපත් කිරීම
- කණ්ඩායම් ක්‍රියා මගින් දත්ත හා තොරතුරු එක් රැස් කිරීම
- ගුරු උපදෙස් අනුව නියමිත කාලයට ක්‍රියාකාරකම නිම කිරීමට කටයුතු කිරීම

5.1.1.1 ඇමුණුම - කණ්ඩායම්වලට අදාළ මූලාශ්‍ර පිළිබඳ තොරතුරු

1 - **කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 01 හා 02

2 - **කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 2

3 - **කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 2

4 - **කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 2

5.1.1.2 - **ඇමුණුම කාර්ය පත්‍රිකා**

1 - **කණ්ඩායම**

ඔබගේ කණ්ඩායම පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයා පන්තියට ඉදිරිපත් කරන්න.

1. ලෝක ජන සංඛ්‍යාව යනු කුමක් ද?
2. ජන සංඛ්‍යාව පිළිබඳව අධ්‍යයනයේ දී වැදගත් වන මිනිසා උපතින් ම හිමි කර ගන්නා ලක්ෂණ මොනවා ද?
3. ජන සංඛ්‍යාව පිළිබඳව අධ්‍යයනයේ දී වැදගත් වන මිනිසා උත්පත්තියට පසුව හිමි කර ගන්නා ලක්ෂණ මොනවා ද?
4. ලොව ඇති සම්පත් ප්‍රධාන කොටස් කීය ද? ඒ මොනවා ද?
5. ලෝක ජන සංඛ්‍යාව කෙටි කාලයක දී ශීඝ්‍රයෙන් වර්ධනය වීමට බලපෑ ප්‍රධාන හේතු මොනවා ද?

2 - කණ්ඩායම

- ජන සංඛ්‍යාව පිළිබඳව ඉගෙනීමේ ප්‍රයෝජන දැක්වෙන සටහනක් නිර්මාණාත්මක ව පන්තියට ඉදිරිපත් කරන්න.

3 - කණ්ඩායම

- මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීම උදෙසා සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීමට සිදු වී ඇත. එමගින් මානව සම්පත ආශ්‍රිත ගැටලු පැන නගියි. එම ගැටලු 5ක් සඳහන් කර ඒවා අවම කිරීමට ගත හැකි පියවර 5ක් සටහන් කර පන්තියට ඉදිරිපත් කරන්න.

4 - කණ්ඩායම

- ජන සංඛ්‍යාව පිළිබඳව තොරතුරු ලබා ගත හැකි විවිධ මූලාශ්‍ර හා ඒවායෙන් ලබා ගත හැකි තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීම සඳහා නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් කරන්න.

වැඩිදුර පරිශීලනයට

- 12 ශ්‍රේණිය භූගෝල විද්‍යාව ගුරු මාර්ගෝපදේශය - ජාතික අධ්‍යාපන ආයතනය
- 11 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළපොත - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- www.worldpopulation.info.com

**නිපුණතාව -** ලෝක ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරමින් එහි සම්පත් අගය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** 1.2 ලෝක ජන සංඛ්‍යාවේ සම්පත් අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ විස්තර කරයි.
2. ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණවලට අදාළ වගු සටහන් ඉදිරිපත් කරයි.
3. ලෝක ජන සංඛ්‍යා ව්‍යාප්තිය ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරයි.
4. ලෝක ජන සංඛ්‍යාවේ උපත් මරණ හා සංක්‍රමණවලට අදළ තොරතුරු පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම -** 5.1.2 කාලීන ව ජන සංඛ්‍යාව වැඩි වන අයුරු දැන ගනිමු.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- ගවේෂණ ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ජන සංඛ්‍යාවේ විශාලත්වය හා එහි වැදගත්කම පිළිබඳ අවබෝධය ලැබීම
2. සෞඛ්‍ය පහසුකම් වැඩි වීම ජන සංඛ්‍යා වර්ධනයට බලපාන කරුණක් ලෙස අගය කිරීම
3. ජනසංඛ්‍යා වර්ධනය හා සම්බන්ධ යහපත් ආකල්ප වර්ධනය වීම

**ගුණාත්මක යෙදවුම්**

- සිතියම් පොත් (ලෝක)
- 5 ශ්‍රේණිය පෙළපොත
- ලෝක ආකෘති සිතියම්
- ඩිමයි කොළ
- ෆෙල්ට් පෑන්
- ඇමුණුම් 5.1.2.1 . පිවිසුම සඳහා ප්‍රවෘත්තිය
  5.1.2.2 . තොරතුරු පත්‍රිකා
  5.1.2.3 . කාර්ය පත්‍රිකා

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

කාලීන ව සංඛ්‍යා වර්ධනය වී ඇති ආකාරයත් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යා වර්ධනයේ පැහැදිලි වෙනස්කම් හඳුන්වා දීමත්, ජන සංඛ්‍යාව අඩු හා වැඩි රටවල් ව්‍යාප්තිය ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කිරීමත් මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

පියවර I

පෙර දින සූදානම් කර ගත් පරිදි ඇමුණුම 5.1.2.1හි සඳහන් ප්‍රවෘත්තිය වෙනත් පන්තියක ශිෂ්‍යයකු ලවා පන්තියට ඉදිරිපත් කර ඒ ඇසුරින් පහත කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡා කරමින් පාඩමට පිවිසීම

- වර්තමානයේ ලෝක ජන සංඛ්‍යාවේ ප්‍රමාණය බිලියන 07 ඉක්මවා ඇති බව
- වසර 200ක පමණ ජන සංඛ්‍යාව පිළිබඳ නිශ්චිත දත්ත ඇති බව
- ජනගහන වර්ධනය රටවල් අනුව වෙනස් වන බව
- සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යා වර්ධනයේ වෙනස්කම් ඇති බව
- ජන සංඛ්‍යා වර්ධනයේ ප්‍රධාන අවධි 2ක් ඇති බව

පියවර II

- පාඩමට උචිත වන පරිදි පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- ඇමුණුම් 5.1.2.2 හා 5.1.2.3 කණ්ඩායම් අංක අනුව ශිෂ්‍යයන්ට ලබා දී අදාළ ක්‍රියාකාරකම් සඳහා උපදෙස් ලබා දෙන්න.

පියවර III

- ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ක්‍රියාකාරකම් පන්තියට ප්‍රදර්ශනය කරන්න.

පියවර IV

ශිෂ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා ඌනපූරණ ලබා දෙමින් පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනය කරන්න

- කාලයත් සමග ජනගහනය වර්ධනය වී ඇති බව
- ජන සංඛ්‍යා වර්ධනයේ පැහැදිලි අවධි දෙකක් හඳුනා ගත හැකි බව
- සංවර්ධිත හා සංවර්ධනය වන රටවල ජන සංඛ්‍යා වර්ධනයේ පැහැදිලි වෙනස්කම් ඇති බව
- 2024 වන විට ලෝක ජන සංඛ්‍යාව බිලියන 8ක් දක්වා වැඩි වන බවට ගණනය කර ඇති බව

තක්සේරුකරණය හා ඇගයීම

- ලෝක ජන සංඛ්‍යාව ප්‍රමාණාත්මක ව දැක්වීම
- ලෝක ජන සංඛ්‍යාව වර්ධනය සිදු වන ආකාරය ඉදිරිපත් කිරීම
- සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යා වර්ධනය වෙනස් බව පැහැදිලි කිරීම
- ජන සංඛ්‍යා වර්ධනයේ තොරතුරු සිතියම් ගත කර ඉදිරිපත් කිරීම
- අසන ලද තොරතුරු සන්නිවේදනය කර පිළිතුරු ලබා දීම

5.1.2.1 ඇමුණුම

පිවිසුම සඳහා ප්‍රවෘත්තිය

ආයුබෝවන් පැයෙන් පැය පුවත් සමගින් මා ඔබ හා නැවත සම්බන්ධ වනවා. ලෝක ජනගහනයේ වර්ධනය පිළිබඳ විශේෂ පුවතක් අන්තර්ජාතික මාධ්‍ය අද දවසේ ප්‍රකාශයට පත් කළා.

2024 වන විට ලෝක ජන සංඛ්‍යාව බිලියන 08ක් දක්වා වැඩි විය හැකි බව පුරෝකථනය කර තිබෙනවා.

ඒ අනුව ලෝක ජන සංඛ්‍යාවේ වර්ධනය පිළිබඳ කැපී පෙනෙන ප්‍රධාන අවධි දෙකක් හඳුනා ගැනීමට හැකි වෙනවා.

1. මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ක්‍රි.ව. 1750 දක්වා වූ කාලයේ මන්දගාමී ව ජන සංඛ්‍යාව වර්ධනය වී තිබෙනවා. මේ යුගයේ උපත් අනුපාතය මෙන් ම මරණ අනුපාතය ද වැඩි වී තිබේ.

2. ක්‍රි.ව. 1750 සිට කෙටි කාලයක දී ශීඝ්‍ර වර්ධනයක් සිදු වූ අවධිය - මෙම අවධියේ සෞඛ්‍ය පහසුකම් දියුණු වීම නිසා උපත් අනුපාතියකයට සාපේක්ෂ ව මරණ අනුපාතිකය ද අඩු වී තිබෙනවා. එසේ ජන සංඛ්‍යාවේ ශීඝ්‍ර වර්ධනය (ස්පෝටනය) පිපිරීමක් ලෙස ද හඳුන්වනවා.

1950න් පසුව සංවර්ධිත රටවල අඩු ජන සංඛ්‍යා වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර සංවර්ධනය වෙමින් පවතින රටවල වැඩි ජන සංඛ්‍යා වර්ධනයක් පෙන්නුම් කරනවා.

ජන සංඛ්‍යා වර්ධනය හා ජනගහනය පිළිබඳ අතීත දත්ත හා තොරතුරු ලේඛනගත වී ඇත්තේ වසර 200ක පමණ සිට  ඊට පෙර තොරතුරු පුරා විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වී ඇති බව ද සඳහන් කෙරෙනවා

පැයෙන් පැය පුවත් සමඟ නැවත හමුවෙමු ස්තුතියි

5.1.2.2 ඇමුණුම - තොරතුරු පත්‍රිකා

1 - **කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 5හි ඇති 1.2 ප්‍රස්තාරය යොදා ගැනීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.

2 - **කණ්ඩායම**

- ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, ශ්‍රී ලංකාව, ඕස්ට්‍රේලියාව, චීනය, නයිජීරියාව, ස්වීඩනය, නෝර්වේ, බංගලාදේශය, බ්‍රිතාන්‍ය, රුසියාව, මාලදිවයින, පකිස්තානය, බ්‍රසීලය, ඉතියෝපියාව, නේපාලය, උගන්ඩාව

3 - **කණ්ඩායම**

- පෙළපොතේ 4 සහ 5 පිටු තොරතුරු මූලාශ්‍රයට භාවිත කිරීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.

4 - **කණ්ඩායම**

- ශ්‍රී ලංකාව, ජපානය, නයිජීරියාව, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, චීනය, නෝර්වේ, රුසියාව, ඉතියෝපියාව

5.1.2.3 ඇමුණුම - කාර්ය පත්‍රිකා

1 - **කණ්ඩායම**

- ඔබට ලැබී ඇති ප්‍රස්තාරයේ ඇති තොරතුරු නිවැරදි ව වගුවකින් ඉදිරිපත් කරන්න.

2 - **කණ්ඩායම**

- ඔබගේ තොරතුරු පත්‍රිකාවේ ඇති රටවල් සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් ලෙස වර්ග කර පන්තියට ඉදිරිපත් කරන්න.

3 - **කණ්ඩායම**

- ඔබට ලැබී ඇති තොරතුරු පත්‍රිකාවේ සඳහන් කරුණු ඇසුරින් ජන සංඛ්‍යා වර්ධන පිළිබඳ ප්‍රශ්න 5ක් හා ඊට ගැළපෙන පිළිතුරු සකසා පන්තියට ඉදිරිපත් කරන්න.

**4 - කණ්ඩායම**

- ඔබගේ තොරතුරු පත්‍රිකාවේ සඳහන් රටවල් ඇසුරින් ජන සංඛ්‍යාව අඩු රටවල් හා වැඩි රටවල් වෙන් කර ගෙන ඒවා සපයා ඇති ලෝක ආකෘති සිතියමේ ලකුණු කර නම් කරන්න.

**වැඩිදුර පරිශීලනයට** -

- 11 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළපොත - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- http:// geography, about.com

**නිපුණතාව -** ලෝක ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරමින් එහි සම්පත් අගය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** 1.3 ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල** -

1. ජන ඝනත්වය යනු කුමක් දැයි විස්තර කරයි.
2. ලෝක ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය පිළිබඳ විස්තර කරයි.
3. ලෝකයේ ජනාධික කලාප ආකෘති සිතියමක ලකුණු කර නම් කරයි.

**ක්‍රියාකාරකම** - 5.1.3 ''දේසේ හැටියට වාසේ'' සොයා බලමු.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- ප්‍රශ්නකරණය
- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ලෝකයෙහි ජන සංඛ්‍යාව අසමාන ආකාරයෙන් ව්‍යාප්ත වී ඇති බව අවබෝධ කර ගැනීම
2. ජනාධික කලාප ඇති වීමට විවිධ පහසුකම් බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයක් ලැබීම
3. ජනාධික කලාප වෙරළබඩ ප්‍රදේශවල ව්‍යාප්ත වීමට බලපෑ හේතු හඳුනා ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- 5 ශ්‍රේණිය පෙළපොත
- භූගෝල විද්‍යාව 11 ශ්‍රේණිය පාසල් පෙළපොත
- සිතියම් පොත්
- ලෝක ආකෘති සිතියම්
- ෆෙල්ට් පෑන්/පාට පැන්සල්

- ඩිමයි කොළ
- ඇමුණුම් 5.1.3.1 . පිවිසුම සඳහා දෙබස් කාණ්ඩ

  5.1.3.2 . තොරතුරු පත්‍රිකා

  5.1.3.3 . කාර්ය පත්‍රිකා

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

විවිධ පහසුකම් ජනාධික කලාප ඇති වීමට හේතු වන බවත්, ප්‍රධාන ජන සංකේන්ද්‍රණ වෙරළබඩ කලාප ආශ්‍රිත ව පිහිටා ඇති බව පෙන්වා දීමත්, ජනාධික නගර, රටවල් හා ප්‍රදේශ ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කිරීමත් මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

පියවර I

පෙර දිනක තෝරා ගත් ශිෂ්‍යයන් තිදෙනෙකුට ඇමුණුම 5.1.3.1හි සඳහන් භූමිකා රංගනය ලබා දී එය අදාළ දිනට පන්තිය ඉදිරියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඉන් පසු පහත කරුණු විමසමින් පාඩමට සම්බන්ධ වන්න.

- ජන ඝනත්වය යනු කුමක් ද?
- ලෝකයේ ජනාධික කලාප කීපයක් තිබේ ද?
- එම ජනාධික කලාප මොනවා ද?

පියවර II

- ශිෂ්‍ය කණ්ඩායම් 4කට වෙන් කර ගන්න

  උදා - ක්‍රියාකාරකමට ගැළපෙන ලෙස නම් කරන්න

  (නැ. ආසියාව, දකුණු හා අග්නිදිග ආසියාව, වයඹ දිග යුරෝපය, ඇමරිකාවේ ඊසාන වෙරළ)

- ඇමුණුම් 5.1.3.2 හා 5.1.3.3හි සඳහන් තොරතුරු පත්‍රිකා හා කාර්ය පත්‍රිකා ශිෂ්‍යයන් වෙත ලබා දී අදාළ ක්‍රියාකාරකම් සඳහා මාර්ගෝපදේශ ලබා දෙන්න.

පියවර III

- ඒ ඒ කණ්ඩායම් සම්පූර්ණ කරන ලද පිළිතුරු හා නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- එම තොරතුර හා නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය වන පරිදි එල්ලා තබන්න.

පියවර IV

ශිෂ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා ඌන පූර්ණ සපයමින් පහත කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනය කරන්න.

- ජන ඝනත්වය යනු කිසියම් බිම් ඒකකයක විසිරී ඇති ජන සංඛ්‍යාව බව
- ලෝකයේ ප්‍රධාන ජනාධික කලාප හතරක් ඇති බව
- ජන සංකේන්ද්‍රණ සියල්ල ම වෙරළබඩ ප්‍රදේශ ආශ්‍රිත ව පිහිටා ඇති බව
- ලෝක භූමි ප්‍රමාණයෙන් 10ක් පමණක් ජන සංකේන්ද්‍රණවලට ඇතුළත් බව

**තක්සේරුකරණය හා ඇගයීම**

✳ ප්‍රධාන ජන සංකේන්ද්‍රණ කලාප හැඳින්වීම

✳ ප්‍රදේශය අනුව ජනාවාස ව්‍යාප්ත වන ආකාරය ප්‍රකාශ කිරීම

✳ අධික ජන සංඛ්‍යාවක් වාසය කරන රටවල් හා නගර ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කිරීම

✳ සාමූහික ව තොරතුරු විමර්ශනය කිරීම

✳ ජන සංකේන්ද්‍රණ පිළිබඳ තොරතුරු සෙසු අයට නිර්මාණශීලි ව ලබා දීම

ඇමුණුම - 5.1.3.1 - <u>තොරතුරු පත්‍රිකා</u>

පිවිසුම සඳහා භූමිකා රංගනයට අදාළ දෙබස් කාණ්ඩ

| | | |
|---|---|---|
| නිවේදකයා | - | ආයුබෝවන්, සුබ උදෑසනක් ඔබ සැමට, අද උදාහිරු වැඩ සටහන සඳහා ආරාධනා කරනු ලැබුවේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිලධාරිතුමාට සහ නියෝජ්‍ය ප්‍රධාන මහත්මයාටයි. ප්‍රධාන නිලධාරිතුමනි, මට කෙටියෙන් පවසන්නකෝ ජන ඝනත්වය කියන්නේ මොකක් ද කියලා. |
| ප්‍රධනියා | - | බොහොම හොඳ ප්‍රශ්නයක් ඔව්. ජන ඝනත්වය කියන්නේ කිසියම් බිම් ඒකකයක් තුළ විසිර පවතින ජන සංඛ්‍යාවයි. |
| නිවේදකයා | - | නියෝජ්‍ය ප්‍රධානි තුමනි, ඇත්තට ම අපේ පෘථිවියේ ජනතාව මොන වගේ ප්‍රදේශවල ද වැඩියෙන් වාසය කරන්නේ? |
| නියෝජ්‍ය ප්‍රධානි | - | දැනට හඳුනාගෙන තිබෙනවා ප්‍රධාන කලාප හතරක්, නැගෙනහිර ආසියාව, දකුණු හා අග්නිදිග ආසියාව, වයඹ දිග යුරෝපය, ඇමරිකාවේ ඊසාන දිග වෙරළබඩ තමයි එම ප්‍රදේශ |
| නිවේදකයා | - | තොරතුරු ලබා දීම පිළිබඳ ඔබ දෙපලට ස්තුතිවන්ත වෙනවා. හෙටත් මේ වෙලාවට ම මුණ ගැසීමේ බලාපොරොත්තුවෙන් සමුගන්නවා |

ඇමුණුම - 5.1.3.2 - තොරතුරු පත්‍රිකා

**1 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 6 සහ 7 පිටු භාවිතා කිරීමට උපදෙස් දෙන්න.

**2 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 8හි ඇති නැගෙනහිර ආසියාව හා දකුණු හා අග්නිදිග ආසියාව පිළිබඳ තොරතුරු පරිශීලනයට ශිෂ්‍යයන් යොමු කරන්න.

**3 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 8හි ඇති වයඹ දිග යුරෝපය හා ඇමරිකාවේ ඊසාන දිග වෙරළ කලාපය පිළිබඳ තොරතුරු පරිශීලනයට ශිෂ්‍යයන් යොමු කරන්න.

**4 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 7, 8 හි සඳහන් වී ඇති රටවල් හා නගර පිළිබඳ ශිෂ්‍ය අවධානය යොමු කරවන්න.
  (පිටු අංක 7හි 1.1. සිතියමේ දක්වා ඇති නගර)

ඇමුණුම 5.1.3.3 - කාර්ය පත්‍රිකා

1 - **කණ්ඩායම**

ඔබගේ තොරතුරු පත්‍රය හොඳින් අධ්‍යයනය කර පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සොයා පන්තියට ඉදිරිපත් කරයි.

i. ජන සංඛ්‍යා ව්‍යාප්තිය යනු කුමක් ද?
ii. ලෝකයේ ජනාධික කලාප මොනවා ද?
iii. ජන සංකේන්ද්‍රණ වෙරළබඩ ප්‍රදේශ ආශ්‍රිත ව පිහිටා තිබීමට හේතු මොනවා ද?
iv. අපගේ රට පිහිටා ඇත්තේ කුමන ජනාධික කලාපයේ ද?

2 - **කණ්ඩායම**

- ඔබගේ තොරතුරු පත්‍රිකාවේ ඇති කරුණු අනුසාරයෙන් සාරාංශ ගත කොට ඉදිරිපත් කරන්න.

3 - **කණ්ඩායම**

- ඔබගේ ගවේෂණ පත්‍රයේ තොරතුරු ඇසුරින් ලෝක ජන සංඛ්‍යාවේ සුවිශේෂ කරුණු ඇතුළත් වාක්‍ය 5ක් නිර්මාණය කර පන්තියට ඉදිරිපත් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

4 - **කණ්ඩායම**

- පිටු අංක 7හි 1.1 සිතියමෙන් මිලියන 10ට වැඩි ජන සංඛ්‍යාවක් වාසය කරන රටවල් පහක් හා නගර පහක් ඇති ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න. රටවල් සඳහා සංකේත වර්ණය ලා කහ පැහැය ද, නගර සඳහා නිල් පැහැය ද යොදා ගන්න. සිතියම සඳහා සුදුසු නමක් යොදා පන්තියට ප්‍රදර්ශනය කරන්න.

**වැඩිදුර පරිශීලනයට**

- 11 ශ්‍රේණිය භූගෝල විද්‍යාව ගුරු මාර්ගෝපදේශය - ජාතික අධ්‍යාපන ආයතනය
- www.wikepedia.org
- www.goohive.com

**නිපුණතාව -** ලෝක ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරමින් එහි සම්පත් අගය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** 1.4 ලෝක ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** . 01

**ඉගෙනුම් පල**

1. ලෝකයේ ජන හීන කලාප හඳුනා ගෙන විස්තර කරයි.
2. ලෝකයේ ජන හීන කලාප ආකෘති සිතියමක ලකුණු කර නම් කරයි.
3. ජන හීන කලාප වගු ගත කර පැහැදිලි කරයි.
4. මූලාශ්‍ර මගින් තොරතුරු හඳුනා ගනිමින් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම -** 5.1.4 ලෝකයේ ජන හීන පෙදෙස් පිළිබඳව දැන ගනිමු.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- ගවේෂණ ක්‍රමය
- ප්‍රශ්නකරණය

**ආකල්ප හා අගය පද්ධති**

1. භෞතික සාධක ජන ව්‍යාප්තියට බලපාන ප්‍රබල සාධකයක් බව අවබෝධ කර ගැනීම
2. ජන හීන ප්‍රදේශ ඇති වීමට බලපාන හේතු පිළිබඳ අවබෝධය ලැබීම

**ගුණාත්මක යෙදවුම්**

- ජනතාව අල්ප ව වාසය කරන ප්‍රදේශ අන්තර්ගත වූ වීඩියෝ පටයක්
- 5 ශ්‍රේණිය පෙළපොත
- සිතියම් පොත්
- ලෝක ආකෘති සිතියම්
- පාට පැන්සල්
- ෆෙල්ට් පෑන්
- ඕමයි කොළ
- ඇමුණුම් 5.1.4.1 . කාර්ය පත්‍රිකා

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

ලෝක භූමි ප්‍රමාණයෙන් 65%ක් පමණ ජන හීන ප්‍රදේශ බව හඳුන්වා දෙමින් ජන හීන ප්‍රදේශ ඇති වීමට හේතු පැහැදිලි කර දීමට හා ජන හීන ප්‍රදේශවල ව්‍යාප්තිය ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

**පියවර I**

- ජන හීන ප්‍රදේශයක දර්ශන ඇතුළත් වීඩියෝ පටය ප්‍රදර්ශනය කරමින් පහත සඳහන් ප්‍රශ්න පදනම් කර ගෙන පාඩමට ප්‍රවේශය ලබා ගන්න.
- ඔබ දුටු වීඩියෝ දර්ශනවල විශේෂිත ලක්ෂණ දෙකක් පවසන්න.
- ජනතාව අඩු වශයෙන් එම ප්‍රදේශවල වාසය කිරීමට බලපාන හේතු දක්වන්න.

**පියවර II**

- ශිෂ්‍යයන් කණ්ඩායම් තුනකට කාණ්ඩ කරන්න.
- ඇමුණුම් 5.1.4.1 කාර්ය පත්‍රිකා හා පෙළ පොතෙහි සඳහන් තොරතුරු ශිෂ්‍යයන් වෙත ලබා දී ඔවුන්ට අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙන්න.

**පියවර III**

- ඒ ඒ කණ්ඩායම් සැකසූ නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- එම නිර්මාණ පන්ති කාමරයේ සියලු දෙනාට දර්ශනය වන පරිදි රඳවා තබන්න.

**පියවර IV**

- ශිෂ්‍ය නිර්මාණ සඳහා ඌනපූරණ ලබා දෙමින් පහත කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනය කරන්න.
- ජන ව්‍යාප්තිය අසමාන වීමට ප්‍රධාන සාධක දෙකක් ඇති බව
- ජන හීන ප්‍රදේශ යනු වර්ග කිලෝමීටරයට පුද්ගලයන් පහකට අඩුවෙන් ජීවත් වන ප්‍රදේශ බව
- ජන හීන ප්‍රදේශ ඇති වීමට භෞතික පරිසරය ප්‍රබල හේතුවක් වන බව
- මධ්‍යස්ථ ජන ව්‍යාප්ත ප්‍රදේශ ද පවතින බව

**තක්සේරුකරණය හා ඇගයීම**

- ජන හීන ප්‍රදේශ යනු මොනවා දැයි ප්‍රකාශ කිරීම
- ජන හීන ප්‍රදේශ ඇති වීමට බලපාන හේතු අවබෝධයෙන් විස්තර කිරීම
- ලෝක ආකෘති සිතියමක ජන හීන ප්‍රදේශ ලකුණු කර නම් කිරීම
- මූලාශ්‍ර මගින් තොරතුරු සොයා ඉදිරිපත් කිරීම
- සාමූහික ව ක්‍රියාකාරකමෙහි නිරත වීම

5.1.4.1 ඇමුණුම - කාර්ය පත්‍රිකා

**1 - කණ්ඩායම**

පෙළපොත ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

i. ලෝක භූමි ප්‍රමාණයෙන් ජන හීන ප්‍රදේශ ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් කොපමණ ද?
ii. ජන හීන කලාප නම් කර ඒ එක් එක් ප්‍රදේශයකට උදාහරණ 1 බැගින් ලියන්න.
iii. මධ්‍යස්ථ ජන ව්‍යාප්ති ප්‍රදේශවල ජන ඝනත්වය කොපමණ ද?
iv. ජන ව්‍යාප්තිය අසමාන වීමට බලපාන ප්‍රධාන සාධක දෙක කුමක් ද?
v. ඔබ ජීවත් වන්නේ කුමන ජන ව්‍යාප්ති කලාපයක ද?
vi. ජන හීන ප්‍රදේශ ඇති වීමට බලපාන සාධක මොනවා ද?

ඔබ සැපයූ පිළිතුරු අදාළ ප්‍රශ්න ද සමග පන්තියට ඉදිරිපත් කරන්න.

**2 - කණ්ඩායම**

- ජන හීන ප්‍රදේශ පිළිබඳ තොරතුරු පන්තියේ අනෙක් ශිෂ්‍යයන්ට ලබා දීමට නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් කරන්න.

උදා - කෙටි සාකච්ඡා සභාවක්
පන්තියක ගුරු ශිෂ්‍ය ඉගෙනුම් ඉගැන්වීම්
භූමිකා රංගනයක්

3 - **කණ්ඩායම**

- ඔබගේ පෙළපොතේ ලෝක ජන සංඛ්‍යාව පාඩම උපයෝගී කර ගෙන ලෝකයේ ජන හීන ප්‍රදේශ 8ක් සපයා ඇති ආකෘති සිතියමේ ලකුණු කර පන්තියට ඉදිරිපත් කරන්න.

**වැඩිදුර පරිශීලනයට**

- 11 ශ්‍රේණිය භූගෝල විද්‍යාව ගුරු මාර්ගෝපදේශය - ජාතික අධ්‍යාපන ආයතනය
- www.goohive.com

## 5.2 ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව

**නිපුණතාව -** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරමින් සම්පත් අගය විමර්ශනය කරයි.

### හැඳින්වීම

ඕනෑ ම රටක ආර්ථිකය හා සංවර්ධන ක්‍රියාවලියෙහි මානව සම්පත වැදගත්ම සාධකයක් වශයෙන් සැලකේ. මානව සම්පත ප්‍රශස්ත මට්ටමක රඳවා ගැනීම ඕනෑ ම රටක සංවර්ධන ක්‍රියාවලියේ දී ඉතා වැදගත් වේ. එබැවින් මානව සම්පත පිළිබඳව නිවැරදි ව තේරුම් ගැනීමට ඒ හා සම්බන්ධ ලක්ෂණ පිළිබඳව අධ්‍යයනය කිරීම අවශ්‍ය වේ.

ඒ අනුව ශ්‍රී ලංකාව මිලියන 21ට අධික ජන සංඛ්‍යාවක් වෙසෙන සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස හඳුනා ගත හැකිය. බහු භාෂික, බහු වාර්ගික, බහු ආගමික රටක් ලෙසින් ද ශ්‍රී ලංකාව හැඳින්වේ. ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජයීය මෙන් ම වෙනත් බොහෝ කාර්ය තීරණය කිරීමෙහිලා ජන සංඛ්‍යාව ප්‍රධාන සාධකයක් ලෙස සැලකිය යුතු වේ. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා දීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

ඒකකය සඳහා භාවිතයට ගත හැකි නිදර්ශක ක්‍රියාකාරකම් කිහිපයක් ඔබ වෙත පහත පරිදි ලබා දී ඇත.



**නිපුණතාව -** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරමින් සම්පත් අගය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ප්‍රධාන ගති ලක්ෂණ පරීක්ෂා කරයි.

ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ සම්පත් අගය අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 01

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පිළිබඳ විස්තර කරයි.
2. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව හා සම්බන්ධ තොරතුරු වගු ඇසුරින් ඉදිරිපත් කරයි.
3. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් වීමේ වටිනාකම පැහැදිලි කරයි.
4. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ සම්පත් අගය තොරතුරු ඇසුරින් අධ්‍යයනය කර ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම -** 5.2.1 දැන ගමු සිරිලක ජනගහනය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- ප්‍රශ්නකරණය
- ගවේෂණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. බහු වාර්ගික, බහු ආගමික ජනතාවක් වාසය කරන රටක් බව ශ්‍රී ලංකාවෙහි සාමූහික ව ජීවත් වීමේ වටිනාකම අවබෝධ වීම
2. ජීවත් වීමට සුදුසු භෞතික, සමාජ, ආර්ථික පරිසරයක් හිමි රටක අගය දැන ගැනීම.

**ගුණාත්මක යෙදවුම්**

- ප්‍රදර්ශන පත්‍රිකාව
- පෙළපොත
- ඩිමයි කොළ

- ෆෙල්ට් පෑන්
- ඇමුණුම් 5.2.1.1 . තොරතුරු පත්‍රිකාව
  5.2.1.2 . කාර්ය පත්‍රිකාව

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව යන්න අර්ථ දැක්වීමත්, ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව හා ප්‍රධාන ජනවර්ග අදහන ප්‍රධාන ආගම් පිළිබඳව අවබෝධයක් ලබාදීමත්, ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කිරීමත් මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

පියවර I

පෙළපොතේ 2.1 වගුව සහ 2.1 සිතියම අඩංගු කර ඔබ විසින් පෙර සූදානම් කර ගත් ප්‍රදර්ශන පත්‍රය පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරමින් පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සාකච්ඡාවක් මෙහෙය වන්න.

- ශ්‍රී ලංකාව බහු වාර්ගික බහු ආගමික රටක් බව
- ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය 324 (වර්ග කිලෝ මීටර 1ට) බව
- දකුණු ආසියාවේ වාර්ෂික ජනගහන වර්ධන වේගය අඩු ම රට ශ්‍රී ලංකාව බව
- ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය පිළිවෙළින් වැඩි ම හා අඩු ම දිස්ත්‍රික්ක දෙක කොළඹ හා මුලතිව් බව

පියවර II

- පාඩමට උචිත වන පරිදි ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- ඇමුණුම් 5.2.1.1 හා 5.2.1.2 ශිෂ්‍යයන්ට ලබා දී අදාළ ක්‍රියාකාරකම් සඳහා උපදෙස් ලබා දෙන්න.

පියවර III

- ශිෂ්‍ය කාර්ය පත්‍රිකා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- එම ක්‍රියාකාරකම් පත්‍රිකා පන්තියට ප්‍රදර්ශනය වන පරිදි රඳවා තබන්න

පියවර IV

ශිෂ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා ඌනපූරණ ලබා දෙමින් පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනය කරන්න

- ශ්‍රී ලංකාව බහු භාෂික, බහු වාර්ගික, බහු ආගමික රටක් බව
- ශ්‍රී ලාංකිකයන් ලෙස සාමූහික ව ජීවත් වීමේ වටිනාකමෙහි අගය හා ප්‍රයෝජන
- වර්තමාන ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 21ට වඩා වැඩි වීම
- ජන ඝනත්වය යනු වර්ග කිලෝමීටරයක වෙසෙන මුළු ජන සංඛ්‍යාව බව
- කොළඹ දිස්ත්‍රික්කයේ සංවර්ධනය ජන ඝනත්වය ඒ ඒ ප්‍රදේශ අනුව විවිධ අගයන් ගන්නා බව

**තක්සේරුකරණය හා ඇගයීම**

- ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- ජන ඝනත්වය යනු කුමක් දැයි ප්‍රකාශ කිරීම
- ජන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු සොයා වගු ගත කිරීම
- ශ්‍රී ලංකාවේ බහු ආගමික, බහු වාර්ගික රටක් බවත් සාමුහික ව ජීවත් විය යුතු බවත් අගය කිරීම
- සාමූහික ව ක්‍රියාකාරකම්හි නිරත වීම

5.2.1.1 ඇමුණුම- - - තොරතුරු පත්‍රිකා

**1 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 12 භාවිත කිරීමට උපදෙස් දෙන්න.

**2 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 13 යොදා ගැනීමට උපදෙස් දෙන්න

**3 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 13 උපයෝගී කර ගැනීමට උපදෙස් දෙන්න.

5.2.1.2 - කාර්ය පත්‍රිකා

**1 - කණ්ඩායම**

ඔබගේ තොරතුරු පත්‍රය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා පන්තියට ඉදිරිපත් කරන්න.

- ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පිළිබඳ විධිමත් ව දත්ත රැස් කරන ආයතනය කුමක් ද?
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන වර්ග හා ආගම් මොනවා ද?
- ජන සංඛ්‍යාවේ විශාලත්වය අනුව ශ්‍රී ලංකාවට දකුණු ආසියාතික රටවල් අතරින් හිමි වන්නේ කී වෙනි ස්ථානය ද?
- දකුණු ආසියාවේ ජන සංඛ්‍යා වාර්ෂික වර්ධන වේගය අඩු ම රට කුමක් ද?
- ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය කොපමණ ද?
- බහු සංස්කෘතික ජන සමාජයක ඇති වටිනාකම් මොනවා ද?

**2 - කණ්ඩායම**

ඔබගේ තොරතුරු පත්‍රයට අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| ජන ඝනත්වය 100ට අඩු | ජන ඝනත්වය 600 - 999 අතර දිස්ත්‍රික්ක | ජන ඝනත්වය 3000ට වැඩි දිස්ත්‍රික්ක |
|---|---|---|
| | | |

**3 - කණ්ඩායම**

ඔබගේ තොරතුරු පත්‍රිකාවට අනුව ශ්‍රී ලංකාවේ ඇතැම් දිස්ත්‍රික්කවල ජන ඝනත්වය වැඩි වීමට බලපාන හේතු වර්ග 2කට බෙදා වගු ගත කරන්න.

**වැඩිදුර පරිශීලනයට**

- 12 ශ්‍රේණිය භූගෝල විද්‍යාව ගුරු මාර්ගෝපදේශය - ජාතික අධ්‍යාපන ආයතනය
- www.worldpopulation.com

**නිපුණතාව -** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරමින් සම්පත් අගය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ප්‍රධාන ගති ලක්ෂණ පරීක්ෂා කරයි.
ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ගතිකත්වය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය පිළිබඳව විස්තර කරයි.
2. ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය සිතියම් ගත කරයි.
3. ශ්‍රී ලංකාවේ ජන සංයුතිය පිළිබඳව තොරතුරු විස්තර කරයි.
4. ජන සංඛ්‍යාව හා සම්බන්ධ තොරතුරු ප්‍රස්තාර හා වගු ඇසුරින් ඉදිරිපත් කරයි.
5. ශ්‍රී ලංකාවේ උපත්, මරණ හා සංක්‍රමණ කෙරෙහි බලපෑ සාධක ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම -** 5.2.2 "අපේ රටේ ජන ව්‍යාප්තියයි සංයුතියයි දැන ගනිමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- ගවේෂණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ශ්‍රී ලංකාවේ ජන ව්‍යාප්තිය හා සංයුතියේ යහපත් ලක්ෂණ අවබෝධ කර ගැනීම
2. බස්නාහිර පළාතේ වේගවත් සංවර්ධනය, ජන සංඛ්‍යාව වර්ධනයට බලපා ඇති බව අගය කිරීම

**ගුණාත්මක යෙදවුම්**

- කැසට් රෙකෝඩරයක්
- පෙළපොත
- ලෝක සිතියම් පොත්
- ශ්‍රී ලංකා ආකෘති සිතියම
- ඩිමයි කොළ

- පාට පැන්සල්
- පාට පෑන්
- ඇමුණුම 5.2.1.1 . තොරතුරු පත්‍රිකා

  5.2.1.2 . කාර්ය පත්‍රිකා

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ගතිකත්වය, ජන සංඛ්‍යාව ප්‍රදේශ අනුව ව්‍යාප්ත වී ඇති ආකාරය සහ ජන සංයුතිය සකස් වී ඇති ආකාරය පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

පියවර I

පෙළපොතේ 2.1 ප්‍රස්තාරය, 2.2 ප්‍රස්තාරය, 2.3 ප්‍රස්තාරය, 2.4 ප්‍රස්තාරය විමර්ශනයට සහ 2.1 වගුවේ අඩංගු තොරතුරු ඇතුළත් කර ඔබ විසින් පෙර දිනක දී සැකසූ හඬ පටයක් ශිෂ්‍යයන්ට ඇසීමට සලස්වන්න.

- එම හඬ පටය අනුව පහත ප්‍රශ්න ශිෂ්‍යයන්ගෙන් විමසා පාඩම ආරම්භ කරන්න.
- ඔබට ඇසුණු හඬ පටයේ තිබූ තොරතුරු කුමක් පිළිබඳව ද?
- ජන සංඛ්‍යාව සෑම පළාතක ම සමාන ව ව්‍යාප්ත ව ඇත්තේ ද?
- වැඩි ම ජන ව්‍යාප්තියක් ඇත්තේ ග්‍රාමීය, නාගරික හා වතු යන අංශවලින් කුමන අංශයේ ද?
- ජාතීන් අනුව ජන සංයුතියේ වැඩි ම ප්‍රතිශතයක් හිමි ජාතිය කුමක් ද?
- ශ්‍රී ලංකාවේ ස්ත්‍රී, පුරුෂ ජන සංඛ්‍යා දත්ත අනුව වැඩි ම ප්‍රමාණයක් සිටින්නේ කවුරුන් ද?

පියවර II

- පාඩමට ගැළපෙන ලෙස නම් කර පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් 5කට වෙන් කරන්න.
- ඇමුණුම් 5.2.2.1 හා 5.2.2.2 ශිෂ්‍යයන්ට ලබා දී පන්ති කාමරයේ ඉදිරිපත් කිරීම් සඳහා උපදෙස් දෙන්න.

පියවර III

- ශිෂ්‍ය කාර්ය පත්‍රිකා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ශිෂ්‍ය නිර්මාණ පන්තියට ප්‍රදර්ශනය වන පරිදි රඳවා තබන්න.

පියවර IV

ශිෂ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා ඌනපූරණ සපයමින් පහත කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනය කරන්න.

- දිවයිනේ මුළු ජනගහනයෙන් වැඩි ම ප්‍රතිශතයක් බස්නාහිර පළාතේ ජීවත් වන බව
- නාගරික, ග්‍රාමීය, වතු ලෙස ද ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය කොටස් කළ හැකි බව
- ජාතීන් අනුව හා ආගම් අනුව ද ජන සංයුතිය හඳුනා ගත හැකි බව
- ස්ත්‍රී පුරුෂභාවය අනුව ද ජනගහන සංයුතිය හඳුනා ගත හැකි බව
- වයස් ප්‍රමාණ අනුව ද ජනගහන සංයුතිය හඳුනා ගන්නා බව

**තක්සේරුකරණය හා ඇගයීම**

- ශ්‍රී ලංකාවේ ජන ව්‍යාප්තිය විස්තර කිරීම
- ශ්‍රී ලංකාවේ පළාත් අනුව අසමාන ජන ව්‍යාප්තියක් ඇති බව අවබෝධයෙන් ප්‍රකාශ කිරීම
- ශ්‍රී ලංකාවේ ජන ව්‍යාප්තියේ තොරතුරු සිතියම් ගත කිරීම
- තොරතුරු ඇසුරින් ජන සංයුතියේ දත්ත වගු ගත කිරීම
- සාමූහික ව කටයුතු කිරීම

5.2.1.1 ඇමුණුම - <u>තොරතුරු පත්‍රිකා</u>

**1 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 14,15,16,17

**2 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 14

**3 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 15

**4 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 16,17

**5 - කණ්ඩායම**

- ශ්‍රී ලංකාවේ උපත්, මරණ හා සංක්‍රමණවලට අදළ තොරතුරු ශිෂ්‍යයන්ට සපයා දෙන්න. 11 ශ්‍රේණිය භූගෝල විද්‍යාව (පාසල් පෙළපොත් 2015 පිටු අංක 60,61,62,63)

5.2.1.2 - <u>කාර්ය පත්‍රිකා</u>

**1 - කණ්ඩායම**

ඔබගේ තොරතුරු පත්‍රය ඇසුරෙන් පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න.

1. මධ්‍යම පළාතේ ........................................ක ප්‍රමාණයක් ද, උතුරු පළාතේ ............................ ක ප්‍රමාණයක් ද ලෙස ජන ව්‍යාප්තිය පැතිරී ඇත.
2. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තියෙහි ..........................................ග්‍රාමීය,.......................... .වශයෙන් ජන ව්‍යාප්තිය කොටස් කළ හැකි ය.
3. රටක ජන සංයුතිය ලෙස අදහස් කරන්නේ එම රටෙහි ජන සංඛ්‍යාව ජාතීන් හා ............................. අනුව මෙන් ම ............................................ අනුව කාණ්ඩ ගත වීමයි.
4. 2.3 ප්‍රස්තාර සටහන අනුව .......................... ක් ජීවත් වන්නේ සිංහල ජනතාවයි. දෙමළ ජාතීන් .................... ක් ද ජීවත් වේ.
5. ආගම අනුව .................................... 70.2ක් ද හින්දු ................................................ ක් ද, .. ............................ක් ඉස්ලාම් ද ශ්‍රී ලංකාවේ ජීවත් වෙති.
6. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ජන ප්‍රතිශතය ....................................... ක් ද පිරිමි ජන ප්‍රතිශතය ......... ........................ ක් ද 2012 සංගණන වාර්තා අනුව හඳුනා ගනු ලැබීය.

**2 - කණ්ඩායම**

ඔබගේ තොරතුරු පත්‍රිකාවේ ඇති ප්‍රස්තාරය උපයෝගී කර ගෙන ශ්‍රී ලංකා ආකෘති සිතියමක එම පළාත් ලකුණු කර නම් කරන්න. ජන සංඛ්‍යා ප්‍රතිශතය නිරූපණය කිරීමට සුදුසු පරිදි වර්ණ හා අංක යොදා පන්තියට ඉදිරිපත් කරන්න.

**3 - කණ්ඩායම**

ඔබගේ තොරතුරු පත්‍රිකාවේ ඇති ප්‍රස්තාරයේ නිරූපණය කරන තොරතුරු සුදුසු පරිමාණයක් යොදා ඇගෙන ස්තම්භ ප්‍රස්තාරයකින් නිරූපණය කර පෙන්වන්න.

**4 - කණ්ඩායම**

ඔබගේ තොරතුරු පත්‍රිකාවේ ඇති දත්ත සුදුසු පරිදි වෙන් කර වගු ගත කර ඉදිරිපත් කරන්න

**5 - කණ්ඩායම**

ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ උපත්, මරණ සංක්‍රමණය පිළිබඳ බලපාන සාධක ඉදිරිපත් කරන්න

**වැඩිදුර පරිශීලනයට -**

- ජන හා සංඛ්‍යාලේඛන වාර්තා
- 11 ශ්‍රේණිය භූගෝල විද්‍යාව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

**නිපුණතාව -** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ස්වභාවය අධ්‍යයනය කරමින් සම්පත් අගය විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ප්‍රවණතා විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ මෑත කාලීන ප්‍රවණතාවලට බලපෑ සාධක නම් කරයි.
2. ජන සංඛ්‍යාවේ මෑත කාලීන ප්‍රවණතාවලට බලපෑ හේතු විස්තර කරයි.
3. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පිළිබඳ ගැටලු ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම -** 5.2.3 "දැන ගමු සිරිලක ජන නව තොරතුරු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- ප්‍රශ්නකරණය
- ගවේෂණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. නාගරික පහසුකම් වැඩි වීම ජන සංඛ්‍යාව ක්‍රමයෙන් වර්ධනය වීමට හේතු වී ඇති බව අවබෝධ වීම
2. ජන සංඛ්‍යාව වැඩි වීම හේතුවෙන් නගරයේ පහසුකම් වර්ධනය වී ඇති අතර ගැටලු රැසක් ද නිර්මාණය වී ඇති බව අවබෝධ කර ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත
- ශ්‍රී ලංකාවේ ජන ඝනත්ව සිතියම
- ඩිමයි කොළ
- ෆෙල්ට් පෑන්
- ඇමුණුම් 5.2.3.1 . තොරතුරු පත්‍රිකා
  5.2.3.2 . කාර්ය පත්‍රිකා

පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්

ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ නව ප්‍රවණතා වන වියපත් වීම, නාගරික ජන සංඛ්‍යා වැඩි වීම, ජනගහනයේ සාඵල්‍යතාව අඩු වීම යන කරුණු පිළිබඳ ශිෂ්‍යයන්ට යම් අවබෝධයක් ලබා දීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

ජන සංඛ්‍යාව වියපත් වීම, නාගරික ජන සංඛ්‍යාව වැඩි වීම, ජනගහනයේ සාඵල්‍යතාව අඩු වීම පිළිබඳ පෙළපොත් සඳහන් තොරතුරු ශිෂ්‍යයන් තිදෙනෙකුට පෙර දිනක දී හොඳින් පාඩම් කර එන ලෙස දැනුවත් කර පාඩම ආරම්භයේ දී ඔවුන් තිදෙනා පන්ති කාමරය ඉදිරියට ගෙනවිත් කෙටි සාකච්ඡාවක් පැවැත්වීමට උපදෙස් ලබා දෙන්න. ඉන්පසු පහත ප්‍රශ්න ශිෂ්‍යයන්ට ඔවුන්ගෙන් විමසීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර I

- ජන සංඛ්‍යාවේ නව ප්‍රවණතාවක් කියන්න.
- දකුණු ආසියාවේ වැඩි ම මහලු ජන සංඛ්‍යාවක් වෙසෙන රට කුමක් ද?
- නාගරික ජන සංඛ්‍යාව ඉහළ යාමට හේතු වූ සාධකයක් කියන්න.
- ජන සංඛ්‍යාවේ සාඵල්‍යතාව අඩු වීම යනු කුමක් ද?

පියවර II

- පාඩමට උචිත වන පරිදි නම් කර පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- ශිෂ්‍ය කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න

පියවර III

- ශිෂ්‍ය කාර්ය පත්‍රිකා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- එම ක්‍රියාකාරකම් පත්‍රිකා පන්තියට ප්‍රදර්ශනය වන පරිදි රඳවා තබන්න

පියවර IV

ශිෂ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා ඌනපූරණ ලබා දෙමින් පහත සඳහන් කරුණු ඉස්මතු වන පරිදි සමාලෝචනය කරන්න

- ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ නව ප්‍රවණතා දක්නට ලැබෙන බව
- ජන සංඛ්‍යාව වියපත් වීම ළදරු මරණ අනුපාතිකය අඩු වීම හා ආයු අපේක්ෂාව ඉහළ යාම
- 1871 .- 1981 කාලයේ නාගරික ජන සංඛ්‍යාව දොළොස් ගුණයකින් වැඩි වී ඇති බව
- ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව වියපත් වීම ගැටලු රැසක් නිර්මාණය කර ඇති බව
- සාඵල්‍යතාව අඩු වීමට සමාජ ආර්ථික සාධක රාශියක් බලපාන බව

**තක්සේරුකරණය හා ඇගයීම**

- ජන සංඛ්‍යාව සම්බන්ධ ගැටලුවලට බලපාන හේතු පැහැදිලි කිරීම
- ජන සංඛ්‍යාවේ නව ප්‍රවණතා හැඳින් වීම
- ජන සංඛ්‍යාවේ වියපත් වීම ගැටලුවක් බව අවබෝධයෙන් ප්‍රකාශ කිරීම
- සාමූහික ව තොරතුරු එක් රැස් කර ඉදිරිපත් කිරීම
- රටක ආර්ථික සැලසුම් සඳහා ජන සංඛ්‍යා ප්‍රවණතා අධ්‍යයනය කළ යුතු බව අන් අයට වටහා දීම

5.2.3.1 ඇමුණුම - තොරතුරු පත්‍රිකා

**1 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 23

**2 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 23

**3 - කණ්ඩායම**

- පෙළපොතේ පිටු අංක 24 පිටුව

5.2.3.2 - කාර්ය පත්‍රිකා

**1 - කණ්ඩායම**

පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා පන්තියට ඉදිරිපත් කරන්න.

- ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ නව ප්‍රවණතා තුනක් ලියන්න.
- ජන සංඛ්‍යාව වියපත් වීම යනු කුමක් ද?
- ජන සංඛ්‍යාව වියපත් වීම නිසා ඇති වන ගැටලු තුනක් ලියන්න.

**2 - කණ්ඩායම**

ඔබගේ තොරතුරු පත්‍රිකාවේ ඇති තොරතුරු පන්තියට ඉදිරිපත් කිරීම සඳහා සුදුසු භූමිකා රංගනයක් නිර්මාණය කරන්න.

උදා .- සාකච්ඡා සභාවක්, පන්ති කාමරයක ශිෂ්‍යයන් පිරිසක්

**3 - කණ්ඩායම**

ඔබගේ තොරතුරු පත්‍රිකාවට අනුව පහත කරුණු පිළිබඳ කෙටි සටහන් නිර්මාණය කර පන්තියට ඉදිරිපත් කරන්න.
නාගරික ජන සංඛ්‍යාවේ වැඩි වීමේ ගැටලුව හා ඊට විසඳුම්
ජන සංඛ්‍යාවේ වියපත් වීමේ ගැටලුව හා ඊට විසඳුම්

**4 - කණ්ඩායම**

ඔබගේ තොරතුරු පත්‍රිකාව භාවිතා කර කෙටි ප්‍රශ්න 5ක් නිර්මාණය කර ඒවාට සුදුසු පිළිතුරු සපයා පන්තියට ඉදිරිපත් කරන්න.

**වැඩිදුර පරිශීලනයට**

-

- 11 ශ්‍රේණිය භූගෝල විද්‍යාව ගුරු මාර්ගෝපදේශය - ජාතික අධ්‍යාපන ආයතනය
- 12 ශ්‍රේණිය භූගෝල විද්‍යාව ගුරු මාර්ගෝපදේශය - ජාතික අධ්‍යාපන ආයතනය
- www.unpopulation.org.com

## 5.3 ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික කටයුතු

**නිපුණතාව -** ලෝකයේ ප්‍රධාන කෘෂි කාර්මික ක්‍රම විමර්ශනය කරයි.

### හැඳින්වීම

ලෝකයේ ආර්ථික කටයුතු විවිධාකාර ය. කෘෂිකර්මය, කර්මාන්ත වෙළඳාම හා සේවා වශයෙන් ඒවා හඳුනා ගත හැකි ය.

ඒ අතරින් කෘෂිකර්මය ප්‍රධාන ආර්ථික කටයුත්තකි. ලෝක ජන සංඛ්‍යාවෙන් බහුතරය නියැළී සිටින්නේ කෘෂිකර්මය හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ය. කෘෂිකාර්මික කටයුතු සඳහා භූමිය යොදවා ඇති ආකාරය කෘෂිකාර්මික භූමි පරිභෝගය ලෙස හැඳින්වේ.

මෙම ඒකකයෙන් කෘෂිකාර්මික භූමි පරිභෝගයෙහි කැපී පෙනෙන ධාන්‍ය වගාව, වී, තිරිඟු ව්‍යාපාරික කිරිපට්ටි පාලනය හා වතු කෘෂිකර්මය, තේ, රබර් කෙරෙහි අවධානය යොමු කෙරේ.



**නිපුණතාව -** ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රම විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රමවල ගති ලක්ෂණ පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. ලෝකයේ කෘෂිකර්මාන්තය හඳුන්වා එහි වැදගත්කම විස්තර කරයි.
2. කෘෂිකාර්මික කටයුතුවල ප්‍රධාන ලක්ෂණ විස්තර කරයි.
3. ලෝක කෘෂිකාර්මික කටයුතුවල ව්‍යාප්තිය සිතියම් ඇසුරින් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම -** 5.3.1 ලෝකයේ කෘෂිකාර්මික කටයුතු හඳුනා ගනිමු.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා හා ඉදිරිපත් කිරීම්
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ලෝකයේ කෘෂිකාර්මික කටයුතුවල මූලික ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ලැබීම.
2. මානවයාගේ පැවැත්මට කෘෂිකර්මාන්තය අත්‍යවශ්‍ය බව අවබෝධ කර ගැනීම.
3. පරිසර සාධක වෙනස් නො කොට කෘෂි කටයුතු තිරසර ව පවත්වා ගෙන යා යුතු බව අවධාරණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- තෝරා ගත් කෘෂිබෝගවල ව්‍යාප්තිය දැක්වෙන ලෝක සිතියම්
- ලෝකයේ විවිධ කෘෂිකාර්මික වගා බිම්වල පින්තූර හා ඒ ඒ වගාවට අදාළ සාධක ඇතුළත් කාඩ්පත්

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

කෘෂිකර්මයට අවශ්‍ය භූගෝලීය සාධක කෘෂිකාර්මික ප්‍රදේශවල ව්‍යාප්තිය, පිළිබඳව අවබෝධ කිරීම මෙම ක්‍රියාකාරකම් දෙක මගින් අපේක්ෂා කෙරේ.

**පියවර I**

- වගා බිම්වල පින්තූර හා ඒවායින් දැක්වෙන වගාවන් සම්බන්ධ අවශ්‍ය සාධක විමසමින් කෙටි සාකච්ඡාවක් මගින් පාඩමට ප්‍රවේශ වීම

**පියවර 11**

- එම සාකච්ඡාව ඉදිරියට ගෙන යමින් පහත තේමාවලට අවධානය යොමු කරන්න.
- වගාවන් විවිධ බව
- වගාවන් සඳහා විශේෂිත කලාප පවත්නා බව
- ඒවාට අවශ්‍ය සාධක වෙනස් වන බව
- ඒ ඒ වගාවන්ට විශේෂිත ලක්ෂණ පවත්නා බව
- ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හඳුනා ගත හැකි බව

**පියවර 111**

- ශිෂ්‍යයන් උචිත පරිදි කණ්ඩායම් කරන්න.
- වගා බිම්වල පින්තූර එක් එක් කණ්ඩායමට බෙදා දෙන්න.
- වගාව පිළිබඳ කෙටි තොරතුරු පත්‍රිකාවක් සකස් කරවන්න.

ශිෂ්‍යයන් සැකසූ වාර්තා ඉදිරිපත් කර වීම. කණ්ඩායම්වල වාර්තා පිළිබඳව ප්‍රබලතා, දුබලතා සාකච්ඡා කරන්න.

- පාඩම සාරාංශ කරමින් පහත දැක්වෙන නිර්ණායක තහවුරු වන සේ ඇගයීමට ලක් කරන්න

**තක්සේරුකරණය හා ඇගයීම**

- ලෝක කෘෂිකර්මාන්තයේ වැදගත්කම පැහැදිලි කිරීම
- ලෝකයේ විවිධ වගාවන්ට විශේෂිත වූ සාධක ඇති බව අවබෝධයෙන් ප්‍රකාශ කිරීම
- ලෝකයේ කෘෂිකාර්මික කලාපවල ව්‍යාප්තිය සිතියම් ඇසුරින් දැක්වීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හඳුන්වා දීම

**නිපුණතාව -** ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රම විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රමවල ගති ලක්ෂණ පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල** -

1. ලෝකයේ කෘෂිකාර්මික කටයුතුවල විකාශය විස්තර කරයි.
2. ලෝක කෘෂි කර්මාන්තයේ වැදගත් බවට හේතු පැහැදිලි කරයි.
3. බුදු දහමෙහි කෘෂිකර්මාන්තයට හිමි ස්ථාය පිළිබඳව සාකච්ඡා කරයි.

**ක්‍රියාකාරකම** - 5.3.2 "කෘෂිකාර්මික කටයුතුවල විකාශය හඳුනා ගනිමු".

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. අතීතයේ සිට මිනිස් ජීවිතය පවත්වා ගැනීම සඳහා කෘෂිකර්මාන්තයේ ඇති වැදගත්කම අවබෝධ කර ගැනීම
2. කෘෂිකර්මාන්තය ලෝක ආර්ථිකයෙහි මුල් තැනක් ගන්නා බව අගය කිරීම
3. බුදු දහමෙහි කෘෂිකර්මාන්තය උසස් ආර්ථික කටයුත්තක් ලෙස අවධාරණය කිරීම

**ගුණාත්මක යෙදවුම්**

- ලෝක කෘෂිකාර්මික ව්‍යාප්ති සිතියම්
- තේමාවට අදාළ පොත් පත්, ලිපි වාර්තා, සටහන් (නියමිත දිනට රැගෙන එන ලෙස පෙර දිනයක දී ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.)
- වීඩියෝ දර්ශන
- පුවත්පත් වාර්තා ,- චිත්‍ර
- බුදු දහමේ කෘෂිකර්මාන්තය පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපි ලේඛන

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

කෘෂිකර්මාන්තයේ විකාශය හා බුදු දහමෙහි කෘෂිකර්මාන්තය උසස් කොට අගය කර ඇති ආකාර පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

පියවර I

- කෘෂිකර්මාන්තයට අදාළ ජන කවියක් ගායනා කරමින් ඒ පිළිබඳ ප්‍රශ්න විමසමින් පාඩමට ප්‍රවේශ වීම.
- ඒ මගින් කෘෂිකර්මාන්තය පිළිබඳ කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 11

- සාකච්ඡාව තවදුරටත් ඉදිරියට ගෙන යමින් පහත තේමා පිළිබඳ අවධානය යොමු කරවන්න.
- ලෝක කාෂිකර්මාන්තයේ විකාශය
- ලෝක කෘෂිකර්මාන්තය වැදගත් බවට පත් වීමට හේතු වූ සාධක
- බුදු දහමෙහි කෘෂිකර්මාන්තයට හිමි ස්ථානය

පියවර 111

- ශිෂ්‍යයන් උචිත පරිදි කණ්ඩායම් කර, ඉහත තේමාවලට අදාළව තොරතුරු රැස්කිරීමට යොමු කරවන්න.
- ගවේෂණය කළ තොරතුරු අනුව වාර්තාවක් සැකසීමට උපදෙස් දෙන්න.

පියවර IV

- ශිෂ්‍යයන් සැකසූ වාර්තා ඉදිරිපත් කර වන්න. කණ්ඩායම් ඉදිරිපත් කිරීම්වල ප්‍රබලතා හා දුබලතා සාකච්ඡා කරන්න.

පියවර V

- පාඩම සාරාංශ කරමින් නිර්ණායක තහවුරු වන සේ ඇගැයීමට ලක් කරන්න. මේ සඳහා කෙටි ප්‍රශ්න යොදා ගන්න.

**තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක**

- කෘෂිකාර්මික කටයුතුවල විකාශය පිළිබඳව විස්තර කිරීම
- බුදු දහමෙහි කෘෂිකර්මාන්තයට හිමි ස්ථානය පිළිබඳව අවබෝධයෙන් ප්‍රකාශ කිරීම
- කෘෂිකර්මාන්තයේ වැදගත් වීමට හේතු වන සාධක ප්‍රකාශ කිරීම
- නියමිත කාලයට අනුව ගුරු උපදෙස් පිළිපදිමින් කාර්යය නිම කිරීම
- කණ්ඩායමෙහි සහයෝගයෙන් කටයුතු කිරීම

**නිපුණතාව -** ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රම විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රමවල ගති ලක්ෂණ පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 01

**ඉගෙනුම් පල**

1. ලෝකයේ ප්‍රධාන කෘෂි බෝගවල ලක්ෂණ හඳුන්වයි.
2. ලෝකයේ තිරිඟු වගාවේ වැදගත්කම හා ලක්ෂණ විස්තර කරයි.
3. තිරිඟු වගාවේ ලෝක ව්‍යාප්තිය සිතියමකින් දක්වයි.
4. තිරිඟු වගාව සම්බන්ධ ප්‍රවණතා හා ගැටලු විස්තර කරයි.

**ක්‍රියාකාරකම -** 5.3.2 "තිරිඟු වගාව"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** -

- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ආහාර මෙන් ම කෘෂිකාර්මික අමුද්‍රව්‍ය සපයන වගාවක් ලෙස තිරිඟු වගාව අගය කිරීම

**ගුණාත්මක යෙදවුම්**

- ලෝකයේ තිරිඟු වගා කරන ප්‍රදේශ දැක්වෙන සිතියම
- ඇමුණුම 5.3.3.1 කාර්ය පත්‍රිකාව
- පුවත්පත් වාර්තා (පාඩමට පෙර ශිෂ්‍යයන් දැනුවත් කරන්න.)
- තිරිඟු වගාවේ ලක්ෂණ දක්වන පින්තූර

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

තිරිඟු වගාව පිළිබඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම සංවිධානය කරන්න. ලෝකයේ තිරිඟු වගා ව්‍යාප්තිය හා ඒ සඳහා බලපාන සාධක, ප්‍රවණතා, ගැටලු විසඳුම් අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

පියවර I

- තිරිඟු වගා බිම්, නිෂ්පාදිත ආහාර දැක්වෙන පින්තූර ප්‍රදර්ශනය කර එහි වැදගත්කම පිළිබඳ සාකච්ඡා කරමින් පාඩමට ප්‍රවේශ වීම. ඒ මගින් තිරිඟු වගාවේ ලක්ෂණ ව්‍යාප්තිය ප්‍රවණතා ගැටලු හා ඒවාට විසඳුම් පිළිබඳ අවධානය යොමු කරමින් සාකච්ඡාව මෙහෙය වන්න.

පියවර 11

- ශිෂ්‍යයන් උචිත පරිදි කණ්ඩායම් කර තිරිඟු වගාව සම්බන්ධ තොරතුරු ගොනුවක් සැකසීමට උපදෙස් දෙන්න. එහිදී ද ඉහත කරුණුවලට අවධානය යොමු කරන්න.
- ඇමුණුම 5.3.3.1 කාර්ය පත්‍රිකාව ශිෂ්‍යයන්ට බෙදා දෙන්න.
- කාර්ය පත්‍රිකාවේ සඳහන් ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කරන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- තිරිඟු වගාවේ වැදගත්කම හා ලක්ෂණ පැහැදිලි කිරීම
- තිරිඟු වගාවේ ව්‍යාප්තිය ලෝක සිතියමක ලකුණු කර දැක්වීම
- තිරිඟු වගාව සම්බන්ධ ප්‍රවණතා, ගැටලු හා විසඳුම් විස්තර කිරීම
- නිර්මාණාත්මක ව තොරතුරු ඉදිරිපත් කිරීම
- සාමූහිකත්ව ගුණාංග ප්‍රදර්ශනය කිරීම

පියවර 111

- කණ්ඩායම් මගින් සැකසූ තොරතුරු පත්‍රිකා පන්තියට ඉදිරිපත් කරන්න.

පියවර IV

පහත කරුණු ඉස්මතු වන සේ සමාලෝචනය කරන්න. තිරිඟු වගාවේ,
වැදගත්කම

- ලක්ෂණ
- ව්‍යාප්තිය,
- ප්‍රවණතා
- ගැටලු හා විසඳුම්

ඇමුණුම 5.3.3.1

**කාර්ය පත්‍රිකාව**

තිරිඟු වගාව පිළිබඳව පහත තේමා යටතේ කරුණු ඉදිරිපත් කරන්න.

- වැදගත්කම
- ප්‍රවණතා
- ලක්ෂණ
- භාවිත තාක්ෂණය
- ගැටලු හා විසඳුම්
- ව්‍යාප්තිය

**නිපුණතාව -** ලෝකයේ ප්‍රධාන කෘෂි කාර්මික ක්‍රම විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ ප්‍රධාන කෘෂි කාර්මික ක්‍රමවල ගති ලක්ෂණ පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. වී ගොවිතැනෙහි ප්‍රධාන ලක්ෂණ විස්තර කරයි.
2. වී වගාවේ විකාශය හා එහි වැදගත්කම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
3. බුද්ධ දේශනාවල වී ගොවිතැනෙහි වැදගත්කම අවධාරණය කර ඇති ආකාරය පැහැදිලි කරයි.
4. වී වගාවේ ව්‍යාප්තිය සිතියම් ඇසුරින් දක්වයි.

**ක්‍රියාකාරකම -** 5.3.4 "ලෝකයේ වී වගාව හඳුනා ගනිමු".

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ලෝකයේ පවතින ධාන්‍ය වගා අතරින් වී වගාව ප්‍රධානතම ආහාර මූලාශ්‍රයක් වන බව පිළිගැනීම
2. වී වගාව ආසියාවේ ගංගා නිම්න ආශ්‍රිත ව ප්‍රධාන වශයෙන් ව්‍යාප්ත වී ඇති බව අවබෝධ කර ගැනීම
3. වී ගොවිතැන යහපත් කර්මාන්තයක් ලෙස බුදු දහමේ අවධාරණය කර ඇති බව

**ගුණාත්මක යෙදවුම්**

- වී වගාව ආශ්‍රිත පින්තූර
- ලෝකයේ වී වගා ව්‍යාප්තිය දැක්වෙන සිතියම
- සහල් ආශ්‍රිත නිෂ්පාදන දැක්වෙන පින්තූර
- පුවත්පත් /සඟරා
- වීඩියෝ දර්ශන, පින්තූර, කවිපන්ති ඇතුළත් හඬපටිය ගුරුවරයා විසින් සපයා ගන්න
- ඇමුණුම 5.3.4.1 තේරවිලි කවි

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

වී වගාව ලෝක කෘෂිකර්මාන්තයෙහි ආසියාව මූලික කරගෙන මුළු ලෝක ජන සංඛ්‍යාවෙන් 31% ක පමණ නිරත වන ආර්ථික කටයුත්තක් මෙන් ම ඉපැරණි වගාවක් ලෙස ද වැදගත් ය. සියුම් පාරිභෝගික වගාවේ සිට ව්‍යාපාරික වගාවක් දක්වා ව්‍යාප්ත වීම වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

සාකච්ඡා ක්‍රමය යොදා ගනිමින් ශිෂ්‍ය කේන්ද්‍රීය ව ඉගෙනුම් පල තහවුරු වන සේ ඉගෙනුම් /ඉගැන්වීම් ක්‍රියාකාරකම සංවිධානය කර ගන්න.

**පියවර I**

වී වගාවේ මානුෂ හා යාන්ත්‍රික ක්‍රියාකාරකම් ඇතුළත් පින්තූරයක් ප්‍රදර්ශනය කිරීම.
ඇමුණුම 5.3.4.1 තේරවිලි පන්ති ඇසීමට සැලැස්වීම හා ඒ පිළිබඳ ප්‍රශ්න කරමින් පාඩමට ප්‍රවේශ වීම.

**පියවර 11**

සාකච්ඡාව තවදුරටත් මෙහෙයවමින් පහත තේමා පිළිබඳ අවධානය යොමු කරවන්න.

- වී වගාවේ ව්‍යාප්තිය
- වී වගාවේ විකාශය, වැදගත්කම, වී වගාවට අවශ්‍ය සාධක.
- වී වගාවේ වර්ධනයට ගෙන ඇති පියවර/ගැටලු හා ඒවාට දී ඇති විසඳුම්.
- බුදු දහමේ වී වගාව පිළිබඳ ඉගැන්වෙන තොරතුරු

**පියවර 111**

උචිත පරිදි ශිෂ්‍යයන් මෙහෙයවා ඉහත තේමාවලට අදාළ ව,

- පුවත්පත් වාර්තා
- තේමාවට අදාළ ග්‍රන්ථ
- වීඩියෝ දර්ශන

මගින් ලබා ගත් තොරතුරුවලට අනුව වාර්තාවක් සැකසීමට උපදෙස් දෙන්න.

**පියවර IV**

- ශිෂ්‍යයන් සැකසූ වාර්තා ඉදිරිපත් කරවන්න.
- ශිෂ්‍යයන් ඉදිරිපත් කළ වාර්තාව පිළිබඳව අදහස් අනෙක් ශිෂ්‍යයන්ගෙන් අදහස් ලබා ගන්න.
- ශිෂ්‍යයන් ඉදිරිපත් කළ අදහස්වල ප්‍රබලතා, දුබලතා සාකච්ඡා කරන්න.

පියවර V

- පාඩම සාරාංශ කරමින් නිර්ණායක තහවුරු වන සේ ඇගයීමට ලක් කරන්න.
- මේ සඳහා කෙටි ප්‍රශ්න යොදා ගන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- වී වගාවේ විකාශය හා වැදගත්කම පිළිබඳ විස්තර කිරීම
- බුදු දහමේ වී වගාව පිළිබඳ දක්වා ඇති අදහස් අවබෝධයෙන් ප්‍රකාශ කිරීම
- වී වගාව ආසියාව මුල් කරගත් ව්‍යාප්තියක් දැක්වුව ද අන් රටවල ද ව්‍යාප්ත ව ඇති බව පැහැදිලි කිරීම
- නියමිත කාලයෙහි ගුරු උපදෙස් පිළිපදිමින් කටයුතු කිරීම
- සාකච්ඡාවට සක්‍රීය ව දායක වීම

ඇමුණුම 5.3.4.1

තේරවිල්ල

| | | |
|---|---|---|
| 1. | ගසට නමකි ගස මැරුණම වෙන | නමකි |
| | ගෙඩියට නමකි ගෙඩියේ පොත්තට | නමකි |
| | මදයට නමකි මද කන කොට වෙන | නමකි |
| | මෙතුන් පදේ තෝරාලා කියන් | සකි |
| | | |
| 2. | මෙහෙමයි වී බත් | වන්නේ |
| | කැකුළු සුවඳ | පතුරන්නේ |
| | කල් සලකාලයි | කන්නේ |
| | පිළිණු වුවොත් ලෙඩ | දෙන්නේ |
| | | |
| | කිරෙන් පිසූ කල | කිරිබත් |
| | කහකිරි යෙදූ කල | කහබත් |
| | දියෙන් තැනූ කල | දිය බත් |
| | පිළුණු වුවොත් නැත | යහපත් |

**නිපුණතාව -** ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රම විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රමවල ගති ලක්ෂණ පරීක්ෂා කරයි.

කිරිපට්ටි පාලනයේ විකාශය හා වැදගත්කම පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව -** 01

**ඉගෙනුම් පල**

1. බුදු දහමෙහි ගව පාලනයට හිමි වූ ස්ථානය විස්තර කරයි.
2. කිරිපට්ටි පාලනයේ වර්තමාන තත්ත්වය සාකච්ඡා කරයි.

**ක්‍රියාකාරකම -** 5.3.5 ව්‍යාපාරික කිරි පට්ටි පාලනය හඳුනා ගනිමු.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා ක්‍රමය
- ගවේෂණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ව්‍යාපාරික කිරිපට්ටි පාලනය මිනිසාගේ පෝෂණය සඳහා වැදගත් වන ආර්ථික කටයුත්තක් ලෙස අගය කිරීම.

**ගුණාත්මක යෙදවුම්**

- කිරිපට්ටි පාලනයේ ව්‍යාප්තිය දැක්වෙන ලෝක සිතියම්
- කිරිපට්ටි පාලනය දැක්වෙන රූප රාමු.
- කිරිපට්ටි පාලනය සඳහා නූතන තාක්ෂණය යොදා ගන්නා ආකාරය දැක්වෙන වීඩියෝ පටයක් (ගුරුවරයා විසින් සකස් කර ගත්) / පින්තූර
- කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන දැක්වෙන ලේබල් හා පින්තූර

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

නූතන ලෝකයේ විවිධ දේශගුණ තත්ත්ව යටතේ ව්‍යාපාරික මට්ටමින් සාර්ථක ව කිරි පට්ටි පාලනය සිදු කරයි. කිරිපට්ටි පාලනයේ විකාශය, වැදගත්කම ගැටලු පිළිබඳ අවධානය කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

ශිෂ්‍යයන් සමඟ තොරතුරු ගවේෂණය කරමින් හා සාකච්ඡාවක් මෙහෙයවමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම සංවිධානය කරන්න.

පියවර I

- කිරිපට්ටි පාලනය දැක්වෙන වීඩියෝ පටය පින්තූර ප්‍රදර්ශනය මගින් පාඩමට ප්‍රවේශ වීම හා ඒ මගින් කිරිපට්ටි පාලනය පිළිබඳ දක්වෙන දේ සාකච්ඡා කරන්න.

පියවර 11

තව දුරටත් එම සාකච්ඡාවේ දී දැක්වෙන පහත සඳහන් තේමා පිළිබඳ අවධානය යොමු කරන්න.

- ලෝකයේ කිරිපට්ටි පාලන කර්මාන්තයේ විකාශය
- කිරි පට්ටි පාලන කර්මාන්තයේ වැදගත්කම
- බුදු දහමෙහි ගව පාලනය පිළිබඳ දක්වා ඇති අදහස්

පියවර 111

උචිත පරිදි ශිෂ්‍යයන් මෙහෙයවමින් ඉහත තේමා සඳහා

- පුවත්පත් වාර්තා
- වීඩියෝ දර්ශන හා පෙළපොත

මගින් කරුණු රැස් කිරීමට යොමු කරවන්න. රැස් කළ තොරතුරු අනුව එම තේමාවලට අදාළ ව වාර්තාවක් සැකසීමට උපදෙස් දෙන්න.

පියවර IV

- ශිෂ්‍යයන් සැකසූ වාර්තා කීපයක් ඉදිරිපත් කරවීම.
- ශිෂ්‍යයන් ඉදිරිපත් කළ තොරතුරුවල ප්‍රබලතා දුබලතා පිළිබඳ සාකච්ඡා කරන්න.
- පාඩම සාරාංශ කරමින් නිර්ණායක තහවුරු වන සේ කෙටි ප්‍රශ්න කිහිපයක් යොමු කරමින් ඇගයීමට ලක් කරන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- කිරිපට්ටි පාලනයේ විකාශය හා වැදගත්කම පිළිබඳ විස්තර කිරීම
- බුදු දහමෙහි ගව පාලනයේ ප්‍රයෝජන දක්වා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ප්‍රකාශ කිරීම
- වර්තමානයේ කිරිපට්ටි පාලනය වැදගත් ආර්ථික කටයුත්තක් වන බව පැහැදිලි කිරීම
- නිර්මාණාත්මක ව සැකසූ වාර්තා ඉදිරිපත් කිරීම
- නියමිත කාලයට කාර්යය නිම කිරීම

**නිපුණතාව -** ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රම විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රමවල ගති ලක්ෂණ පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව -** 01

**ඉගෙනුම් පල**

1. ලෝකයේ තේ වගාවේ ප්‍රධාන ලක්ෂණ හඳුන්වයි.
2. ලෝකයේ තේ වගාවේ ව්‍යාප්තිය සිතියමකින් දක්වයි.
3. තේ වගාව සම්බන්ධ ගැටලු හා ප්‍රවණතා විස්තර කරයි.

**ක්‍රියාකාරකම** - 5.3.6 ලෝකයේ තේ වගාව හඳුනා ගනිමු.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා ක්‍රමය
- ගවේෂණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. භූමිය පරිභෝග රටාවේ වාණිජ කෘෂිකර්මාන්තයක් ලෙස තේ වගාවට විශේෂ ස්ථානයක් හිමි වන බව අවබෝධ කර ගැනීම.
2. තේ වගාව ඉහළ ශ්‍රමික සංඛ්‍යාවකට ජීවනෝපාය සලසන බව අගය කිරීම

**ගුණාත්මක යෙදවුම්**

- ලෝකයේ තේ වගා කරන ප්‍රදේශ දැක්වෙන ලෝක සිතියමක්
- තේ වගාව පිළිබඳ සඳහන් ගීතයක් ඇතුළත් හඬ පටයක් (ගුරුවරයා විසින් සපයා දෙන්න)
- තේ කර්මාන්ත ශාලාවක ක්‍රියාකාරිත්වය දැක්වෙන වීඩියෝ දර්ශනය හා පින්තූර (ගුරුවරයා විසින් සපයා ගන්න)
- තේ වගාව ආශ්‍රිත පින්තූර

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

ලෝකයේ තේ වගාවේ ව්‍යාප්තිය, තේ වගාව සඳහා බලපාන සාධක, වගාවේ වැදගත්කම වැනි කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ. ගවේෂණ, සාකච්ඡා ක්‍රම හා ඉදිරිපත් කිරීම් මගින් මෙම පාඩමට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම සංවිධානය කර ඇත.

පියවර I

- තේ වගාව සම්බන්ධ ගීතය ඇසීමට සලස්වා ඒ පිළිබඳ සාකච්ඡා කරමින් තේ කර්මාන්ත ශාලාවේ ක්‍රියාකාරිත්වය දැක්වෙන කෙටි වීඩියෝ දර්ශනය හා පින්තූර නැරඹීමට සලස්වන්න. ඒ මගින් සාකච්ඡාව මෙහෙය වන්න.

පියවර 11

පහත සඳහන් තොරතුරු සාකච්ඡාවට අදාළ කර ගන්න

- ලෝකයේ තේ කර්මාන්තයේ විකාශය
- තේ වගාවට අවශ්‍ය සාධක
- තේ කර්මාන්තයෙහි ඇති වැදගත්කම
- තේ කර්මාන්තය ආශ්‍රිත ප්‍රවණතා
- පුවත්පත් පෙළපොත සඟරා, ලෝක සිතියම් හා වීඩියෝ දර්ශන මගින් කරුණු ගවේෂණයට යොමු කර වන්න. ගවේෂණය කළ තොරතුරු අනුව භූමිකා රංගනයක්, නිර්මාණශීලි ක්‍රියාකාරකමක් සැකසීමට උපදෙස් දෙන්න.

පියවර 111

- ශිෂ්‍යයන් සැකසූ නිර්මාණය ඉදිරිපත් කරවීම
- ගවේෂණය කළ තොරතුරු පිළිබඳව අදහස් ලබා ගන්න.
- ශිෂ්‍යයන් ඉදිරිපත් කළ අදහස්වල ප්‍රබලතා දුබලතා පිළිබඳව සාකච්ඡා කරන්න.

පියවර IV

- පාඩම සාරාංශ කරමින් නිර්ණායක තහවුරු වන සේ ඇගයීමට ලක් කරන්න.
- මේ සඳහා සාකච්ඡාවක් / කෙටි ප්‍රශ්න යොදා ගන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- තේ වගාවේ විකාශය හා වැදගත්කම පිළිබඳව විස්තර කිරීම
- තේ වගා ව්‍යාප්තියට බලපාන සාධක පැහැදිලි කිරීම
- තේ වගාව සම්බන්ධ ප්‍රවණතා හා ගැටලු විස්තර කිරීම
- තේ වගාවෙන් ආර්ථිකයට ලැබෙන දායකත්වය පිළිබඳව අවබෝධයෙන් ප්‍රකාශ කිරීම
- ලෝකයේ තේ වගා ව්‍යාප්තිය ලෝක ආකෘති සිතියමකින් දක්වීම

**නිපුණතාව -** ලෝකයේ ප්‍රධාන කෘෂි කාර්මික ක්‍රම විමර්ශනය කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික ක්‍රමවල ගති ලක්ෂණ පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. ලෝකයේ රබර් වගාවේ ලක්ෂණ විස්තර කරයි.
2. රබර් වගාවේ වැදගත්කම පැහැදිලි කරයි.
3. රබර් වගාවේ ලෝක ව්‍යාප්ති සිතියමකින් දක්වයි.

**ක්‍රියාකාරකම -** 5.3.7 "ලෝකයේ රබර් වගාව"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා ක්‍රමය
- ගවේෂණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. රබර් වගාව ආර්ථික ක්‍රියාවලියට ඉහළ දායකත්වයක් දක්වීම පිළිබඳ අගය කිරීම.
2. භෞතික පරිසරය ආරක්ෂා වන පරිදි පරිසර හිතකාමීව රබර් වගා කටයුතු සිදු කළ යුතු බව අවබෝධ කර ගැනීම.
3. කෘත්‍රිම රබර් නිසා හානිකර බලපෑම් සිදු වන බව වැටහීම.

**ගුණාත්මක යෙදවුම්**

- ලෝකයේ රබර් වගා ව්‍යාප්තිය දැක්වෙන සිතියමක්
- රබර් කර්මාන්ත ශාලාවක වීඩියෝ පටයක් / ගුරුවරයා විසින් සපයා ගන්නා ලද පින්තූර රබර් ආශ්‍රිත නිෂ්පාදන දැක්වෙන පුවත්පත් සඟරාවලින් ලබා ගත් පින්තූර
- පුවත්පත්, සඟරාවලින් ලබා ගත් පින්තූර

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

ලෝක ආර්ථිකයෙහි රබර් වගාව හිමි කර ගන්නා වැදගත්කම - අවධාරණය වන සේ රබර් වගාවේ විකාශය, වගාවට අවශ්‍ය සාධක, ප්‍රවණතා ගැටලු හා ඒවාට විසඳුම් පිළිබඳව අවධානය යොමු කිරීම මෙම ක්‍රියාකාරකම සංවිධානය කරන්න.

**පියවර 1**

- රබර් වගා ව්‍යාප්තිය දැක්වෙන වීඩියෝ පටය පින්තූර ප්‍රදර්ශනය කර සාකච්ඡා ක්‍රමය මගින් පාඩමට ප්‍රවේශ වීම.

**පියවර 11**

උචිත පරිදි ශිෂ්‍යයන් කණ්ඩායම් කර ඉහත තේමා අනුව,

- පෙළපොත, පුවත්පත්, සඟරා, වීඩියෝ දර්ශන මගින් කරුණු ගවේෂණයට යොමු කරවන්න.
- ගවේෂණය කළ තොරතුරු අනුව රබර් වගාවේ විකාශය, වගාවට අවශ්‍ය සාධක ප්‍රවණතා හා ගැටලු ඊට විසඳුම් පිළිබඳ නිර්මාණාත්මක වාර්තාවක් සැකසීමට උපදෙස් දෙන්න.

**පියවර III**

- කණ්ඩායම් විසින් සැකසූ වාර්තා ඉදිරිපත් කරවන්න.
- කණ්ඩායම්/විසින් සැකසූ වාර්තා තොරතුරුවල ප්‍රබලතා හා දුබලතා පිළිබඳව සාකච්ඡා කරන්න.

**පියවර IV**

- පාඩම සාරාංශ කරමින් නිර්ණායක තහවුරු වන සේ ඇගයීමට ලක් කරන්න. මේ සඳහා වඩාත් ලිඛිත කෙටි ප්‍රශ්න යොදා ගන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- රබර් වගාවේ විකාශය හා වැදගත්කම විස්තර කිරීම
- රබර් වගාවේ ගැටලු හා ප්‍රවණතා පැහැදිලි කිරීම
- රබර් වගාවේ ව්‍යාප්තිය දැක්වෙන ලෝක සිතියමක් මගින් දැක්වීම
- තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම
- සහයෝගයෙන් කටයුතු කිරීම

## 5.4 ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත

**නිපුණතාව -** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරයි.

### හැඳින්වීම

මිනිසාගේ මැදිහත්වීමෙන් නිෂ්පාදන සාධක සමග ස්වභාවික සම්පත් හසුරවා මිනිස් අවශ්‍යතා සපුරා ලීමට හැකි නම් හෝ අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය නිෂ්පාදන කර්මාන්තයක් ලෙස හැඳින්වේ. විවිධ අමුද්‍රව්‍ය හා තාක්ෂණය භාවිතයෙන් කාර්මික භාණ්ඩ නිෂ්පාදනය කරයි.

කාර්මික නිෂ්පාදනවලට දීර්ඝ ඉතිහාසයක් ඇත. මානව ශිෂ්ටාචාරය ආරම්භ වූ යුගයේ සිට අද දක්වා මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා නිෂ්පාදනයට මිනිසුන් උනන්දු වී ඇත. මෙම ඒකකය මගින් තෝරා ගත් නිෂ්පාදන කර්මාන්ත කීපයක් පිළිබඳව අවධානය යොමු කෙරේ.

ඒවායේ ලක්ෂණ, ව්‍යාප්තිය, ප්‍රවණතා, ගැටලු, විසඳුම් පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහි දී සිදු වේ.








**නිපුණතාව -** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ තෝරා ගත් නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ප්‍රධාන ගති ලක්ෂණ විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව -** 01

**ඉගෙනුම් පල**

1. නිෂ්පාදන කර්මාන්ත යනු මොනවා දැයි විස්තර කරයි.
2. ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත කිහිපයක් නම් කරයි.
3. බුදුදහමෙහි කර්මාන්තවලට හිමි වූ ස්ථානය පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම -** 5.4.1 "ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත හඳුනා ගනිමු"

**ආකල්ප හා අගය පද්ධති**

1. සියලු කර්මාන්ත පරිසර හිතකාමී ලෙස පවත්වා ගෙන යා යුතු බව පිළිගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- ලෝකයේ කර්මාන්ත ව්‍යාප්තිය දැක්වෙන සිතියම්
- නිෂ්පාදන කර්මාන්තවල පින්තූර
- නිෂ්පාදන කර්මාන්ත පිළිබඳ තොරතුරු ඇතුළත් පොත් පත්, වාර්තා, සඟරා
- තෝරා ගත් එක් කර්මාන්තයක් පිළිබඳ වීඩියෝ දර්ශනයක්

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය හා කර්මාන්ත ස්ථානගත වීමට බලපාන සාධක අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයන් යොමු කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

කණ්ඩායම් ක්‍රමය මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය ව ඉගෙනුම් පල තහවුරු වන සේ ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රියාකාරකම සංවිධානය කර ඇත.

පියවර I

- තෝරා ගත් නිෂ්පාදන කර්මාන්තයක පින්තූරයක් ප්‍රදර්ශනය කරමින් ඒ මගින් ප්‍රශ්න විමසමින් පාඩමට ප්‍රවේශ වීම. ඒ සම්බන්ධව කෙටි සාකච්ඡාවක් මෙහෙය වන්න.

පියවර 11

- එම සාකච්ඡාව ඉදිරියට ගෙන යමින් පහත තේමාවලට අවධානය යොමු කරන්න.
- නිෂ්පාදන කර්මාන්ත හඳුන්වා දීම
- ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල විකාශනය
- නිෂ්පාදන කර්මාන්ත ලෝක ආර්ථිකයෙහි ඇති වැදගත්කම
- යහපත් කර්මාන්ත පිළිබඳව බුදු දහමෙහි දැක්වෙන විවිධ අදහස්

පියවර 111

ශිෂ්‍යයන් උචිත පරිදි කණ්ඩායම් කරමින්

- පෙළපොත
- පුවත්පත් සඟරා වාර්තා
- වීඩියෝ දර්ශන
- පින්තූර

මගින් ඉහත කාරණා සඳහා කරුණු සංවිධානයට යොමු කරන්න. අධ්‍යයනය කළ තොරතුරු අනුව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සැකසීමට උපදෙස් දෙන්න.

පියවර IV

- ශිෂ්‍යයන් සැකසූ නිර්මාණ ඉදිරිපත් කරවීම. කණ්ඩායම් වාර්තාවල තොරතුරු පිළිබඳ ප්‍රබලතා හා දුබලතා පිළිබඳ සාකච්ඡා කරන්න.

පියවර V

- පාඩම සාරාංශ කරමින් නිර්ණායක තහවුරු වන සේ ඇගැයීමට ලක් කරන්න. මේ සඳහා කෙටි ප්‍රශ්න යොදා ගන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- නිෂ්පාදන කර්මාන්තවල විකාශනය හා වැදගත්කම පිළිබඳව විස්තර කිරීම
- බුදු දහමෙහි දක්වා ඇති යහපත් කර්මාන්ත පිළිබඳව අවබෝධයෙන් සාකච්ඡා කිරීම
- ලෝක ආර්ථිකයෙහි නිෂ්පාදන කර්මාන්තවල වැදගත්කම හා ප්‍රයෝජන විස්තර කිරීම
- නියමිත කාලයට අනුව ගුරු උපදෙස් පිළිපදිමින් කණ්ඩායම් ක්‍රියාකාරකම් සිදු කිරීම
- නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීම

**නිපුණතාව -** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ තෝරා ගත් නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ප්‍රධාන ගති ලක්ෂණ විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව -** 01

**ඉගෙනුම් පල** -

1. යකඩ හා වානේ කර්මාන්තයේ ලක්ෂණ පැහැදිලි කරයි.
2. යකඩ හා වානේ කර්මාන්තයේ ලෝක ව්‍යාප්තිය සිතියමකින් දක්වයි.
3. යකඩ හා වානේ කර්මාන්තය පරිසර හිතකාමී ව පවත්වා ගෙන යන ආකාරය විස්තර කරයි.

**ක්‍රියාකාරකම** - 5.4.2 "යකඩ හා වානේ කර්මාන්තය පිළිබඳ විමසමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා ක්‍රමය
- ගවේෂණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. කාර්මික නිෂ්පාදනය සඳහා යකඩ හා වානේ කර්මාන්තය මූලික තැනක් ගන්නා බව අගය කිරීම
2. බුදු දහම යහපත් කර්මාන්ත අවධාරණය කර ඇති බව වටහා ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- ලෝකයේ යකඩ හා වානේ කර්මාන්තවල ව්‍යාප්ති සිතියම
- යකඩ හා වානේ කර්මාන්ත ශාලාවක පින්තූරයක්
- යකඩ හා වානේ කර්මාන්ත ශාලාවක ක්‍රියාකාරීත්වය දැක්වෙන වීඩියෝ පටයක් (සපයා ගන්න)
- පුවත්පත් සඟරා /වාර්තා

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

ලෝකයේ යකඩ හා වානේ කර්මාන්ත විකාශනය හා එම කර්මාන්තය පරිසර හිතකාමී ලෙස පවත්-වා ගෙන යාම. ඒ පිළිබඳ බුදු දහමෙහි දක්වා ඇති අදහස් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම ඒකකයෙන් අදහස් කෙරේ.

සාකච්ඡා හා ගවේෂණ ක්‍රම මගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම සංවිධානය කර ඇත.

**පියවර I**

- යකඩ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක වීඩියෝ දර්ශනයක් පින්තූර පෙන්වමින් එහි ඇති අවස්ථා විමසමින් පාඩමට ප්‍රවේශ වීම. ඒ මගින් යකඩ හා වානේ කර්මාන්තය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.

**පියවර 11**

සාකච්ඡාව ඉදිරියට ගෙන යමින් පහත තේමා පිළිබඳ අවධානය යොමු කරන්න.

යකඩ හා වානේ කර්මාන්තය

- විකාශනය
- වැදගත්කම
- ලක්ෂණ
- ගැටලු හා විසඳුම්
- ප්‍රවණතා

**පියවර 111**

ශිෂ්‍යයන් සුදුසු පරිදි ගවේෂණයට යොමු කරමින් මෙම තේමාවලට අනුව පහත මූලාශ්‍ර ඇසුරින් කරුණු ගොනු කිරීමට උනන්දු කරවන්න.

- පුවත්පත් සඟරා
- සිතියම්
- වීඩියෝ දර්ශන

ගවේෂණය කළ තොරතුරු ඇසුරින් තොරතුරු ගොනුවක් සැකසීමට උපදෙස් දෙන්න.

පියවර IV

- ශිෂ්‍යයන් සැකසූ තොරතුරු ගොනු ඉදිරිපත් කරවීම.
- ඉදිරිපත් කිරීම්වල ප්‍රබලතා දුබලතා පිළිබඳ කෙටි සමාලෝචනයක යෙදෙන්න.

පියවර V

- පාඩම සාරාංශ කරමින් නිර්ණායක තහවුරු වන සේ ඇගයීමට ලක් කරන්න. මේ සඳහා සුදුසු කෙටි ප්‍රශ්න යොදා ගන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- යකඩ හා වානේ කර්මාන්තයේ විකාශනය හා වැදගත්කම පිළිබඳව විස්තර කිරීම
- යකඩ හා වානේ කර්මාන්තය පරිසර හිතකාමී අයුරින් පවත්වා ගෙන යාම පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම
- යකඩ හා වානේ කර්මාන්තයේ ප්‍රවණතා හා ගැටලු විස්තර කිරීම
- ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදන කර්මාන්ත ව්‍යාප්තිය සිතියමකින් දැක්වීම
- නිර්මාණශීලී ව තොරතුරු ගොනු කර ඉදිරිපත් කිරීම

**නිපුණතාව -** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ තෝරා ගත් නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ප්‍රධාන ගති ලක්ෂණ විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව -** 01

**ඉගෙනුම් පල**

1. ලෝක ඇඟලුම් කර්මාන්තයේ ලක්ෂණ පරීක්ෂා කරයි.
2. ඇඟලුම් කර්මාන්තයට ලෝක ආර්ථිකයෙහි හිමි වන ස්ථානය පිළිබඳව අදහස් දක්වයි.
3. ඇඟලුම් කර්මාන්තයේ ලෝක ව්‍යාප්තිය සිතියමක් ඇසුරින් දක්වයි.

**ක්‍රියාකාරකම** - **5.4.3** "ලෝක ඇඟලුම් කර්මාන්තයේ වටිනාකම අගය කරමු"

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා ක්‍රමය
- ගවේෂණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ඇඟලුම් කර්මාන්තයේ වැදගත්කම අවබෝධ කර ගැනීම
2. ඇඟලුම් කර්මාන්තයෙන් නව රැකියා අවස්ථා නිර්මාණය වී ඇති බව පිළිගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- ලෝකයේ ඇඟලුම් කර්මාන්තය ව්‍යාප්තිය දැක්වෙන සිතියම
- ඇඟලුම් කර්මාන්තයේ විවිධ අවස්ථා දැක්වෙන පින්තූර
- ඇඟලුම් කර්මාන්ත ශාලාවක ක්‍රියාකාරිත්වය දැක්වෙන වීඩියෝ දර්ශන
- තේමාවට අදාළ තොරතුරු පොත්පත්, ලිපි, සඟරා

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත අතර ඇඟලුම් කර්මාන්තයේ වැදගත්කම හා විකාශනය හිමි ස්ථානය පිළිබඳ අවධානය යොමු කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

සාකච්ඡා ක්‍රමය මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරකම් මගින් ඉගෙනුම් පල තහවුරු වන සේ ඉගෙනුම් / ඉගැන්වීම් ක්‍රියාකාරකම සංවිධානය කරන්න. ඇඟලුම් කර්මාන්තය පිළිබඳ තොරතුරු රැස් කර ගෙන ඒමට පාඩමට පෙර ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

පියවර I

- ඇඟලුම් කර්මාන්තයට අදාළ ගීතයක්/උද්ධෘතයක්/පන්තියට ඇසීමට සලස්වා ඒ පිළිබඳ ප්‍රශ්න විමසමින් පාඩමට ප්‍රවේශ වීම. ඒ මගින් ඇඟලුම් කර්මාන්තය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.

පියවර 11

- සාකච්ඡාව ඉදිරියට පවත්වා ගෙන යමින් ඇඟලුම් කර්මාන්තයේ විකාශනය, වැදගත්කම ව්‍යාප්තිය, ලක්ෂණ, ගැටලු හා විසඳුම් ප්‍රවණතා පිළිබඳව ශිෂ්‍යයන් රැගෙන ආ තොරතුරු ද යොදා ගනිමින් අවධානය යොමු කරන්න.

පියවර III

ශිෂ්‍යයන්ට ඉහත තේමා සඳහා

- පුවත්පත් වාර්තා, සඟරා
- වීඩියෝ දර්ශන
- පින්තූර, සිතියම් මගින් කරුණු සංවිධානය කිරීමට උපදෙස් දෙන්න.

පියවර IV

- ගවේෂණය කළ තොරතුරු අනුව භූමිකා රංගනයක් වාර්තාවක් සැකසීමට උපදෙස් දෙන්න.
- සැකසූ ශිෂ්‍ය නිර්මාණ වාර්තා පන්තියට ඉදිරිපත් කරවන්න. සැකසූ වාර්තාවල ප්‍රබලතා හා දුබලතා සාකච්ඡා කරන්න.

පියවර V

- පාඩම සමාලෝචනය කරමින් නිර්ණායක තහවුරු වන සේ ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- ඇගලුම් කර්මාන්තයේ විකාශනය හා වැදගත්කම පිළිබඳව විස්තර කිරීම
- ඇගලුම් කර්මාන්තය ලෝක ආර්ථිකයෙහි දරන දායකත්වය පිළිබඳ අවබෝධයෙන් තොරතුරු ප්‍රකාශ කිරීම
- ඇගලුම් කර්මාන්තය ආශ්‍රිත ගැටලු හා ප්‍රවණතා පැහැදිලි කිරීම
- නිර්මාණශීලී ව තොරතුරු ඉදිරිපත් කිරීම
- නියමිත කාලයට අනුව ගුරු උපදෙස් පිළිපදිමින් කාර්යය නිම කිරීම

**නිපුණතාව -** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ තෝරා ගත් නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ප්‍රධාන ගති ලක්ෂණ විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව -** 01

**ඉගෙනුම් පල** -

1. මෝටර් රථ කර්මාන්තයේ ලක්ෂණ පරීක්ෂා කරයි.
2. මෝටර් රථ කර්මාන්තයේ ලෝක ව්‍යාප්තිය සිතියමකින් දක්වයි.
3. මෝටර් රථ කර්මාන්තය නව ප්‍රවණතා ඉදිරිපත් කරයි.
4. මෝටර් රථ කර්මාන්තය පරිසර හිතකාමී ලෙස කළ යුතු ආකාරය විස්තර කරයි.

**ක්‍රියාකාරකම** - **5.4.4** මෝටර් රථ කර්මාන්තය හඳුනා ගනිමු.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා ක්‍රමය
- ගවේෂණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. අතීතයේ සිට මිනිස් කටයුතු පහසු කර ගැනීම සඳහා විවිධ රථ නිෂ්පාදනය කර යොදා ගෙන ඇති බව අවබෝධ කර ගැනීම.
2. බොහෝ දියුණු රටවල් මෝටර් රථ නිෂ්පාදනයට යොමු වී ඇති බව පිළිගැනීම
3. පරිසර හිතකාමී මෝටර් රථ නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ ඇගයීම

**ගුණාත්මක යෙදවුම්**

- ලෝකයේ මෝටර් රථ කර්මාන්තය ව්‍යාප්ත ව ඇති රටවල් දැක්වෙන සිතියම
- මෝටර් රථ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක ක්‍රියාකාරිත්වය දැක්වෙන වීඩියෝ පටයක්
- විවිධ කාර්ය සඳහා යොදා ගන්නා මෝටර් රථවල පින්තූර

### පාඩම සංවර්ධනය සඳහා උපදෙස්

ලෝක නිෂ්පාදන කර්මාන්තයේ ප්‍රධාන අංගයක් ලෙස මෝටර් රථ කර්මාන්තය දැක්විය හැකිය. එහි විකාශනය වැදගත්කම මෙන්ම ස්ථානගත වීමට බලපෑ සාධක, ගැටලු හා ප්‍රවණතා ආදිය පිළිබඳ අවධානය යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

ප්‍රශ්නකරණය මගින් ඉගෙනුම් පල තහවුරු වන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම සංවිධානය කර ගන්න.

පියවර I

- විවිධ කාර්ය සඳහා යොදා ගන්නා මෝටර් රථවල පින්තූර පෙන්වා ඒ පිළිබඳ ප්‍රශ්න විමසමින් පාඩමට ප්‍රවේශ වීම. ඒ මගින් මෝටර් රථ කර්මාන්තය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 11

- සාකච්ඡාව ඉදිරියට ගෙන යමින් පහත තේමා පිළිබඳ අවධානය යොමු කරවන්න.
- මෝටර් රථ කර්මාන්තයේ විකාශනය, වැදගත්කම, ලක්ෂණ, ගැටලු හා විසඳුම් ප්‍රවණතා

පියවර III

- ශිෂ්‍යයන් උචිත පරිදි වෙන් කර ඉහත තේමා සඳහා
- පුවත්පත් සඟරා
- වීඩියෝ දර්ශන උපදෙස් මගින් කරුණු සංවිධානයට යොමු කරවන්න. ගවේෂණය කළ තොරතුරුවලට අදාළ ව වාර්තාවක් සැකසීමට උපදෙස් දෙන්න.

පියවර IV

- ශිෂ්‍යයන් සැකසූ වාර්තා ඉදිරිපත් කරවීම. එම වාර්තාවල ප්‍රබලතා දුබලතා පිළිබඳ සමාලෝචනය කරන්න.

පියවර V

- පාඩම සාරාංශ කරමින් ඉහත නිර්ණායක තහවුරු වන සේ ඇගයීමට ලක් කරන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- මෝටර් රථ කර්මාන්තයේ විකාශනය හා වැදගත්කම පිළිබඳ විස්තර කිරීම
- ලෝකයේ මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තය ව්‍යාප්ත ප්‍රදේශ ලෝක සිතියමක දැක්වීම
- ලෝක මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රවණතා හා ගැටලු විස්තර කිරීම
- පරිසර හිතකාමී මෝටර් රථ නිෂ්පාදනය කළ යුතු බව උනන්දුවෙන් ප්‍රකාශ කිරීම
- සහයෝගයෙන් කටයුතු කිරීම

**නිපුණතාව -** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරයි.

**නිපුණතා මට්ටම -** ලෝකයේ තෝරා ගත් නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ලක්ෂණ පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. විද්‍යුත් කර්මාන්තය හා එහි ලක්ෂණ පරීක්ෂා කරයි.
2. විද්‍යුත් කර්මාන්තයේ ලෝක ව්‍යාප්තිය සිතියමකින් දක්වයි.
3. විද්‍යුත් කර්මාන්තය නිසා දියුණු වූ විවිධ ක්ෂේත්‍ර විස්තර කරයි.

**ක්‍රියාකාරකම -** 5.4.5 "විද්‍යුත් කර්මාන්තයේ අසිරිය සොයා බලමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා ක්‍රමය
- ගවේෂණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. නිෂ්පාදන කර්මාන්ත අතුරින් විද්‍යුත් කර්මාන්තය මුල් තැනක් ගෙන ඇති බව අවබෝධ කර ගැනීම.
2. විද්‍යුත් උපකරණ නිෂ්පාදනයෙන් මිනිස් කටයුතු ඉතා පහසු වී හා කාර්යක්ෂම ඇති බව අගය කිරීම.

**ගුණාත්මක යෙදවුම්**

- ලෝකයේ විද්‍යුත් කර්මාන්තය බහුල ව සිදු කරන රටවල් දැක්වෙන සිතියම්
- විද්‍යුත් කර්මාන්ත ශාලාවක වීඩියෝ දර්ශනයක් / පින්තූර (ගුරුවරයා සපයා ගන්න)
- නිවෙස්වල ශිෂ්‍යයන් භාවිත කරන උපකරණ කිහිපයක ලැයිස්තුවක් / පින්තූර
- පුවත්පත් සඟරා

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

විද්‍යුත් කර්මාන්තයේ විකාශනය, වැදගත්කම හිමි ස්ථානය පිළිබඳ අවධානය යොමු කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

ශිෂ්‍ය කේන්ද්‍රීය ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම සංවිධානය කර ඇත.

**පියවර I**

නිවෙස්වල භාවිත කරන විද්‍යුත් උපකරණ ගැන විමසමින් ප්‍රශ්නකරණය මගින් පාඩමට පිවිසීම එහිදී විද්‍යුත් උපකරණ පිළිබඳව කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.

**පියවර II**

ඉහත සාකච්ඡාව තවදුරටත් ඉදිරියට ගෙන යමින් පහත තේමා සඳහා අවධානය යොමු කරවන්න. විද්‍යුත් කර්මාන්තයේ විකාශනය, වැදගත්කම, ලක්ෂණ, ගැටලු හා ප්‍රවණතා, හිමි ස්ථානය, විද්‍යුත් කර්මාන්තය නිසා කාර්යක්ෂම වූ විවිධ ක්ෂේත්‍ර

**පියවර III**

ශිෂ්‍යයන් උචිත පරිදි කණ්ඩායම් කරන්න. ඉහත තේමා සඳහා

- පෙළපොත
- පුවත්පත් සඟරා, වාර්තා
- වීඩියෝ දර්ශන
- පින්තූර

මගින් කරුණු ගවේෂණයට යොමු කරවන්න. ගවේෂණය කළ තොරතුරුවලින් නිර්මාණශීලි පෝස්ටරයක් සැකසීමට උපදෙස් දෙන්න.

**පියවර IV**

ශිෂ්‍යයන් සැකසූ පෝස්ටර් ඉදිරිපත් කරවීම හා ඒවායේ ප්‍රබලතා දුබලතා සමාලෝචනය කරන්න.

**පියවර V**

පාඩම සාරාංශ කරමින් නිර්ණායක තහවුරු වන සේ ඇගයීමට ලක් කරන්න. මේ සඳහා කෙටි ප්‍රශ්න ඇසීමේ ක්‍රමය අනුගමනය කරන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- විද්‍යුත් උපකරණවල වැදගත්කම විස්තර කිරීම
- විද්‍යුත් උපකරණ මිනිසුන්ගේ ප්‍රධාන අවශ්‍යතාවක් වී ඇති බව පිළිගෙන ඒ පිළිබඳ අදහස් හා විවිධ ක්ෂේත්‍ර දියුණු වූ බව දැක්වීම
- ලෝකයේ විද්‍යුත් උපකරණ නිපදවීම සඳහා ප්‍රසිද්ධියක් උසුලන රටවල් සිතියමක ලකුණු කිරීම
- වර්තමානයේ දී විද්‍යුත් අපද්‍රව්‍ය නිසා ගැටලු රාශියක් මතු වී ඇති බව පැහැදිලි කිරීම
- නිර්මාණශීලි ඉදිරිපත් කිරීම් සිදු කිරීම

## 5.5 ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත

**නිපුණතාව** - 5

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කරයි.

**හැඳින්වීම**

භූමිය සමග බැඳී පවතින විවිධ මිනිස් කටයුතු භූමි පරිභෝග ලෙස හඳුන්වයි. විශේෂයෙන් ම කෘෂිකාර්මික කටයුතු සඳහා භූමිය පරිභෝජනය කිරීම කෘෂිකාර්මික භූමි පරිභෝගයයි. වසර 2500කට වැඩි කාලයක් තිස්සේ ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් ලෙස ප්‍රසිද්ධියක් ඉසිලී ය. විශේෂයෙන් ම සහලින් ස්වයං පෝෂිත ව තිබූ නිසා පෙරදිග ධාන්‍යාගාරය යන නමින් ද අප රට ව්‍යවහාර ව තිබුණි. ශ්‍රී ලංකාවේ බහුතරයක් මිනිසුන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ද කෘෂිකර්මය වේ. අතීතයේ සිට ම අපේ රටේ ජනතාවගේ ජීවන රටාවේ ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් ලෙස කෘෂිකර්මය හා කර්මාන්ත සැලකේ.

අතීතයේ අපේ රටේ ජනයා මුහුණ දුන් ප්‍රධාන අභියෝගයක් ද වූයේ යැපීම සඳහා ආහාර පාන නිෂ්පාදනය කර ගැනීමයි. මේ නිසාම කෘෂිකාර්මික අංශයේ සුවිශේෂී අවධානය "වී" වගාව සඳහා යොමු විය. ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ද ලැබුණු බව අතීත ශිලා ලිපිවලින් ද හෙළි වේ. එපමණක් නොව බුද්ධ දේශනාවේ ද විවිධ අවස්ථාවල දී "වී" ගොවිතැන හා සම්බන්ධ තොරතුරු ඇතුළත් ව තිබේ. ඒ එසේම "වී" වගාවේ දී තෙරුවන් මුල් කර ගෙන පැවැත්වෙන පුද පූජා, කිරි ආහාර පූජා, මෙන්ම දේව දාන අලුත් සහල් මංගල්‍යය ආදිය පිළිබඳව ද සිරිත් විරිත් ක්‍රියාත්මක වේ.

තවද බුදුන් වහන්සේ දේශනා කරන ලද කසීභාරද්වාජ සූත්‍රය, අග්ගඤ්ඤ සූත්‍රය, කූටදන්ත සූත්‍රය ආදී සූත්‍රයන්හි "වී" වගාව හා සම්බන්ධ තොරතුරු ඇතුළත් ව තිබේ. මේ අනුව පෙනී යන්නේ අතීතයේ ද ඉතා වටිනා ආර්ථික කටයුත්තක් ලෙස "වී" වගාව සැලකූ බවයි.

අතීතයේ සිට පැවත ආ සාම්ප්‍රදායික කෘෂිකර්මයට අමතරව නිදහසින් පසු වැවිලි භෝග කෘෂිකර්මය කෙරෙහි නැඹුරුවීමක් දක්නට ලැබුණි. විශේෂයෙන් ම අපනයනය පෙර දැරි කර ගත් තේ, රබර් හා පොල් යන ත්‍රිත්ව වැවිලි භෝග පදනම් කොට ගත් වැවිලි භෝග ආර්ථිකයක් මෙරට ප්‍රචලිත විය. එහෙත් පසුකාලීන ව මෙරට කෘෂිකාර්මික භූමි පරිභෝග ආශ්‍රිත ගැටලු ඇති වීමත් සමග සාම්ප්‍රදායික අපනයන කෙරෙහි පමණක් බලාපොරොත්තු තැබීම අසීරු විය. මේ නිසා ඊට අමතරව ශ්‍රී ලංකා රජය විසින් 60 දශකයෙන් පසුව සුළු අපනයන භෝග කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබීය.

එමෙන් ම තේ, පොල්, රබර් යන භෝග ආශ්‍රිත රැකියා හා එම භෝග පදනම් කොට ගත් අතුරු නිෂ්පාදන ඇති කිරීමත් සමග කෘෂිකාර්මික රැකියා ක්ෂේත්‍රයෙහි වර්ධනයක් ඇති විය.

මේ ආකාරයට සංවර්ධනය වූ කෘෂිකාර්මික භූමි පරිභෝගය ශ්‍රී ලංකාවේ අවශ්‍යතා සැපයීම මෙන්ම අපනයන ආදායමට ලබා දී ඇති දායකත්වය ද මෙමගින් පෙනී යයි.

අනෙකුත් ආර්ථික ක්ෂේත්‍රවලට නොදෙවෙනි ස්ථානයක් හා වටිනාකමක් කෘෂිකාර්මික භූමි පරිභෝග ආශ්‍රයෙන් ලැබීම නිසා මේ පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ. ආර්ථික කටයුතුවල යහපත් ලෙස නිරත වෙමින් අත් වන ප්‍රතිලාභ භුක්ති විඳීම ශ්‍රී ලාංකික පුරවැසියන් වන අප සතු වගකීමක් බව අවධාරණය කිරීම ද අපේක්ෂිත ය.



**නිපුණතාව** - ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම** - ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝගවල ස්වභාවය හා ගැටලු දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** . 01

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු කිහිපයක් නම් කරයි.
2. ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග නම් කර යැපුම් කෘෂිකර්මය හඳුන්වයි.
3. ශ්‍රී ලංකාවේ වී වගාව හා ඊට බලපාන සාධක ඉදිරිපත් කරයි.
4. ශ්‍රී ලංකාවේ වී වගාව අශ්‍රිත නව ප්‍රවණතා ගැටලු හා ඒවා විසඳුම් ඉදිරිපත් කරයි.
5. ශ්‍රී ලංකාවේ වී වගාවේ ව්‍යාප්තිය සිතියමකින් දක්වයි.

**ක්‍රියාකාරකම** 5.1.1 "ශ්‍රී ලංකාවේ ප්‍රධාන යැපුම් භෝගය පිළිබඳ තොරතුරු සොයමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- පිටු පෙරළනයක් සැකසීම

**ආකල්ප හා අගය පද්ධති**

1. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ සුවිශේෂ ස්ථානයක් "වී" වගාවට හිමි වන බව පිළිගැනීම.
2. යහපත් වෘත්තීය ආකල්ප "වී" ගොවිතැන ආශ්‍රයෙන් වැඩි දියුණු කළ හැකි බව අවබෝධ වීම.

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 5.1.1.1 කාර්ය පත්‍රිකාව
- 5 ශ්‍රේණිය පෙළපොත
- ගංගා නිම්න දක්වෙන ශ්‍රී ලංකා සිතියම් (අවශ්‍ය පමණ)
- වී වගාව ආශ්‍රිත පින්තූර / තොරතුරු

- ඩිමයි කොළ
- විවිධ වර්ණ ෆෙල්ට් පැන්
- ගම් ටේප් ආදිය

### පාඩම සංවර්ධනය සඳහා උපදෙස්

ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් ම නිෂ්පාදනය හා පරිභෝජනය කරන ධාන්‍ය වර්ගය ලෙස "වී" ප්‍රධාන වේ. ඒ සඳහා මෙරට භූගෝලීය පසුබිම හා මානව සාධක ඉවහල් වී ඇත. "වී" වගාව ආශ්‍රිත මූලික තොරතුරු අධ්‍යයනය කර පිටු පෙරළනයක් සකස් කර ඉදිරිපත් කිරීම අපේක්ෂා කරයි.

පියවර 1

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගා කටයුතු මොනවා දැයි ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. ඒ අනුව ප්‍රධාන වගාවන් පිළිබඳ කරුණු මතු කර ගන්න. පාරිභෝගික වගාවක් ලෙස වී වගාව ඉගෙනීමේ වැදගත්කම මතු කර ගන්න

පියවර 2

- ශ්‍රී ලංකාවේ "වී" වගාවට අවශ්‍ය සාධක පිළිබඳවත්, වී වගාව බහුල ලෙස ව්‍යාප්ත ව ඇති ප්‍රදේශ පිළිබඳවත් වර්තමානයේ වී වගාව ආශ්‍රිත ව පැන නැගී ඇති ගැටලු පිළිබඳවත් ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- මෙහි දී 5 ශ්‍රේණිය පෙළපොත පිටු අංක70,71,72,73 පරිශීලනය සඳහා ශිෂ්‍යයන් යොමු කරන්න.

පියවර 3

- පිටු පෙරළනයක් සකස් කර තොරතුරු ඉදිරිපත් කරන ආකාරය පිළිබඳවත් දැනුවත් කරන්න.
- පන්තියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඔබට අභිමත පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමක් සඳහා ම ඇමුණුම 5.1.1.1 ලබා දෙන්න.
- ගුණාත්මක යෙදවුම් ලබා දෙන්න.
- ඇගයීම් නිර්ණායක පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- පිටු පෙරළනය සකස් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.

පියවර 4

- තම කණ්ඩායම්වල නිමැයුම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වල අදහස් හා යෝජනා දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 5

- සියලු කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු සමාලෝචනය කර අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- වී වගාවේ සාර්ථකත්වයට අදාළ සාධක ඉදිරිපත් කිරීම
- වී වගාව ආශ්‍රිත නව ප්‍රවණතා පැහැදිලි කිරීම
- වී වගාවට බලපාන ගැටලු හා ඊට විසඳුම් යෝජනා කිරීම
- නිර්මාණාත්මක පිටු පෙරළනයක් සකස් කිරීම
- කණ්ඩායම් හැඟීමෙන් යුතු ව කටයුතු කිරීම

ඇමුණුම 5.1.1.1

**කාර්ය පත්‍රිකාව**

i "වී" වගාවේ දර්ශනීය අවස්ථාවක් චිත්‍රයට නගන්න.

ii ශ්‍රී ලංකාවෙ "වී" වගාවේ සාර්ථකත්වයට බලපා ඇති සාධක ඉදිරිපත් කරන්න.

iii වී වගාව ව්‍යාප්තිය ගංගා නිම්න ඇතුළත් සිතියමෙහි සේයාකාර ඉදිරිපත් කරන්න.

iv වී වගාව ආශ්‍රිත පැන නැඟී ඇති ගැටලු හා ඒවාට ගත හැකි සුදුසුම විසඳුම් ද මොනවා දැයි දක්වන්න.

**නිපුණතාව** - .ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම** ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ගවල ස්වභාවය හා ගැටලු දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** . 01

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ භෝග වර්ග නම් කරයි.
2. වාණිජ භෝග සඳහා යෝග්‍ය සාධක සාකච්ඡා කරයි.
3. ප්‍රධාන වෙළෙඳ භෝගවල ආර්ථික වටිනාකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
4. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික භෝගවල ව්‍යාප්තිය ආකෘති සිතියම් මගින් ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම** 5.1.2 "ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ භෝග පිළිබඳ තතු සොයමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා මණ්ඩපයක්

**ආකල්ප හා අගය පද්ධති**

1. විවිධ භෝග වගාවන් සඳහා යෝග්‍ය වූ සුවිශේෂ භෞතික පරිසරයක් අප රට සතුව පැවතීම පිළිබඳ අභිමානයෙන් අගය කිරීම
2. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ භෝගවල ආර්ථික වැදගත්කමක් ඇති බව පිළිගැනීම
3. ධාර්මික ධනෝපායන මාර්ගයක් ලෙස කෘෂිකර්මයෙහි ඇති වටිනාකම අගය කිරීම

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ පට (තේ, රබර්, පොල් වගාවන් දක්වෙන ප්‍රදේශ මෙන්ම එක් එක් භෝග වගාවන් ආශ්‍රිත පර්යේෂණ ආයතනවල මැදිහත් වීම දක්වෙන ගුරුවරයා විසින් සකස් කර ගන්න)
- වාණිජ භෝග පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපි, සඟරා
- ඇමුණුම් 5.1.2.1 කාර්ය පත්‍රිකා 1,2,3
- ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් මායිම් සහිත සිතියම් (අවශ්‍ය පමණ)

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

ශ්‍රී ලංකාවේ තේ, රබර්, පොල් මෙරට දේශීය පරිභෝජනය සඳහා මෙන්ම වෙළෙඳ භෝග ලෙස අතීතයේ සිට ම වැදගත් තැනක් උසුලයි. මෙම භෝග වර්ගවල ආරම්භය හා ඓතිහාසික වැදගත්කම පිළිබඳවත්, භෝගයන්ගේ සාර්ථකත්වයට බල පෑ සාධක පිළිබඳවත් මෙම වගාවන් වර්තමානයේ මුහුණ පා ඇති ගැටලු හා මෙවායේ ව්‍යාප්තිය පිළිබඳවත් සාකච්ඡා මණ්ඩපයක් ඇසුරින් තොරතුරු සාකච්ඡා කිරීම අපේක්ෂා කෙරේ.

පාඩම ආරම්භ කිරීමට සතියකට පමණ පෙර සාකච්ඡා මණ්ඩපයක් ඇසුරින් පාඩම සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන බව පන්තියේ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් තුනකට බෙදා කාර්ය පත්‍රිකා කණ්ඩායම් සඳහා ලබා දී ඔවුන්ගේ කැමැත්ත පරිදි මාතෘකා බෙදා ගෙන සූදානම් වීමට උපදෙස් දෙන්න.

කණ්ඩායම් තුනක් සඳහා ශිෂ්‍යයන් නොමැති නම් එක් කණ්ඩායමක් සඳහා වට තුනක් වන සේ කාර්යපත්‍රිකා තුන යොදා ගන්න.

සාකච්ඡා මණ්ඩපය පවත් වන දිනය දැනුම් දෙන්න.

සාකච්ඡා මෙහෙය වීම සඳහා ශිෂ්‍යයකු හෝ ගුරුභවතා සම්බන්ධ වන්න.

**පියවර 1**

සාකච්ඡා මණ්ඩපය ආරම්භ කිරීමට පෙර ගුරුභවතා පාඩම සඳහා ප්‍රවේශ වන්න.

ප්‍රවේශය සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග දැක්වෙන වීඩියෝ පටය දර්ශනය වීමට සලස්වන්න.

**පියවර 2**

එහි ඇතුළත් භූමි පරිභෝග වර්ග හා ඒවායේ උන්නතිය පිළිබඳ සාකච්ඡා කරන්න.

- අනතුරුව තේ රබර් හා පොල් වගා ආශ්‍රිත පැන නැගී ඇති ගැටලු හා එක් එක් භෝග බහුල ලෙස ව්‍යාප්ත දිස්ත්‍රික්ක පිළිබඳ සාකච්ඡා කරන්න.
- මෙහි දී පෙළපොත පිටු අංක 75-.80 දක්වා පරිශීලනය කිරීමට උපදෙස් දෙන්න.
- මේ පිළිබඳ තොරතුරු තව දුරටත් ගෙන ඒමට සාකච්ඡා මණ්ඩපයෙන් සිදු කිරීමට උපදෙස් දෙන්න.

**පියවර 3**

- පෙර සූදානම් කර ගත් තොරතුරු සමගින් සාකච්ඡා මණ්ඩපය පවත්වා ගෙන යාමට ශිෂ්‍යයන් අසුන් ගත කර වන්න.
- එක් අයකු විසින් මෙහෙයවමින් තොරතුරු සාකච්ඡා කරන්න.

පියවර 4

- අවසානයේ ශිෂ්‍යයන්ගේ අදහස් ඌනපූරණය කරමින් සමාලෝචනයක යෙදෙන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- ශ්‍රී ලංකාවේ වෙළෙඳ බෝග පිළිබඳ ප්‍රමාණවත් කරුණු එක් රැස් කිරීම
- ශ්‍රී ලංකාවේ වෙළෙඳ බෝගවල ආර්ථික වැදගත්කම සාකච්ඡා කිරීම
- ශ්‍රී ලංකාවේ වෙළෙඳ බෝගවල ව්‍යාප්තිය සිතියම් ගත කිරීම
- ධාර්මික වගාවන් කිරීමේ ප්‍රතිඵල අගය කිරීම
- සහයෝගයෙන් කටයුතු කිරීම

ඇමුණුම 5.1.2.1

**කාර්ය පත්‍රිකාව 01**

ඔබට පැවරෙන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූමි පරිභෝග වර්ගයක් ලෙස "පොල්" වගාව සම්බන්ධයෙන් පහත මාතෘකාවලට අදාළ ව සාකච්ඡාවට සහභාගි වීමයි.

- ⋆ ආරම්භය හා ඓතිහාසික වැදගත්කම
- ⋆ "පොල්" වගාවේ වර්තමාන පසුබිම
- ⋆ "පොල්" වගාවේ සාර්ථකත්වයට බලපාන සාධක
- ⋆ "පොල්" වගාව ආශ්‍රිත ගැටලු හා ඒවාට විසඳුම්
- ⋆ "පොල්" වගාව දියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග
- ⋆ "පොල්" වගාවේ ව්‍යාප්තිය ශ්‍රී ලංකා දිස්ත්‍රික්ක ඇසුරින් පෙන්වන්න.

**කාර්ය පත්‍රිකාව 02**

ඔබට පැවරෙන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූමි පරිභෝග වර්ගයක් ලෙස "තේ" වගාව සම්බන්ධයෙන් පහත මාතෘකාවලට අදාළ ව සාකච්ඡාවට සහභාගි වීමයි.

- ★ ආරම්භය හා ඓතිහාසික වැදගත්කම
- ★ "තේ" වගාවේ වර්තමාන පසුබිම
- ★ "තේ" වගාවේ සාර්ථකත්වයට බලපාන සාධක
- ★ ශ්‍රී ලංකාවේ "තේ" කර්මාන්තය ආශ්‍රිත ගැටලු හා ඒවාට විසඳුම්
- ★ "තේ" වගාව දියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග
- ★ "තේ" වගාවේ ව්‍යාප්තිය ශ්‍රී ලංකා දිස්ත්‍රික්ක සිතියමක් ඇසුරින් පෙන්වන්න.

**කාර්ය පත්‍රිකාව 03**

ඔබට පැවරෙන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූමි පරිභෝග වර්ගයක් ලෙස "රබර්" වගාව සම්බන්ධයෙන් පහත මාතෘකාවලට අදාළ ව සාකච්ඡාවට සහභාගි වීමයි.

- ★ ආරම්භය හා ඓතිහාසික වැදගත්කම
- ★ "රබර්" වගාවේ වර්තමාන පසුබිම
- ★ "රබර්" වගාවේ සාර්ථකත්වයට බලපාන සාධක
- ★ "රබර්" වගාව ආශ්‍රිත ගැටලු හා ඒවාට විසඳුම්
- ★ "රබර්" වගාව දියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග
- ★ ශ්‍රී ලංකාවේ රබර් වගාවේ ව්‍යාප්තිය ශ්‍රී ලංකා දිස්ත්‍රික් සිතියමක සේයා කර ඉදිරිපත් කරන්න

**නිපුණතාව** - . ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කරයි.

**නිපුණතාව මට්ටම** - . ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ගවල ස්වභාවය හා ගැටලු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** . 01

**ඉගෙනුම් පල -**

1. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සුළු අපනයන භෝග වර්ග උදාහරණ ඇසුරින් පැහැදිලි කරයි.
2. සුළු අපනයන භෝග ආශ්‍රිත ගැටලු හා ඒවාට විසඳුම් යෝජනා කරයි.
3. ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝගවල ව්‍යාප්තිය සිතියමකින් දක්වයි.

**ක්‍රියාකාරකම** . **5.1.3** සුළු අපනයන භෝගවල වැදගත්කම සොයා බලමු

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්

**ආකල්ප හා අගය පද්ධති**

1. ශ්‍රී ලංකාවේ කෘෂි අපනයන අතර සුළු අපනයන භෝග සඳහා වැදගත් තැනක් හිමි වන බව පිළිගැනීම.
2. අතීතයේ සිට ම වෙළෙඳ භාණ්ඩයක් ලෙස සුළු අපනයන භෝග සඳහා විදේශීය වෙළෙඳපොළෙහි ඉහළ වටිනාකමක් තිබෙන බව අගය කිරීම.

**ගුණාත්මක යෙදවුම්**

- ජාතික සිතියම් සංග්‍රහය (පාසල් මුද්‍රණය 2014)
- වීඩියෝ පට (සුළු අපනයන භෝග සම්බන්ධව)

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග අතර සුළු අපනයන භෝග සඳහා ද වැදගත් තැනක් හිමි වේ. දූපත් රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව විදේශීය අවධානයට පාත්‍රවීමට එක් හේතුවක් ද වූයේ මෙරට තිබෙන සුළු අපනයන භෝග වගාවයි. වෙළෙඳ භෝගවලට අමතරව සුළු ප්‍රමාණයකින් සුළු අපනයන භෝග වගා කළ ද විදේශීය විනිමය ලබා ගැනීම හා රැකියා අවස්ථා සම්පාදනය වැනි හේතු මත වැදගත් ආර්ථික කටයුත්තක් ලෙස හඳුනාගත හැකි ය.

මේ නිසා සුළු අපනයන භෝග පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීම ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

**පෙර සූදානමට උපදෙස්**

- ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග පිළිබඳ පාඩම අධ්‍යයනය කිරීම සඳහා ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනක පවත් වන බව පෙර දිනයක දී ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- ඒ සඳහා සෑම ශිෂ්‍යයෙකු ම සහභාගී කර වන බැවින් පාඩම හොඳින් අධ්‍යයනය කර සිටීමට උපදෙස් දෙන්න.
- පන්තියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව සලකා බලා සම්පූර්ණ පාඩම ආවරණ වන පරිදි ප්‍රමාණවත් ප්‍රශ්න සංඛ්‍යාවක් සකස් කර පිළිතුරු ලියාගෙන පැමිණීමට එක් එක් ශිෂ්‍යයාට කොටස් භාර දෙන්න.
- ශිෂ්‍යයන් රැගෙන එන ප්‍රශ්න සංස්කරණය කර ප්‍රශ්න සංචිතයක් සකස් කර ප්‍රශ්න විචාරත්මක තරගය සඳහා යොදා ගන්න.
- ප්‍රමාණවත් ප්‍රශ්න සංඛ්‍යාවක් නොමැති නම් ඉගෙනුම් පල අත්පත් කර ගත හැකි ආකාරයට තව දුරටත් ප්‍රශ්න කිහිපයක් එකතු කරන්න.
- ප්‍රශ්න විචාරාත්මක තරගයට පෙර දින ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදන්න.

**පියවර 1**

- ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන ක්‍රියාත්මක කරන ආකාරය ලකුණු පිරිනමන ආකාරය පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

**පියවර 2**

- සෑම ශිෂ්‍යයෙකුට අවම වශයෙන් එක් ප්‍රශ්නයකටවත් පිළිතුරු ලබා දීමට අවස්ථාව දෙන්න.
- ශිෂ්‍ය සංඛ්‍යාව අඩු නම් වට කිහිපයක් පවත්වන්න.

**පියවර 3**

- තරගය අවසානයේ ලකුණු පිරිනමන්න
- පිළිතුරුවල ප්‍රබලතා දුබලතා සාකච්ඡා කරන්න. නිර්ණායක මත කණ්ඩායම් ලකුණු පවරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- සුළු අපනයන බෝග ඇසුරින් පැහැදිලි ව /නිවැරදි ව ප්‍රශ්න සකස් කිරීම
- ප්‍රශ්නවලට අදාළ ව නිවැරදි පිළිතුරු කිරීම
- කණ්ඩායම්වල සක්‍රීය ව සහභාගීත්වයක් දැක්වීම
- උනන්දුවෙන් තරගයේ නිරත වීම
- ජයග්‍රහණය / පරාජය යහපත් ලෙස පිළිගැනීම

**නිපුණතාව** - ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම** - ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ගති ලක්ෂණ ගැටලු හා විසඳුම් විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ කෘෂිපාදක කර්මාන්ත කිහිපයක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
2. කෘෂිපාදක කර්මාන්තවල වැදගත්කම ප්‍රකාශ කරයි.
3. ශ්‍රී ලංකාවේ කෘෂිපාදක කර්මාන්ත ව්‍යාප්තිය සිතියමකින් දක්වයි.

**ක්‍රියාකාරකම** 5.2.1 "කෘෂිපාදක කර්මාන්ත හඳුනා ගනිමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- නිර්මාණශීලී ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා අගය පද්ධති**

1. කෘෂිපාදක කර්මාන්තවලින් යහපත් ප්‍රතිලාභ ශ්‍රී ලංකාවට ලැබෙන බව අගය කිරීම.
2. අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ කෘෂි පාදක කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන විදේශ රටවල අවධානයට යොමු වීම පිළිබඳ අභිමානයක් ඇති කර ගැනීම.
3. කෘෂිපාදක කර්මාන්ත හා සම්බන්ධ වගාවන් ශ්‍රී ලංකාවේ සුන්දරත්වය මෙන්ම ස්වභාව ධර්මය ද ආරක්ෂා කරන බව පිළිගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ පටය (තේ, රබර්, පොල් යන වගාවන්හි ව්‍යාප්තිය පෙන්වීම හා එම වගාවන් ආශ්‍රිත ව කෙරෙන ‍ක්‍රියා අවස්ථා පෙන්නුම් කෙරෙන)
- ඇමුණුම අංක 5.2.1.1 කාර්ය පත්‍රිකා 1,2,3
- ෆෙල්ට් පෑන්, ඩිමයිකොළ, සිතියම් පොත්

## පාඩම සංවර්ධනය සඳහා උපදෙස්

මෙම ශ්‍රේණියේ දී අධ්‍යයනය කිරීම සඳහා තෝරා ගත් කෘෂිපාදක කර්මාන්ත ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැවිලි භෝග මත පදනම් ව තිබේ. මෙම භෝගයන් ආශ්‍රිත ව කරන නිෂ්පාදන වර්ග, එම නිෂ්පාදනයන් කෙරෙන කර්මාන්ත ව්‍යාප්ති ප්‍රදේශ පිළිබඳව අධ්‍යයනය කර ඉදිරිපත් කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ. ශිෂ්‍ය "ඉදිරිපත් කිරීම්" තේවල ලෙස හෝ කණ්ඩායමක් ලෙස හෝ ඉදිරිපත් කළ හැකි ය.

පියවර 1

- ඔබ සකස් කර ගත් ලබා දුන් වීඩියෝ පටයේ දර්ශන නැරඹීමට සලස්වන්න.
- වීඩියෝ දර්ශන පිළිබඳ මතකය අවධි කරමින් කෘෂිපාදක කර්මාන්තය යන්න පිළිබඳ ශිෂ්‍යයන් සමග අර්ථකථනයක් ගොඩනගන්න.

පියවර 2

- තේ, රබර් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡාවේ යෙදෙන්න.
- එම නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත ව්‍යාප්ති ප්‍රදේශ පිළිබඳවත් ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- පන්තියේ ශිෂ්‍යයන් කණ්ඩායම් තුනකට බෙදන්න.
- එක් එක් කණ්ඩායම සඳහා කාර්ය පත්‍රිකා එක බැගින් බෙදා දෙන්න.
- ගුණාත්මක යෙදවුම සපයා ගැනීමට උපදෙස් දෙන්න.
- ක්‍රියාකාරකම පිළිබඳ ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- ශිෂ්‍යයන් අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් කරමින් තොරතුරු රැස් කිරීමට උපදෙස් දෙන්න.
- පෙළපොත පිටු අංක 88,89,90 අධ්‍යයනය කිරීමට යොමු කරන්න.
- තක්සේරු හා ඇගයීම් නිර්ණායක පිළිබඳව ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

පියවර 3

- ක්‍රියාකාරකම පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉදිරිපත් කිරීම් පිළිබඳව අනෙකුත් කණ්ඩායම්වල අදහස් විමසන්න.
- ප්‍රබලතා හා දුබලතා පෙන්වා දෙමින් සාකච්ඡාවක යෙදෙන්න.
- එම තොරතුරු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රදර්ශනය කරන්න.
- ඇගයීම් නිර්ණායක අනුව ලකුණු පවරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- කෘෂිපාදක කර්මාන්ත පිළිබඳ හැඳින්වීම
- එක් එක් කර්මාන්තවලට අදාළ නිෂ්පාදන වර්ග හඳුන්වා දීම
- කෘෂි නිෂ්පාදන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව විදේශීය රටවල් අතර හොඳ නමක් දිනා ගෙන ඇති බව ප්‍රකාශ කිරීම
- කර්මාන්තවලට අදාළ ව්‍යාප්ති ප්‍රදේශ ශ්‍රී ලංකා සිතියමක් ඇසුරින් දැක්වීම
- තොරතුරු නිවැරදි ව හා පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීම

ඇමුණුම 5.2.1

**කාර්ය පත්‍රිකාව 01**

ඔබ/ඔබ කණ්ඩායම විසින් කළ යුතු කාර්ය පහත දැක්වේ. ඒවා නිර්මාණශීලි ව ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

- කෘෂිපාදක කර්මාන්ත යනු කුමක් දැයි හඳුන්වන්න
- ඔබට ලබා දී ඇති ශ්‍රී ලංකා දිස්ත්‍රික් සිතියමෙහි තේ වගාව බහුල දිස්ත්‍රික්ක හඳුනාගෙන සේයාකර ඉදිරිපත් කරන්න.
- අවශ්‍ය අවස්ථාවල දී ගුරු තුමාගේ සහාය ලබා ගන්න.
- තේ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ව්‍යාප්ති ප්‍රදේශ හා නිෂ්පාදන වර්ග වගු ගත කර ඉදිරිපත් කරන්න.
- තේ වගාව නිසා මධ්‍යම කඳුකර ප්‍රදේශයේ දක්නට ඇති සුවිශේෂතා මොනවා ද?

**කාර්ය පත්‍රිකාව 02**

ඔබ/ඔබ කණ්ඩායම විසින් කළ යුතු කාර්ය පහත දැක්වේ. ඒවා නිර්මාණශිලි ව ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

- කෘෂිපාදක කර්මාන්ත යනු කුමක් දැයි හඳුන්වන්න
- ඔබට ලබා දී ඇති ශ්‍රී ලංකා දිස්ත්‍රික් සිතියමේ රබර් වගා බහුල දිස්ත්‍රික්ක සේයාකර නම් කරන්න.
- අවශ්‍ය අවස්ථාවල දී ගුරුතුමාගේ සහය ලබා ගන්න.
- රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ව්‍යාප්ත ප්‍රදේශ හා නිෂ්පාදන වර්ග වගු ගත කරන්න.
- රබර් වගාව ආශ්‍රිත පාරිසරික වැදගත්කම අගය කරන්න.

**කාර්ය පත්‍රිකාව 03**

ඔබ/ඔබ කණ්ඩායම විසින් කළ යුතු කාර්ය පහත දැක්වේ. ඒවා නිර්මාණශිලි ව ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

- කෘෂිපාදක කර්මාන්ත යනු කුමක් දැයි හඳුන්වන්න
- ඔබට ලබා දී ඇති ශ්‍රී ලංකා දිස්ත්‍රික් සිතියමේ පොල් වගා බහුල දිස්ත්‍රික්ක සේයාකර නම් කරන්න.
- අවශ්‍ය අවස්ථාවල දී ගුරුතුමාගේ සහය ලබා ගන්න.
- පොල් ආශ්‍රිත කර්මාන්ත ව්‍යාප්ත ප්‍රදේශ හා නිෂ්පාදන වර්ග වගු ගත කරන්න.
- පොල් වගාව නිසා වෙරළබඩ ප්‍රදේශයේ දක්නට ඇති සුවිශේෂතා මොනවා ද?

**නිපුණතාව** - ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම** - ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ගවල සවභාවය හා ගැටලු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ගැටලු ඉදිරිපත් කරයි.
2. කෘෂිබෝග ආශ්‍රිත ගැටලු සඳහා විසඳුම් යෝජනා කරයි

**ක්‍රියාකාරකම** 5.2.2 "ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ගැටලු හඳුනා ගනිමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- ප්‍රදර්ශනය

**ආකල්ප හා අගය පද්ධති**

1. ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරය ලෙස විරුදාවලි ලැබීම අගය කිරීම.
2. භව භෝග සම්පත් ආරක්ෂා කර ගනිමු. නාස්තිය පිටු දකිමු යන සංකල්ප අගය කිරීම

**ගුණාත්මක යෙදවුම්**

- කාර්යපත්‍රිකා
- ෆෙල්ට් පෑන්
- බ්‍රිස්ටල්බෝඩ්
- කාඩ් බෝඩ් (ඉවතලන) පෙට්ටි කිහිපයක්

**හැඳින්වීම** -

ශ්‍රී ලංකාවේ කෘෂිර්මාන්තය ආශ්‍රිත ව දක්නට ලැබෙන ගැටලු විවිධත්වයකින් හා නිර්මාණශීලි ව ඉදිරිපත් කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ. ප්‍රදර්ශන භාණ්ඩ ලෙස මෙන්ම කෘෂිකර්මාන්තය ආශ්‍රිත ගැටලු භූමිකා රංගන මගින් වුවද ප්‍රදර්ශනය කළ හැකි ය. මෙහිදී ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භෝග වගාවන් ආශ්‍රයෙන් පැන නැගී ඇති ගැටලු හඳුනා ගෙන ප්‍රදර්ශනය කිරීම අපේක්ෂා කෙරේ.

පාඩම සංවර්ධනය සඳහා උපදෙස්

පියවර 1

- ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත දක්නට ලැබෙන ගැටලු පෙර පාඩමේ සාකච්ඡා කළ ප්‍රධාන කෘෂිකාර්මික භෝග ඇසුරින් සාකච්ඡා කරන්න.
- එක් එක් භෝග වගාවන් සඳහා සුවිශේෂ වූ ගැටලු මෙන්ම ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත පොදු ගැටලු ද පවතින බව ශිෂ්‍යයන්ට පෙන්වා දෙන්න.
- ඉගෙන ගත් පාඩම ඇසුරින් හඳුනා ගත් ගැටලු නිර්මාණාත්මක ලෙස ඉදිරිපත් කිරීමට හෝ ප්‍රදර්ශන භාණ්ඩ සකස් කර පාසලේ ශිෂ්‍යයන්ට දැක බලා ගැනීමට ප්‍රදර්ශනයක් පැවැත්වීමට සූදානම් කරවන්න. නියමිත දිනයක් වෙන් කර ගැනීමට විදුහල්පති තුමා සමග ද සාකච්ඡා කර තීරණය කර ගන්න.

පියවර 2

- පන්තියේ ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට තොරතුරු සෙවීමට මාතෘකා ලබා දෙන්න.

  උදා : i කණ්ඩායම : ශ්‍රී ලංකාවේ 'වී' වගාව ආශ්‍රිත ගැටලු

  ii කණ්ඩායම : ශ්‍රී ලංකාවේ 'හේන්' ගොවිතැන ආශ්‍රිත ගැටලු
- සියලු ම කණ්ඩායම් සඳහා ඇමුණුම් අංක 01හි සඳහන් කාර්ය පත්‍රිකාව බැගින් ලබා දී අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබා දෙන්න.
- ඇගයීම් නිර්ණායක පිළිබඳව ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- අවශ්‍ය සම්පත් ලබා දෙන්න.

පියවර 3

- ප්‍රදර්ශන භාණ්ඩ සකස් කිරීමට ප්‍රමාණවත් කාල සීමාවක් ලබා දෙන්න.
- ප්‍රදර්ශන භාණ්ඩ සකස් කිරීම ඔබගේ අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ සිදු කරන්න.

පියවර 4

- ප්‍රදර්ශනය පවත්වන්න.
- ප්‍රදර්ශනය නැරඹීමේ දී පාසලේ ඉගෙනුම් ක්‍රියාවලියට බාධාවක් නොවන අයුරින් ශිෂ්‍යයන් සම්බන්ධ කිරීමට වගබලා ගන්න.
- ඇගයීම් නිර්ණායක අනුව ලකුණු පවරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිභෝග ආශ්‍රිත ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම
- එම ගැටලු සුවිශේෂ ව හා පොදු ලෙස වර්ග කිරීම
- මාතෘකාවලට අදාළ ව සත්‍ය හා නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීම
- ප්‍රදර්ශන උපකරණ නිසි පරිදි ස්ථාන ගත කිරීම
- කණ්ඩායම් හැඟීමෙන් යුතු ව ඉදිරිපත් කිරීම

ඇමුණුම 5.2.2.1

**කාර්ය පත්‍රිකාව**

- ඔබේ කණ්ඩායමට ලබා දෙන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික භෝග වගාව ආශ්‍රයෙන් ගැටලු නිරූපණය කරන ප්‍රදර්ශන භාණ්ඩ නිර්මාණය කරණ ස්වාභාවික දේ රැස් කරන්න.
- තොරතුරු ලබා ගැනීම සඳහා පෙළපොත පුවත්පත් සඟරා අන්තර් ජාලය භාවිත කරන්න.
- රැස් කළ තොරතුරු නිර්මාණශීලි ව හා විචිත්‍ර ව ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන්න. (වගු, ප්‍රස්තාර, චිත්‍ර, රූප සටහන් ආදී)
- ප්‍රදර්ශනය නරඹන්නන් සඳහා තොරතුරු විස්තර සහිත ව ඉදිරිපත් කරන්න.

**නිපුණතාව -** ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම -** ශ්‍රී ලංකාවේ තෝරා ගත් කර්මාන්ත කිහිපයක ගති ලක්ෂණ, ගැටලු හා විසඳුම් විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ කර්මාන්තවලට අදාළ තොරතුරු ඉදිරිපත් කරයි.
2. ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ගැටලු සාකච්ඡා කරයි.
3. ශ්‍රී ලංකාවේ කර්මාන්තවල ව්‍යාප්තිය සිතියමකින් දක්වයි.

**ක්‍රියාකාරකම** 5.2.3 "ශ්‍රී ලංකාවේ තෝරා ගත් කර්මාන්ත කිහිපයක් පිළිබඳව දැනුවත් වෙමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සඟරාවක් සැකසීම / ලිපි ගොනුවක් සැකසීම

**ආකල්ප හා අගය පද්ධති**

1. ශ්‍රී ලංකාවේ කර්මාන්ත ඇති කිරීම ආර්ථික සංවර්ධනයට හේතු වන බව හඳුනා ගැනීම
2. ශ්‍රී ලංකාවේ තෝරා ගත් කර්මාන්ත කිහිපයක් පිළිබඳව අවබෝධය ලැබීම

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම් අංක 5, 2, 3, 1 කාර්ය පත්‍රිකා 1, 2, 3, 4, 5, 6
- ශ්‍රී ලංකාවේ කර්මාන්ත ව්‍යාප්තිය දක්වෙන සිතියම
- කර්මාන්ත පිළිබඳ තොරතුරු දක්වෙන පොත්පත් සඟරා
- ලියන කඩදාසි

## පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රටකි. එහෙත් වර්තමානයේ කාර්මික ක්ෂේත්‍රයේ දායකත්වය ඉහළ මට්ටමක පවති. වසරින් වසර විවිධ කර්මාන්ත රාශියක් බිහි වී ඇත. ඒවා අතරින් තෝරා ගත් කර්මාන්ත කිහිපයක් පිළිබඳව මෙම ශ්‍රේණියේ දී අධ්‍යයනය කිරීමට සිදුවේ. ඇඟලුම්, කඩදාසි, ආකර පතල් කැණීම්, ආහාර පාන වර්ග යන කර්මාන්තවල ගති ලක්ෂණ ව්‍යාප්තිය ආශ්‍රිත තොරතුරු, කර්මාන්ත ආශ්‍රිත ගැටලු, මෙම කර්මාන්ත යහපත් පරිදි පවත්වා ගෙන යාමෙන් අත් වන ප්‍රතිලාභ ආදිය ඇතුළත් වන පරිදි සඟරාවක් / ලිපි ගොනුවක් පිළියෙළ කිරීම අපේක්ෂිත ය.

පෙර සූදානම්

- සඟරාව / ලිපි ගොනුව සකස් කර එළි දක්වන දිනය පිළිබඳව පළමුව ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- ඊට ඇතුළත් විය යුතු මාතෘකා පිළිබඳව තොරතුරු පන්ති කාමරයේ දී සාකච්ඡා කරන්න.
- වැඩි දුරටත් තොරතුරු සපයා ගැනීමට අදාළ මූලාශ්‍ර පිළිබඳව ශිෂ්‍යයන් දැනුවත් කරන්න.
- පෙළපොත, වෙනත් පොත් පත් හා සඟරා, අන්තර් ජාලය උපයෝගි කර ගෙන තොරතුරු රැස් කිරීමට ශිෂ්‍යයන්ට සහාය වන්න.
- තොරතුරු සපයා ගැනීමට අපහසු කොටස් පවතී නම් ගුරුභවතා විසින් ඒවා සපයා ගෙන ඇමුණුම් ලෙස පවත්වා ගෙන යන්න.
- උපදෙස් දීමට එක් කාල පරිච්ඡේදයක් ද සඟරාව හෝ ලිපි ගොනුව සැකසීමට අමතර කාලයක් ද යොදා ගන්න.

පියවර 1

- පන්තියේ ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමක් සඳහා ම කාර්ය පත්‍රිකා එක බැගින් ලබා දෙන්න.
- පන්තියේ ශිෂ්‍යයන් සංඛ්‍යාව අනුව කර්මාන්ත වර්ග සඳහා වෙන වෙන ම ශිෂ්‍යයන් කණ්ඩායම්වලට බෙදන්න.
- ගුරු භවතාගේ අභිමතය පරිදි හා පන්තියේ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව සෑම විෂය කොටසක් ම ආවරණය වන පරිදි සකස් කළ කාර්ය පත්‍රිකා බෙදා දීම කළ හැකි ය.

පියවර 2

- පාඩම සාකච්ඡා කිරීමේ දී ප්‍රවේශයක් ලෙස කර්මාන්ත පිළිබඳ වීඩියෝ දර්ශනය නැරඹීමට සලස්වන්න. මෙය හොඳින් අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 3

- පාඩම සාකච්ඡා කර අවසානයේ දී සඟරාව පිළියෙළ කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඒ සඳහා කරුණු, රැස් කර ගත් තොරතුරු ගොනු කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.

පියවර 4

- අවසාන දිනයේ දී පන්ති කාමරයේ දී කණ්ඩායම් රැස් කර ගත් තොරතුරු ගොනු කර සඟරාව සකස් කර එළි දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.

- පහත සඳහන් නිර්ණායක ඔස්සේ ලකුණු ලබා දෙන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- මාතෘකාවලට අදාළ ව කර්මාන්ත වර්ග කිරීම
- කර්මාන්ත අශ්‍රිත ව තොරතුරු ගැටලු ඉදිරිපත් කිරීම
- රැස් කළ තොරතුරු විවිධ ශිල්පීය ක්‍රම අනුව ඉදිරිපත් කිරීම
- සාමූහික හැඟීමෙන් යුතු ව කටයුතු කිරීම
- සඟරාවෙහි සමස්ත නිමාව

ඇමුණුම 5.2.3.1

**කාර්ය පත්‍රිකා අංක 01**

ඔබ හෝ ඔබ කණ්ඩායම විසින් කළ යුතු කාර්ය පහත දැක්වේ. 'තේ' කර්මාන්ත සම්බන්ධයෙන් රැස් කර ගත් සහ ඉගෙන ගත් තොරතුරු පහත සඳහන් මාතෘකාවලට අනුව සටහන් කරන්න.

- තේ කර්මාන්තයේ ගති ලක්ෂණ විස්තර කරන්න.
- තේ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන ලියන්න.
- තේ කර්මාන්තය බහුල ලෙස ව්‍යාප්ති ප්‍රදේශ ශ්‍රී ලංකා සිතියමක නිරූපණය කරන්න.
- තේ කර්මාන්තය ආශ්‍රිත ව පැන නැඟී ඇති ගැටලු සාකච්ඡා කරන්න.
- තේ කර්මාන්තය විධිමත් ලෙස පවත්වා ගෙන යාමෙන් අත් වන ප්‍රතිලාභ විස්තර කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 02**

ඔබ හෝ ඔබ කණ්ඩායම විසින් කළ යුතු කාර්ය පහත දැක්වේ. රබර් කර්මාන්තය සම්බන්ධයෙන් රැස් කර ගත් සහ ඉගෙන ගත් තොරතුරු පහත සඳහන් මාතෘකාවලට අනුව සටහන් කරන්න.

- රබර් කර්මාන්තයේ ගති ලක්ෂණ විස්තර කරන්න.
- රබර් කර්මාන්තය ආශ්‍රිත සැකසුම් දක්වන්න.
- රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ව්‍යාප්ත ප්‍රදේශ ශ්‍රී ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න.
- රබර් කර්මාන්තය ආශ්‍රිත ව ගැටලු සාකච්ඡා කරන්න.
- රබර් කර්මාන්තය විධිමත් ලෙස පවත්වා ගෙන යාමෙන් අත් වන ප්‍රතිලාභ විස්තර කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 03**

ඔබ හෝ ඔබ කණ්ඩායම විසින් කළ යුතු කාර්ය පහත දැක්වේ. පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය පිළිබඳව ඔබ උගත් හෝ තොරතුරු පහත සඳහන් මාතෘකාවලට අනුව සටහන් කරන්න.

- පොල් ආශ්‍රිත කර්මාන්තයේ ගති ලක්ෂණ විස්තර කරන්න.
- පොල් ආශ්‍රිත ආශ්‍රිත සැකසුම් දක්වන්න.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ව්‍යාප්ත ප්‍රදේශ ශ්‍රී ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න.
- පොල් කර්මාන්තය ආශ්‍රිත ව ගැටලු සාකච්ඡා කරන්න.
- පොල් ආශ්‍රිත කර්මාන්ත විධිමත් ලෙස පවත්වා ගෙන යාමෙන් අත් වන ප්‍රතිලාභ විස්තර කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 04**

ඔබ හෝ ඔබ කණ්ඩායම විසින් කළ යුතු කාර්ය පහත දැක්වේ. ඇඟලුම් කර්මාන්තය හා කඩදාසි කර්මාන්තය පිළිබඳව ඔබ ඉගෙන ගත් හා රැස් කර ගත් තොරතුරු පහත සඳහන් මාතෘකාවලට අනුව සටහන් කරන්න.

- ඇඟලුම් කර්මාන්ත හා කඩදාසි කර්මාන්තයේ ගති ලක්ෂණ විස්තර කරන්න.
- ඉහත කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන ලියා දක්වන්න.
- ඇඟලුම් කර්මාන්ත හා කඩදාසි කර්මාන්ත ව්‍යාප්ති ප්‍රදේශ ශ්‍රී ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න.
- ඉහත කර්මාන්ත ආශ්‍රිත ගැටලු සාකච්ඡා කරන්න.
- ඇඟලුම් කර්මාන්තය හා කඩදාසි කර්මාන්තය විධිමත් ලෙස පවත්වා ගෙන යාමෙන් අත් වන ප්‍රතිලාභ විස්තර කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 05**

ඔබ හෝ ඔබ කණ්ඩායම විසින් කළ යුතු කාර්ය පහත දැක්වේ. ආකර හා පතල් කැණීම් කර්මාන්තය පිළිබඳව ඔබ උගත් හෝ රැස් කර ගත් තොරතුරු පහත සඳහන් මාතෘකාවලට අනුව සටහන් කරන්න.

- ආකර හා පතල් කැනීම් කර්මාන්තයේ ගති ලක්ෂණ විස්තර කරන්න.
- ආකර හා පතල් සම්බන්ධ කර්මාන්ත නම් කරන්න.
- ඉහත සඳහන් කර්මාන්ත ව්‍යාප්ත ව පවතින ප්‍රදේශ ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.
- ආකර හා පතල් කර්මාන්තය ආශ්‍රිත ව ගැටලු ඉදිරිපත් කරන්න.
- ආකර හා පතල් ආශ්‍රිත කර්මාන්ත විධිමත් පරිදි පවත්වා ගෙන යාමෙන් අත් වන ප්‍රතිලාභ විස්තර කරන්න.

**කාර්ය පත්‍රිකා අංක 06**

ඔබ හෝ ඔබ කණ්ඩායම විසින් කළ යුතු කාර්ය පහත දැක්වේ. ආහාර පාන වර්ග කර්මාන්තය පිළිබඳව ඔබ උගත් හෝ රැස් කර ගත් තොරතුරු පහත සඳහන් මාතෘකාවලට අනුව සටහන් කරන්න.

- ආහාර හා පාන වර්ග ආශ්‍රිත කර්මාන්තයේ ගති ලක්ෂණ විස්තර කරන්න.
- ආහාර හා පාන වර්ග සම්බන්ධ කර්මාන්ත ව්‍යාප්ත ප්‍රදේශ ශ්‍රී ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න.
- ආහාර හා පාන වර්ග කර්මාන්තය අශ්‍රිත ගැටලු ඉදිරිපත් කරන්න.
- ආහාර හා පාන වර්ග ආශ්‍රිත කර්මාන්ත විධිමත් පරිදි පවත්වා ගෙන යාමෙන් අත් වන ප්‍රතිලාභ විස්තර කරන්න.

**නිපුණතාව** - ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග හා කර්මාන්ත පිළිබඳ අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම** - ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු සුබවාදී ව විසඳා ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික කටයුතු නම් කර වර්ග කරයි.
2. ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතුවලට අදාළ පොදු ගැටලු පිළිබඳ තොරතුරු වගු ගත කර ඉදිරිපත් කරයි.
3. ආර්ථික කටයුතු සම්බන්ධයෙන් පැන නැගි ඇති ගැටලු සඳහා තිරසාර විසඳුම් යෝජනා කරයි.

**ක්‍රියාකාරකම** 5.2.3 "ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතුවල ගැටලු සඳහා තිරසර යෝජනා ගෙන එමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- බිත්ති පුවත් පතක් සැකසීම

**ආකල්ප හා අගය පද්ධති**

1. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික කටයුතු පිළිබඳ අවබෝධය ලැබීම
2. ධාර්මික ව ආර්ථික කටයුතුවල යෙදීමෙන් සමාජ සාර්ධර්ම ආරක්ෂා වන බව පිළිගැනීම
3. ආර්ථික කටයුතු සම්බන්ධ ගැටලුවලට තිරසර විසඳුම් ලබා දිය හැකි බව පිළිගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු දැක්වෙන වීඩියෝ පට හෝ පින්තූර, සඟරා, පුවත්පත්, ඩිමයිකොළ, ෆෙල්ට් පෑන්
- ඇමුණුම් අංක 5.2.3.1 (කාර්ය පත්‍රිකාව)

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

**හැඳින්වීම**

ශ්‍රී ලංකා වාසීන්ගේ ආර්ථික කටයුතු හා ඒවාට බලපාන ගැටලු පිළිබඳව ශිෂ්‍යයින් දැනුවත් කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ. නිර්මාණශීලි ව බිත්ති පුවත්පත් සැකසීම අරමුණු වන අතර මෙහි කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශ ඔස්සේ විවිධ වූ ආර්ථික ක්‍රියාවන් පිළිබඳ තොරතුරු ඇතුළත් විය යුතු ය.

පාඩම ආරම්භ කිරීමට දින කිහිපයකට පෙර මාතෘකාව පිළිබඳ දැනුවත් කර ඒ පිළිබඳව පින්තූර හා ලිපි එකතු කර පාඩම කරන දිනට රැගෙන ඒමට උපදෙස් දෙන්න.

පියවර 1

- ශිෂ්‍ය සංඛ්‍යාව, ශිෂ්‍ය හැකියා අනුව අභිමත පරිදි කණ්ඩායම් කරන්න.
- ගුණාත්මක යෙදවුම් සෑම කණ්ඩායමක් සඳහා ම බෙදා දෙන්න.
- ඇගයීම් නිර්ණායක පිළිබඳව ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

පියවර 2

- වීඩියෝ පටය ආධාරයෙන් හෝ පින්තූර ඇසුරින් ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු දර්ශනය වීමට සලස්වන්න.
- අනතුරුව එම ආර්ථික කටයුතු කෘෂිකාර්මික, කාර්මික හා සේවා කර්මාන්ත වශයෙන් වර්ගීකරණය කර හඳුනා ගැනීමට ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න. එම ආර්ථික කටයුතු සම්බන්ධ ගැටලු සඳහා තිරසාර විසඳුම් සාකච්ඡා කරන්න
- ඒ අනුව සෑම ආර්ථික කටයුත්තක් ම කෘෂි කාර්මික, කාර්මික සහ සේවා යන අංශවලට අතුළත් වන බව පෙන්වා දෙන්න.

පියවර 3

- ඇමුණුම අංක 5.2.3.1 කාර්ය පත්‍රිකාව සෑම කණ්ඩායමක් සදහා ම බෙදා දෙන්න.
- ශිෂ්‍යයින් විසින් රැස් කර ගෙන ආ ආර්ථික කටයුතු දැක්වෙන පින්තූර හා ලිපි ප්‍රයෝජනයට ගනිමින් නිර්මාණශීලි ව බිත්ති පුවත්පත සැකසීමට අවස්ථාව ලබා දෙන්න.
- අවශ්‍ය මග පෙන්වීම් කරන්න.

පියවර 4

- කණ්ඩායම් සකස් කරන ලද බිත්ති පුවත් පත ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනිකුත් කණ්ඩායම්වලට ඉදිරිපත් කිරීම පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- නිර්ණායක අනුව කණ්ඩායමට ලකුණු ලබා දෙන්න.

පියවර 5

- කණ්ඩායම් ඉදිරිපත් කරන ලද බිත්ති පුවත් පතෙහි ප්‍රබලතා හා දුබලතා පෙන්වා දෙන්න.
- ඒ ඇසුරින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික කටයුතු පිළිබඳව සමාලෝචනයක් කරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු නම් කිරීම
- ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු වර්ග කිරීම
- ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු පිළිබඳ තොරතුරු නිර්මාණශිලී ව ඉදිරිපත් කිරීම
- කණ්ඩායමක් ලෙස කාර්ය ඉටු කිරීම සඳහා දායකත්වය ලබා දීම
- බිත්ති පුවත් පතෙහි සමස්ත නිමාව

**ඇමුණුම 5.2.3.1**

ඔබ කණ්ඩායමට පැවරෙන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු ඇතුළත් බිත්ති පුවත් පතක් සැකසීමයි. ඒ සඳහා ඔබේ කණ්ඩායම රැගෙන ආ පින්තූර හා ලිපි උපයෝගි කර ගන්න. ඒවා පහත සඳහන් අංශ ඔස්සේ වර්ගීකරණය කර ඉදිරිපත් කරන්න. ඒ සඳහා පහත සටහන ආදර්ශයට ගන්න.

| කෘෂිකාර්මික ආර්ථික කටයුතු | කාර්මික ආර්ථික කටයුතු | සේවා ආර්ථික කටයුතු | ආර්ථික කටයුතු සම්බන්ධ ගැටලු තිරසාර ව විසඳා ගත හැකි ක්‍රම |
|---|---|---|---|
| | | | |

ඔබ වෙත සපයන ලද ඩිමයි කොළයේ ඉහත දැක්වෙන පරිදි වගු ගත කර පින්තූර හා ලිපි ඇතුළත් කර බිත්ති පුවත් පත නිර්මාණය කරන්න.

# 6 ස්වාභාවික උපද්‍රව හා ආපදා

**නිපුණතාව -** ස්වාභාවික උපද්‍රව හා ආපදා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

## හැඳින්වීම

ස්වාභාවික උපද්‍රව හා ආපදා කෙරෙහි වර්තමාන ලෝකයේ දැඩි අවධානය යොමු ව තිබේ. ආපදාවල වාර ගණන හා ඒ මගින් සිදු වන හානි ප්‍රබල වීමට හේතුවයි. ලෝකයේ කවර ම හෝ ස්ථානයක ස්වාභාවික ආපදා නිරන්තරයෙන් සිදු වන බව වර්තමානයේ දක්නට ලැබේ. ආපදා තීව්‍ර වීම සඳහා වර්තමාන මිනිස් ක්‍රියාකාරකම් ද හේතු වන බව පෙනේ.



**නිපුණතා -** ස්වාභාවික උපද්‍රව හා ආපදා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම -** ස්වාභාවික උපද්‍රව හා ආපදාව හඳුන්වයි.

**කාලච්ඡේද ගණන** - 01

**ඉගෙනුම් පල**

1. ස්වාභාවික උපද්‍රව හා ආපදා අතර වෙනස දක්වයි.

2. උපද්‍රව වර්ගීකරණය කරයි

**ක්‍රියාකාරකම** - 5.6.1.4 ''උපද්‍රවය හා ආපදාව හඳුනා ගනිමු''.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා ක්‍රමය
- ගවේෂණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. උපද්‍රවය හා ආපදාව පිළිබඳව දැනුවත් වීමේ අගය වටහා ගැනීම.
2. විවිධ වර්ගයේ උපද්‍රව ඇති බව හඳුනා ගැනීම
3. සමහර උපද්‍රව ආපදා බවට පත්වීමට පෙර වළක්වා ගැනීමට අවබෝධයෙන් කටයුතු කළ හැකි බව දැන ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ උපද්‍රව හා ඒවා ආපදා බවට පත් වූ අවස්ථා දැක්වෙන පින්තූර (පුවත්පත්වලින් කපා ගත් හෝ ඇඳ ගත් පින්තූර) වීඩියෝ දර්ශන, උපද්‍රව හා ආපදා සරල ව වෙන් කර ගත හැකි වාක්‍ය

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

උපද්‍රවය හා ආපදාව දෙයාකාරයකි. එය සිදු වන අවස්ථා අනුව වෙන්කර අර්ථ නිරූපණය කර හඳුනා ගත හැකි වේ. විවිධ උපද්‍රව වර්ග හඳුනා ගැනීම ද මෙම ක්‍රියාකාරකම මගින් අපේක්ෂිත ය. ශිෂ්‍ය කේන්ද්‍රීය ව සාකච්ඡාවක් මෙහෙයවමින් ශිෂ්‍යයන් අරමුණු කරා ළඟා කර විය යුතු ය. භාවිත දැනුම ද උපයෝගී කර ගනිමින් ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීමට සාකච්ඡාව ඵලදායී ව යොදා ගැනීම වැදගත් ය.

පියවර I

- කාලගුණ නිවේදනයකට සවන් දීමට අවස්ථාව සලසා දෙමින් ඒ මගින් ප්‍රවේශය ලබා ගන්න. දිවයිනේ නිරිතදිග ප්‍රදේශයට විශේෂයෙන් මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශවලට වැඩි වර්ෂාපතනයක් ලැබෙමින් පවතින බව ප්‍රකාශ කරන නිවේදනය නිම වූ විට, ඉන් පසුව නිරිත දිග පහත්බිම්වල ඇති විය හැකි තත්ත්වය පිළිබඳව සාකච්ඡාව මෙහෙය වන්න. එහිදී ජල ගැලීම් ඇති විය හැකි බවත්, එමගින් උපද්‍රව හා ආපදා පැහැදිලි වන සේ සාකච්ඡා කරන්න.

පියවර II

- උපද්‍රවය හා ආපදාව වෙන් කර හඳුනා ගත හැකි වන සේ සපයා ගත් පින්තූර පුවරුවෙහි රැඳවීමට උපදෙස් දෙන්න. ඒවා පිළිබඳව සාකච්ඡා කරන්න.

පියවර III

- පින්තූර රැඳ වූ පසු උපද්‍රව වර්ග කළ හැකි ආකාර පිළිබඳ ව සාකච්ඡාව මෙහෙයවන්න. ඒ අනුව උපද්‍රවවල උපත සිදු වන ආකාරය අනුව මෙන් ම බලපෑම ලැබෙන කාල සීමාව අනුව ද වර්ග කළ හැකි බව සාකච්ඡා කර ශිෂ්‍යයන් ලවා උපද්‍රව වර්ගවලට බෙදා දක්වන්න. එම බෙදීම් හා ඉහත අර්ථ දැක්වීම් අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට යොමු කරන්න.
- කෙටි ප්‍රශ්න කීපයක් යොමු කරමින් ඇගයීමට ලක් කරන්න. ඒ අතරම පාඩම සමාලෝචනය කරන්න. ආපදාව හා උපද්‍රවය අතර වෙනස කුමක් ද?
- ශ්‍රී ලංකාවට බලපාන ආපදා මොනවා ද?
- ලෝකයට නිරන්තර ව ඇති වන ආපදා මොනවා ද?

**තක්සේරුකරණය හා ඇගයීම**

- උපද්‍රවය හා ආපදාව අතර වෙනස පැහැදිලි කිරීම.
- උපද්‍රව වර්ගීකරණය කිරීම.
- උපද්‍රව ආපදාවක් බවට පත් විය හැකි ආකාරය සඳහන් කිරීම.
- අදාළ පින්තූර සපයා ගෙන හොඳ සූදානමක් පෙන්වීම.
- සාකච්ඡාවට සක්‍රීය ව දායක වීම.

**නිපුණතා -** ස්වාභාවික උපද්‍රව හා ආපදා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම -** ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික උපද්‍රව හා ආපදාවල ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික උපද්‍රව හා ආපදා නම් කරයි.
2. ජල ගැලීම් නිසා ඇති වන හානි විස්තර කරයි.
3. ජල ගැලීම් හානි අවම කර ගත හැකි ආකාරය ඉදිරිපත් කරයි.
4. ජල ගැලීම් බහුල ව සිදු වන ප්‍රදේශ සිතියම්වල ලකුණු කර නම් කරයි.

**ක්‍රියාකාරකම** - 3.6.2 ජල ගැලීම් අනතුරු වළකා ගනිමු.''

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ජල ගැලීම් ඇති වන ආකාරය පිළිබඳ දැනුවත් වීමේ වැදගත්කම වටහා ගැනීම
2. ජල ගැලීම්වලින් සිදු වන ආපදා අවම කිරීම සඳහා මිනිසාට කටයුතු කළ හැකි බව අවබෝධ කර ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත, ශ්‍රී ලංකාවේ ගංගා පිළිබඳ දැක්වෙන කවියක්, ශ්‍රී ලංකා ආකෘති සිතියම්, ඩිමයි කඩදාසි, ෆෙල්ට් පෑන්

### පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්

ජල ගැලීම් පිළිබඳව හැඳින්වීම, එයට හේතු වන ස්වාභාවික සාධක හා මානුෂ ක්‍රියාකාරකම්, ජල ගැලීම්වලට ලක් වන ප්‍රදේශ, හානි හා එම හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග ආපදා කළමනාකරණ චක්‍රය ඇසුරින් සාකච්ඡා කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස පාඩම සංවිධානය කර ගන්න.

පියවර I

- ශ්‍රී ලංකාවේ ගංගා පිළිබඳ දැක්වෙන කවියක් ගායනා කරමින් ඒ පිළිබඳව විමසීම. එහි සඳහන් ගංගා හා ඒ ආශ්‍රිත ව ඇති විය හැකි ප්‍රධාන උපද්‍රවය කුමක් දැයි විමසා ප්‍රවේශය ලබා ගන්න. සිසුවෙකු ලවා හෝ ශ්‍රව්‍ය පටයකින් හෝ ඇසීමට සැලැස්විය හැකිය. (මහවැලි, කැලණි, වළවේ කළු යන ගංගා...)

- ජල ගැලීම් සම්බන්ධ සාකච්ඡාව තවදුරටත් ඉදිරියට ගෙන යන්න. ජල ගැලීම්වල බලපාන හේතු මුහුණ දෙන ප්‍රදේශ, ජල ගැලීම්වලින් ඇති විය හැකි හානි හා එම හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව එහිදී අවධානය යොමු කරන්න.

පියවර II

- ශිෂ්‍යයන් උචිත පරිදි කණ්ඩායම් කර එක් එක් කණ්ඩායමට කාර්ය පත්‍රිකාව ලබා දෙන්න.

- කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය ගුණාත්මක ද්‍රව්‍ය සහ උපදෙස් ලබා දෙන්න.

පියවර III

- ක්‍රියාකාරකම අවසානයේ දී සකස් කළ වාර්තාව පන්තියට ඉදිරිපත් කරන්න.

- ඉදිරිපත් කිරීම් පිළිබඳව ශිෂ්‍ය අදහස් ලබා ගන්න.

පියවර IV

- ප්‍රබලතා, දුබලතා අවධානයට යොමු කරමින් ප්‍රතිපෝෂණය ලබා දෙන්න. අවශ්‍ය දේ සටහන් කර ගැනීමට යොමු කරමින් පාඩම සමාලෝචනය කරන්න.

- ඉගෙනුම් පල හා නිර්ණායක තහවුරු වන සේ තක්සේරුකරණයට ලක් කරන්න.

**තක්සේරුකරණ හා ඇගයීම්**

- ජල ගැලීම්වලට හේතු පැහැදිලි කිරීම
- ජල ගැලීම් සිදු වන ප්‍රදේශ සිතියම් මගින් ඉදිරිපත් කිරීම
- ජල ගැලීම් නිසා සිදු වන හානි හා ඒවා අවම කළ හැකි ආකාරය විස්තර කිරීම
- වාර්තාව නිර්මාණාත්මක ව සකස් කර ඉදිරිපත් කිරීම
- සාමූහිකත්ව ගුණාංග ප්‍රකට කරමින් නියමිත කාලයට නිම කිරීම

**කාර්ය පත්‍රිකාව** 5.6.2.1

- ජල ගැලීමක් යනු කුමක් ද?
- ජල ගැලීමට බලපාන හේතු මොනවා ද?
- ජල ගැලීම්වලට නිතර ලක් වන ප්‍රදේශ මොනවා ද?
- ජල ගැලීම් නිසා ඇති වන හානි මොනවා ද?
- එම හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද?

**නිපුණතා -** ස්වාභාවික උපද්‍රව හා ආපදා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම -** ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික උපද්‍රව හා ආපදාවල ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** . 01

**ඉගෙනුම් පල**

1. සුනාමි ආපදාව පිළිබඳ විස්තර කරයි.
2. සුනාමි ආපදාවකින් සිදු වන හානි කරයි.
3. සුනාමි ආපදාවල ලක් වන ප්‍රදේශ සිතියමක ලකුණු කර නම් කරයි.
4. සුනාමි ආපදා හානි අවම කර ගත හැකි ආකාරය විස්තර කරයි.

**ක්‍රියාකාරකම** 5.6.3 ''සුනාමි අනතුරු අවම කර ගනිමු''

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- වීඩියෝ දර්ශන
- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ස්වභාවික ක්‍රියාවලියකින් සිදු වන සුනාමි උපද්‍රවයේ දැඩි විනාශකාරී බව වටහා ගැනීම.
2. සුනාමියකින් සිදු වන හානි අවම කර ගැනීම සඳහා පෙර සූදානම් වීම ඉතා වැදගත් බව පිළිගැනීම.

**ගුණාත්මක යෙදවුම්**

- සුනාමි අවස්ථාවක වීඩියෝ දර්ශනයක්

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

මෙම ක්‍රියාකාරකම මගින් සුනාමි ආපදාවක ස්වභාවය, සුනාමි ඇති වීමට හේතු, ඒ මගින් බලපෑමට ලක් වන ප්‍රදේශ, ඇති විය හැකි බලපෑම් මෙන් ම සුනාමි ආපදාවක අනතුරු අවම කර ගත හැකි ආකාරය පිළිබඳව ශිෂ්‍යයන් දැනුවත් කිරීම අපේක්ෂිත ය, සාකච්ඡා හා වීඩියෝ දර්ශන යොදා ගනිමින් ඉගෙනුම් අරමුණු සාධනය කර ගත යුතු ය.

පියවර I

- සුනාමි ආපදාව පිළිබඳ වීඩියෝ පටය ප්‍රදර්ශනය කරන්න. වීඩියෝ පටයක් නොමැති නම් එය විස්තර කරන්න.

- සුනාමි ආපදා අවස්ථාවක් දැක්වෙන වීඩියෝ පටයෙහි සුනාමියක් ඇති වන ආකාරය, බලපෑමට ලක් වන ප්‍රදේශ, සුනාමි ආපදාවෙන් ඇති වන බලපෑම් සහ එම බලපෑම් අවම කර ගත හැකි ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් විය යුතුය.

පියවර II

- වීඩියෝ පටය ඇසුරින් සුනාමි උපද්‍රවය පිළිබඳව පහත කරුණු ඉස්මතු වන අයුරින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සුනාමි උපද්‍රවය හඳුන්වන්න.
- සුනාමි උපද්‍රවයේ ස්වභාවය හා විනාශකාරී බව
- සුනාමි ඇති වීමට හේතු
- සුනාමි ආපදා අනතුරුවලට ලක් වන ප්‍රදේශ
- සුනාමි නිසා ඇති විය හැකි හානි
- සුනාමි ආපදා හානි අවම කර ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

පියවර III

- සාකච්ඡා කරන ලද කරුණු සාරාංශ කරමින් පෙළපොත ද භාවිත කර සුනාමි ආපදාවන් පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.
- කෙටි ප්‍රශ්න කීපයක් විමසමින් ඒවා හුනු පුවරුවේ ලියන්න. පිළිතුරු සටහන් කර ගැනීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ඇගයීම් නිර්ණායක තහවුරු වන සේ තක්සේරුකරණයට ලක් කරන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- සුනාමි ආපදාවක් ඇති වීමට හේතු පැහැදිලි කිරීම
- සුනාමි ආපදා අනතුරු බලපාන ප්‍රදේශ ලෝක සිතියමකින් දක්වීම
- සුනාමි ආපදාවක දී ඇති විය හැකි හානි හා ඒවා අවම කර ගත හැකි ආකාරය විස්තර කිරීම
- ස්වභාවික ආපදා අනතුරු උග්‍ර වීමට මානව ක්‍රියාකාරකම් හේතු වන බව අවබෝධයෙන් ප්‍රකාශ කිරීම
- සාකච්ඡාව සඳහා සක්‍රීය ව දායක වීම

**නිපුණතා -** ස්වාභාවික උපද්‍රව හා ආපදා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම -** ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික උපද්‍රව හා ආපදාවල ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවට බලපාන වාසුළි උපද්‍රවය පිළිබඳව විස්තර කරයි.
2. වාසුළි බලපාන ප්‍රදේශ සිතියම්වල ලකුණු කර නම් කරයි.
3. වාසුළි ආපදා හානි වැඩි වීමට බලපාන හේතු අවබෝධයෙන් විස්තර කරයි.
4. වාසුළි ආපදා හානි අවම කර ගත හැකි ආකාරය පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම** - 5.6.4 'මොනවද මේ වාසුළි'

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- ප්‍රශ්නකරණය
- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. වාසුළිවල ක්‍රියාකාරිත්වය පිළිබඳව මනා අවබෝධයක් තිබීමෙන් දිවි රැකුම් කුසලතාව වර්ධනය කළ හැකි බව වටහා ගැනීම.

**ගුණාත්මක යෙදවුම්**

- වාසුළි, සුළි කුණාටු දැක්වෙන වීඩියෝ දර්ශන, පින්තූර
- කාලගුණ නිවේදන ඇතුළත් හඬ පට
- වාසුළි ව්‍යාප්ත ප්‍රදේශ

### පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්

වාසුළි හැඳින්වීම. ඒවා ඇති වීමට බලපාන හේතු, නිර්මාණය වන ප්‍රදේශ වාසුළියක ක්‍රියාකාරිත්වය මෙන් ම බලපෑමට ලක් වන ප්‍රදේශ හා වාසුළි මගින් ඇති වන බලපෑම් හා ඒවා අවම කර ගත හැකි ආකාරය මෙහිදී අවධානයට යොමු කෙරේ. ප්‍රශ්නකරණය ප්‍රධාන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය ලෙස යොදා ගෙන ශිෂ්‍ය ගැටලු විසඳීමට යොමු කිරීම හා ගැටලුවකට නිවැරදි ව ප්‍රතිචාර දක්වන ආකාරය හුරු කරවීම ද මෙමගින් අපේක්ෂා කෙරේ.

පියවර I

- පාඩමට පෙර දිනක දී වාසුළි සම්බන්ධ තොරතුරු දැක්වෙන ලිපි, වාර්තා, පින්තූර, සිතියම් සහ අදාළ පොත් පත් සපයා ගැනීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න.
- සුළි කුණාටුවක් ආශ්‍රිත පින්තූරයක් හෝ වීඩියෝ දර්ශනය ප්‍රදර්ශනය කරමින් ඒ පිළිබඳව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරමින් ප්‍රවේශය ලබා ගන්න. මගින් වාසුළි යනු කුමක් දැයි අර්ථ දක්වා සාකච්ඡාව මෙහෙය වන්න.

පියවර II

- ශිෂ්‍යයන් සපයා ගත් තොරතුරු මූලාශ්‍ර පාඩම ආරම්භයේ දී අධ්‍යයනයට යොමු කරන්න.
- තොරතුරු අධ්‍යයනය කරන අතර අවශ්‍ය අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- පහත සඳහන් ප්‍රශ්නවලට ශිෂ්‍යයන්ගෙන් පිළිතුරු ලබා ගන්න. (ලිඛිත /වාචික)
- වාසුළි යනුවෙන් හඳුන් වන්නේ කුමක් ද?
- වාසුළි නිර්මාණය වීමට බලපාන හේතු මොනවා ද?
- ලෝකයේ වාසුළි බහුල ප්‍රදේශ නම් කරන්න.
- විවිධ සාගරික ප්‍රදේශවල දී වාසුළි හඳුන්වන නම් මොනවා ද?
- ශ්‍රී ලංකාවේ වාසුළි/ සුළි සුළං අනතුරු බහුල ප්‍රදේශ නම් කරන්න.
- වාසුළි නිසා ඇති වන බලපෑම් මොනවා ද?
- වාසුළි අනතුරු අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.
- ශ්‍රී ලංකාවේ වාසුළි/සුළි සුළං අනතුරු බහුල වනුයේ වසරේ කුමන මාසවල දී ද?

පියවර III

- ප්‍රදේශ නම් කළ පසු සිතියම් ලකුණු කිරීමට යොමු කරන්න.

පියවර IV

- ශිෂ්‍යයන් විසින් සපයන ලද පිළිතුරුවල ප්‍රබලතා දුබලතා සාකච්ඡා කර අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- ලබා දෙන පිළිතුරු අනුව නිර්ණායක පදනම් කර ගනිමින් තක්සේරුකරණයට ලක් කරන්න.

**තක්සේරුකරණ හා ඇගයීම**

- වාසුළි නිර්මාණය වීමට බලපාන හේතු පැහැදිලි කිරීම
- වාසුළි බලපාන ප්‍රදේශ ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කිරීම
- ශ්‍රී ලංකාවේ සුළි සුළං පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම
- වාසුළි නිසා ඇති වන බලපෑම් හා ඒවා අවම කර ගත හැකි ක්‍රම පැහැදිලි කිරීම
- නිර්මාණාත්මක ව හා තාර්කික ව පිළිතුරු ලබා දීම

**නිපුණතා -** ස්වාභාවික උපද්‍රව හා ආපදා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම -** ශ්‍රී ලංකාවට බලපාන ස්වභාවික උපද්‍රව හා ආපදාවල ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** . 01

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවට බලපාන නායයෑම් පිළිබඳව විස්තර කරයි.
2. නායයෑම් වන ප්‍රදේශ ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරයි.
3. නායයෑම් ආපදා හානි වැඩි වීමට බලපා හේතු විස්තර කරයි.
4. නායයෑම් හානි අවම කරගත හැකි ආකාරය පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම** - 5.6.5 'නායයෑම් හානි අවම කරමු'

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

-

**ආකල්ප හා අගය පද්ධති**

1. නායයෑම් තීව්‍ර වීමට මානුෂ ක්‍රියාකාරකම් බෙහෙවින් බලපාන බව පිළිගැනීම.
2. නායයෑම් ඇති වීමට හේතු අවම කිරීම. පුරවැසියෙකුට සක්‍රීය ලෙස දායක විය හැකි බව අවබෝධ කර ගැනීම.

**ගුණාත්මක යෙදවුම්**

- නායයෑම් සම්බන්ධ වීඩියෝ දර්ශන, පින්තූර, වාර්තා

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

නායයෑම් සහ එයට බලපාන හේතු අධ්‍යයනය කිරීම, නායයෑම් අවදානම් සහිත ප්‍රදේශ හඳුනා ගැනීම, නායයෑම් නිසා සිදුවිය හැකි හානි පිළිබඳ අවධානය යොමු කිරීම මෙන් ම එම හානි අවම කළ හැකි ආකාරය පිළිබඳ ව අධ්‍යයනයට ශිෂ්‍යයින් යොමු කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. සංකල්ප සිතියම් ගොඩනැගීම ඇසුරින් ශිෂ්‍යයින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකමට යොදා ගැනීමට මෙහිදී යෝජිත ය.


පියවර I

- නායයෑමට පෙර අවස්ථාවක පරිසරයේ වෙනස්කම් දැක්වෙන පින්තූර හෝ වීඩියෝ පටයක් (කඳුකරයට අධික වැසි ලැබීම, පොළොව ඉරිතැලීම, ගස් හා විදුලි කුලුණු ඇදවීම ආදිය) ප්‍රදර්ශනය කරමින් ඒ පිළිබඳව ශිෂ්‍යයන්ගෙන් තොරතුරු විමසන්න. එයට ලැබෙන පිළිතුරු අනුව නායයෑම් පිළිබඳව කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.

- නායයෑම් හඳුන්වා දී ඒවාට හේතු සහ බලපෑම් ද හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග ද ඉස්මතු වන අයුරින් සාකච්ඡාව ඉදිරියට ගෙන යන්න. පෙළපොතෙහි 6 ඒකකය ද ඇසුරු කර ගන්න.

පියවර II

- සාකච්ඡා කළ කරුණු ඇසුරින් පහත ආකෘතියට අනුව සංකල්ප සිතියමක් ගොඩනැගීමට ශිෂ්‍යයින්ට උපදෙස් ලබා දෙන්න.




- ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි නායයෑම් අනතුරු සහිත ප්‍රදේශ ලකුණු කිරීමට උපදෙස් දෙන්න.

පියවර III

- ශිෂ්‍යයන් විසින් ගොඩනගන ලද සංකල්ප සිතියම් ඉදිරිපත් කරවන්න.
- ශිෂ්‍ය ඉදිරිපත් කිරීම් පිළිබඳ අනෙක් ශිෂ්‍යයන්ගේ අදහස් ලබා ගන්න.

පියවර IV

- ඉදිරිපත් කිරීම්වල ප්‍රබලතා දුබලතා සාකච්ඡා කරමින් අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- සංකල්ප සිතියමෙහි කරුණු සාරාංශ ගත කරමින් සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- නිර්ණායක සාධනය වන සේ තක්සේරුකරණය කරන්න.

**තක්සේරුකරණ හා ඇගයීම්**

- නායයෑම්වලට බලපාන හේතු පැහැදිලි කිරීම
- නායයෑම්වල බලපෑම් විස්තර කිරීම
- නායයෑම්වලට ලක්වන ප්‍රදේශ ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කිරීම
- නිර්මාණාත්මක ව සංකල්ප සිතියම සකස් කර ඉදිරිපත් කිරීම
- නියමිත කාලයට ගුරු උපදෙස් අනුව කාර්ය නිම කිරීම

**නිපුණතා -** ස්වාභාවික උපද්‍රව හා ආපදා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම -** ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික උපද්‍රව හා ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවට බලපාන "අකුණු අනතුරු පිළිබඳව විස්තර කරයි".
2. අකුණු අනතුරු හානි බහුල ප්‍රදේශ සිතියමකින් දක්වයි.
3. අකුණු අනතුරු හානි බහුල වීමට හේතු ඉදිරිපත් කරයි.
4. අකුණු හානි අවම කර ගත හැකි ආකාරය විස්තර කරයි.

**ක්‍රියාකාරකම** - 5.6.7 "අකුණු අනතුරු අවම කරමු".

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සංවාද

**ආකල්ප හා අගය පද්ධති**

1. අකුණු ඇති වීම ස්වාභාවික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් බව අවබෝධ කර ගැනීම.
2. අකුණු අනතුරුවල හානි වැඩි වීමට මානුෂ ක්‍රියාකාරකම් බලපාන බව වටහා ගැනීම.

**ගුණාත්මක යෙදවුම්**

- අකුණු නිර්මාණය වීම, අනතුරු හා හානි අවම කිරීම සම්බන්ධ පින්තූර හා වාර්තා

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික උපද්‍රවයක් ලෙස අකුණු අනතුරු ද හඳුනා ගත හැකිය. ඒ අනුව අකුණු හැඳින්වීම, අකුණු අනතුරුවලින් සිදු වන හානි සහ එම හානි අවම කර ගත හැකි ආකාරය පිළිබඳව ශිෂ්‍යයන් දැනුවත් කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අවධානය යොමු කෙරේ. දෙබස් සංවාදයක් ඇසුරින් පාඩම ගොඩනැගීමට අපේක්ෂිත අතර ශිෂ්‍ය කේන්ද්‍රීය ව ඉගෙනුම්පල තහවුරු වන සේ ක්‍රියාකාරකම සිදු කරන්න.

පියවර I

කාලගුණ නිවේදනයකට සවන් දීමට ශිෂ්‍යයන් යොමු කරන්න. ඉන් පසුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පිළිබඳව කෙටි හැඳින්වීමක් කර, එහි නිලධාරියෙකු අද දින සංවාදයකට සහභාගි වන බව දන්වන්න. සංවාදය සිදු කරනුයේ අකුණු අනතුරු පිළිබඳව බව ද දන්වන්න.

- එක් ශිෂ්‍යයෙකු නිවේදකයෙකු ලෙසත්, තවත් එක් අයෙකු හෝ දෙදෙනෙකු කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලෙසත්, හඳුන්වා දී අකුණු පිළිබඳ දෙබස් සංවාදය ආරම්භ කරන්න. සංවාදයට පෙර දිනක දී සූදානම් වීමට උපදෙස් දෙන්න. පෙළපොත හා වෙනත් මූලාශ්‍ර යොදා ගෙන අවශ්‍ය තොරතුරු සපයා ගැනීමට යොමු කරන්න.

සංවාදයේ දී පහත ප්‍රශ්න ඇසීමට නිවේදකයාට උපදෙස් දෙන්න.

- අකුණු යනු මොනවා ද?
- අකුණු අනතුරු සිදු වන කාලය
- අකුණු නිසා සිදු වන හානි
- අකුණු හානි බහුල ව සිදු වන ප්‍රදේශ
- හානි අවම කර ගත හැකි ආකාරය

- සංවාදයේ දී මූලාශ්‍ර භාවිතයෙන් කරුණු ඉදිරිපත් කිරීමට උදව් කරන්න.
- සංවාදය අතර ප්‍රබලතා සහ අඩුපාඩු සොයා බලන්න.

පියවර II

- ශිෂ්‍ය අදහස් ද සමග ප්‍රබලතා හා දුබලතා පිළිබඳ සාකච්ඡා කර ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- පාඩම සමාලෝචනය කරමින් සටහන් කර ගැනීමට යොමු කරන්න.
- නිර්ණායක තහවුරු වන සේ තක්සේරුකරණය කරන්න.

**තක්සේරුකරණ හා ඇගයීම්**

- අකුණු ඇති වන ආකාරය හා අකුණු වර්ග පැහැදිලි කිරීම
- අකුණු ඇති වන කාලය සහ ප්‍රදේශ විස්තර කිරීම
- අකුණු නිසා ඇති වන හානි හා ඒවා අවම කර ගත හැකි ආකාරය පැහැදිලි කිරීම
- අකුණුවලින් ආරක්ෂා වීම සඳහා සෑම අයෙකුට ම කාර්යභාරයක් ඉටු කළ හැකි බව අවධාරණය කිරීම
- සංවාදයට සක්‍රීය ව දායක වීම

**නිපුණතා -** ස්වාභාවික උපද්‍රව හා ආපදා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම -** ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික උපද්‍රව හා ආපදාවල ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව - 01යි**

**ඉගෙනුම් පල**

1. නියඟය ඇති වීමට බලපාන හේතු විස්තර කරයි.
2. නියඟය බලපාන ප්‍රදේශ සිතියමකින් දක්වයි.
3. නියඟයේ හානි වැඩි වීමට බලපාන කරුණු පැහැදිලි කරයි.
4. නියඟයේ හානි අවම කර ගත හැකි ආකාරය විස්තර කරයි.

**ක්‍රියාකාරකම - 5.6.8** "නියඟය පිළිබඳ දැනුවත් වෙමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා සහ චිත්‍ර නිර්මාණ

**ආකල්ප හා අගය පද්ධති**

1. නියඟය ආපදවක් කර නොගත යුතු බව වටහා ගැනීම
2. නියග උපද්‍රවය මානුෂ ක්‍රියාකාරකම් හේතුවෙන් ආපදවක් වන ආකාරය දැන ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- චිත්‍ර නිර්මාණයට අවශ්‍ය කඩදාසි හා වර්ණ

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

ස්වාභාවික උපද්‍රව වන නියඟය, ශ්‍රී ලංකාවට ද නිරතුරුව ආපදා තත්ත්ව ඇති කරන්නකි. නියඟය යනු කුමක් දැයි හැඳින්වීම, නියඟයට හේතු විමසා බැලීම, නියඟයෙහි බලපෑම් අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයන් යොමු කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. එමෙන් ම ශ්‍රී ලංකාවේ නියඟය බලපාන ප්‍රදේශ මෙන්ම නියඟ ආපදාවෙන් සිදු වන හානි අවම කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ද මෙහි දී අවධානය යොමු කෙරේ. පෝස්ටර් චිත්‍ර හා සාකච්ඡා උපයෝගී කර ගනිමින් ඉගෙනුම් අරමුණ ළඟා කර ගත යුතු ය.

පියවර I

- නියඟ කාලය පිළිබඳව දැක්වෙන කථාවක් පන්තියට ඉදිරිපත් කරන්න. එය බුදු දහමට සම්බන්ධ වූවක් නම් වඩාත් යෝග්‍ය ය. එසේ නොමැති නම් ජනකතා හෝ අතීත සිද්ධියක් වුව ද යොදා ගත හැකි ය. (ජාතක කතා වඩා යෝග්‍යය) කථාවක් සමග නියඟය පිළිබඳව ශිෂ්‍යයන් දැනුවත් කරන්න.

- පහත තේමා ඉස්මතු වන ලෙස සාකච්ඡාවක් මෙහෙයවන්න.
  . නියඟයට හේතු
  . නියඟයේ බලපෑම්
  . නියඟ ආපදා බලපාන ප්‍රදේශ
  . හානි අවම කර ගත හැකි ආකාරය

- සාකච්ඡාව අවසානයේ ශිෂ්‍යයන් තේවල හෝ කණ්ඩායම් ලෙස ගෙන පහත තේමා අනුව චිත්‍රයක් නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.
  . නියඟයක දර්ශනයක්
  . නියඟයට බලපාන සාධක
  . නියඟයේ බලපෑම්
  . නියඟ ආපදා  අවම කර ගැනීම

- අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම් ලබා දෙමින් චිත්‍රය නිර්මාණය කරන්න

- නිර්මාණය කරන ලද චිත්‍ර ඉදිරිපත් කරවන්න

- චිත්‍ර පිළිබඳව අනෙක් ශිෂ්‍යයන්ගේ අදහස් ලබා ගන්න

- ඉදිරිපත් වූ අදහස්වල ප්‍රබලතා හා දුබලතා සාකච්ඡා කර අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න

- ශ්‍රී ලංකාවේ නියඟ ආපදා  බහුල දිස්ත්‍රික්ක සිතියමක ලකුණු කර නම් කරවන්න

- චිත්‍රවලින් දැක්වෙන ප්‍රමුඛ අදහස් සටහන් පොතට ගැනීමට උපදෙස් ලබා දී පාඩම සමාලෝචනය කරන්න

- නිර්ණායක තහවුරු වන සේ තක්සේරුකරණය සිදු කරන්න

**තක්සේරුකරණය හා ඇගයීම**

- නියඟය යනු කුමක් දැයි හඳුන්වා දී ඊට බලපාන හේතු පැහැදිලි කිරීම
- නියඟය බලපාන ප්‍රදේශ ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කිරීම
- නියඟය නිසා සිදු වන බලපෑම් හා ඒවා අවම කර ගත හැකි ආකාරය විස්තර කිරීම
- තේමාවට අදාළ ව නිර්මාණාත්මක ව චිත්‍රය ඇඳ විස්තර කිරීම
- නියඟයට හේතු වන මානුෂ ක්‍රියාකාරකම්වලින් තමන් හා අන් අය ද වළක්වා ගැනීමට කටයුතු කිරීම

**නිපුණතා -** ස්වාභාවික උපද්‍රව හා ආපදා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම -** ආපදා කළමනාකරණයට සක්‍රීය ව දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. ආපදා කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකාවේ ආයතනික ස්වභාවය විස්තර කරයි.
2. ශ්‍රී ලංකාවට බලපාන ආපදා කළමනාකරණය කරන ආකාරය ආපදා කළමනාකරණ චක්‍රය ඇසුරින් පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම -** 5.6.9 ''ආපදා කළමනාකරණය''

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** -

- බුද්ධි කලම්බන ක්‍රමය
- අනාවරණ ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. ආපදා කළමනාකරණයට දායක වීම සෑම පුද්ගලයෙකුගේ ම වගකීමක් බව අවබෝධ වීම

**ගුණාත්මක යෙදවුම්**

- ආපදා අවස්ථාවක පින්තූරයක්
- එය නැවත යථා තත්වයට පත් කළ පින්තූරයක් (සුනාමි)

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

ශ්‍රී ලංකාවට බලපාන ආපදා හා ඒවායේ හානි අවම කර ගත හැකි ආකාරය මේ දක්වා මෙම ඒකකයෙහි අවධානයට ලක් කළ අතර ආපදා කළමනාකරණය පිළිබඳ විධිමත් ආයතනික ස්වභාවය හා එහි විකාශය පිළිබඳව ද ආපදා කළමනාකරණ චක්‍රයට අනුව ක්‍රියාත්මක විය යුතු ආකාරය ද අධ්‍යයනයට ශිෂ්‍යයන් යොමු කිරීම අපේක්ෂිත ය. පින්තූර හා තොරතුරු එකතුවක් මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය ව ඉගෙනුම් අරමුණු කර ගැනීමට ශිෂ්‍යයන් යොමු කරවිය යුතුය.

පියවර I

සුනාමි අවස්ථාවක හානි වූ නගරයක පින්තූරයක් ද, එය නැවත ප්‍රතිසංස්කරණය කළ දර්ශනය දැක්වෙන පින්තූරයක් ප්‍රදර්ශනය කරමින් ඒ පිළිබඳව ශිෂ්‍යයන්ගෙන් තොරතුරු විමසන්න. එහිදී ආපදා අවස්ථාවට පසුව එය නැවත යථා තත්වයට පත් කිරීම පිළිබඳව කෙටි සාකච්ඡාවක් මෙහෙයවා ප්‍රවේශය ලබා ගන්න.

සාකච්ඡාව තවදුරටත් ඉදිරියට ගෙන යමින් භූමිකම්පා සම්බන්ධ පහත තේමා ඉස්මතු වන අයුරින් බුද්ධි කලම්බන හා අනාවරණ ක්‍රම යොදා ගනිමින් පාඩම ගොඩනගන්න.

මීට පෙර පාඩම්වල දී (ආපදා) කළමණාකරණයට සම්බන්ධ පින්තූර එකතු කර තබා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන්න.

පියවර II

- පන්තියේ සිටින ශිෂ්‍යයන් සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකාවට බලපාන ආපදා සියල්ල සඳහා පින්තූර ඇත් දැයි පරීක්ෂා කරන්න.
- ගෙන එන ලද පින්තූර සියල්ල එක් රැස් කර ගන්න.
- ආපදා කළමනාකරණයේ ආයතනික ස්වභාවය සහ එහි විකාශය පිළිබඳව කෙටි සාකච්ඡාවක් මෙහෙය වන්න.
- ආපදා කළමනාකරණ චක්‍රය පිළිබඳව ශිෂ්‍යයන් දැනුවත් කර බ්‍රිස්ල් බෝඩ් එකක එහි අවස්ථා සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.

පියවර III

- එක් එක් කණ්ඩායමට ශිෂ්‍යයාට එක් එක් ආපදාව බැගින් බෙදා දෙන්න. පින්තූර සියල්ල මේසය මත තබා තම තමන්ට හිමි ආපදා කළමනාකරණයට සම්බන්ධ පින්තූර තෝරා ගැනීමට යොමු කරන්න.
- තෝරා ගත් පින්තූර කළමනාකරණ චක්‍රයේ අදාළ අවස්ථාවට අනුව රැඳවීමට උපදෙස් දෙන්න.
- ශිෂ්‍යයන් විසින් නිම කරන ලද ආපදා කළමනාකරණ චක්‍ර ඉදිරිපත් කරන්න.

පියවර IV

- ඉදිරිපත් කිරීම් පිළිබඳව අනෙක් ශිෂ්‍යයන්ගේ අදහස් ලබා ගන්න.

පියවර V

- ප්‍රබලතා, දුබලතා සාකච්ඡා කරමින් ප්‍රතිපෝෂණය ලබා දෙන්න.
- පාඩම සමාලෝචනය කරමින් සටහන් කර ගැනීමට යොමු කරන්න.
- නිර්ණායක සාධනය වන සේ තක්සේරුකරණය සිදු කරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සම්බන්ධ ආයතනික ස්වභාවය හා විකාශය පැහැදිලි කිරීම
- ආපදා කළමනාකරණ චක්‍රය විස්තර කිරීම
- එක් එක් ආපදාවන් කළමනාකරණය කරන ආකාරය චක්‍රය ඇසුරින් ඉදිරිපත් කිරීම
- ගැළපෙන පින්තූර තෝරා ගෙන නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම
- සාමූහික ව ක්‍රියාකාරකමට සහාය දැක්වීම

## 5.7 තිරසර සංවර්ධනය හා පරිසර ආචාර ධර්ම

**නිපුණතාව** - - තිරසර සංවර්ධනය පිළිබඳ ධනාත්මක ආකල්ප සහිත ව කටයුතු කරයි.

### හැඳින්වීම

මිනිසා හා පරිසරය අතර සම්බන්ධතාව මානවයාගේ ආරම්භය දක්වා දිවයයි. පරිසරයේ කොටසක් වූ මිනිසා මුල් යුගයේ පරිසරයට අනුගත ව ජීවත් වුව ද මිනිස් ගහණය වැඩිවීමත්, අවශ්‍යතා වැඩිවීම හා තාක්ෂණයේ දියුණුවත් නිසා පරිසරය තමන්ට අවශ්‍ය ලෙස හැසිරවීමටත් ඉන් අසීමිත ප්‍රයෝජන ගැනීමටත් පෙලඹුණි. ඒ අනුව ජීවී පරිසරයේ පැවැත්මට අජීවී පරිසරය මෙන් ම අජීවී පරිසරයේ පැවැත්මට ජීවී පරිසරය ද අන්‍යෝන්‍ය වශයෙන් බලපෑම් ඇති කරයි.

මිනිසා හා පරිසරය සම්බන්ධව අධ්‍යයනය කරන විට පරිසරය ප්‍රයෝජනයට ගන්නා ආකාරය පිළිබඳව සොයා බැලිය යුතුය. එමෙන් ම පෙර සිට ම පැවති පරිසර ආචාර ධර්ම හා පරිසර සංරක්ෂණ පිළිවෙත්, තිරසර සංවර්ධනයක් කරා යාමට පරිසර සංරක්ෂණය පිළිබඳ සංවිධාන හා ආයතනවලින් ලැබෙන පිටිවහල පුරවැසියන් ලෙස පරිසර සංරක්ෂණයට සක්‍රීය ව සහභාගි විය හැකි ආකාර පිළිබඳවත් සාකච්ඡා කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂිත ය.










**නිපුණතාව -** තිරසර සංවර්ධනය පිළිබඳ ධනාත්මක ආකල්ප සහිත ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම -** 7.1 ජීවන දර්ශනයක් වශයෙන් තිරසාර සංවර්ධනයක අවශ්‍යතාව පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. මිනිසා හා පරිසරය අතර සම්බන්ධතා විස්තර කරයි.
2. මිනිසා පරිසරය ප්‍රයෝජනයට ගන්නා ආකාරය පැහැදිලි කරයි

**ක්‍රියාකාරකම** - **-** 5.7.1 පරිසරයේ අවශ්‍යතාව හඳුනා ගනිමු

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා සහ ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා අගය පද්ධති**

1. මිනිසාට තම පරිසරයෙන් බැහැරව ජීවත් වීමට නොහැකි බව අවබෝධ කර ගැනීම
2. පරිසරය හා මිනිසා අතර නො බිඳිය හැකි සම්බන්ධතාවක් ඇති බව පිළිගැනීම
3. පාරිසරික සත්වයෙක් ලෙස මිනිසාට පරිසරය සම්බන්ධ ව වගකීම් රාශියක් ඇති බව වටහා ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- පින්තූර පියවර 1ට අදාළ (වීඩියෝ පට)
- බ්‍රිස්ල් බෝඩ්
- ෆෙල්ට් පැන්
- පෙළපොත 5 ශ්‍රේණිය
- පරිසරය හා මිනිස් ක්‍රියාකාරකම් දැක්වෙන විවිධ පින්තූර

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

මිනිසා හා පරිසරය අතර සම්බන්ධතාව හා මිනිසා පරිසරය ප්‍රයෝජනයට ගන්නා ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

පියවර I

- මිනිසා හා පරිසරය අතර සම්බන්ධතාව දැක්වෙන පින්තූර කිහිපයක් (වෙරළබඩ පරිසරය, කඳුකර වගා, හේන් වගාවන්, නගර ආදිය) පෙන්වා එම පින්තූරවලින් මිනිසා පරිසරය ප්‍රයෝජනයට ගන්නා ආකාරය වෙනස් කරන ආකාරය ශිෂ්‍ය අවධානය යොමු කරවන්න. සාකච්ඡාවේ දී මතු වන කරුණු හුනු පුවරුවේ සටහන් කරන්න.

පියවර II

- අතීතයේ සිට මිනිසා පරිසරය ප්‍රයෝජනයට ගත් ආකාර,
- පරිසරය පැවති ආකාරයට ම හා පරිසරයට අනුගත වෙමින් සහයෝගයෙන් කටයුතු කිරීම පිළිබඳ පින්තූර හා සිද්ධි ඇසුරින් සකස් කිරීම.
- පරිසරය වෙනස් කරමින් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ සාකච්ඡා කරන්න. විශේෂිත කරුණු හුනු පුවරුවට ගන්න.

පියවර III

- ශිෂ්‍යයන් සපයා ගෙන ඇති පින්තූර ඇසුරින් ඒවායේ දැක්වෙන තොරතුරු පිළිබඳ කෙටි විස්තරයක් ලිවීමට ශිෂ්‍යයන්ට උපදෙස් දෙන්න. එහිදී මිනිසා පරිසරය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා සහ මිනිසා පරිසරයට හානි කරන අවස්ථා පිළිබඳ අවධානය යොමු කරවන්න.

පියවර IV

- ශිෂ්‍ය නිර්මාණ ඉදිරිපත් කිරීමට කාලය ලබා දෙන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- නිර්ණායක අනුව තක්සේරුකරණය සිදු කරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- මිනිසා හා පරිසරය අතර සම්බන්ධතාව පින්තූර මගින් ඉදිරිපත් කිරීම
- මිනිසා හා පරිසරය අතර සබඳතාව අනන්‍ය වශයෙන් බැඳී ඇති අතර ඒ පිළිබඳ විස්තර කිරීම
- විවිධ වූ මිනිස් පරිසර සම්බන්ධතා තාවකාලික ව වෙනස් වූ ආකාර නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම
- මිනිසා හා පරිසරය වෙන් කළ නොහැකි බව පිළිගනිමින් අදහස් දැක්වීම
- සහයෝගයෙන් කටයුතු කිරීම

**නිපුණතාව -** තිරසර සංවර්ධනය පිළිබඳ ධනාත්මක ආකල්ප සහිත ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම - 7.1** ජීවන දර්ශනයක් ලෙස තිරසාර සංවර්ධනයක අවශ්‍යතාව පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. තිරසර සංවර්ධනය අර්ථ දක්වයි.
2. තිරසර සංවර්ධනයක අවශ්‍යතාව පැහැදිලි කරයි.
3. යහපත් ලෙස ජීවත් වීමට තිරසර පරිසර සංරක්ෂණය (පිළිවෙත් අනුගමනය) කළ යුතු ආකාර යෝජනා කරයි.

**ක්‍රියාකාරකම -** 5.7.2 "තිරසර සංවර්ධනයක අවශ්‍යතාව හඳුනා ගනිමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා සහ කණ්ඩායම් ක්‍රියාකාරකම්

**ආකල්ප හා අගය පද්ධති**

1. රටක සංවර්ධන ක්‍රියාවලි සැලසුම් කිරීමේ දී තිරසර සංවර්ධනයක අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳ අවධානය යොමු කළ යුතු බව තේරුම් ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිස්ල් බෝඩ්
- පාට පෑන්
- පෙළපොත

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

තිරසර සංවර්ධනය යනු කුමක් දැයි හඳුන්වා දීමටත් තිරසර සංවර්ධනයක අවශ්‍යතාව පිළිබඳවත් පුරවැසියකු සතු වගකීම පිළිබඳවත් ශිෂ්‍යයන් දැනුවත් කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

පියවර I

- 'තිරසර සංවර්ධනය' යන්න පන්තියේ ශිෂ්‍යයන්ට පෙනෙන පරිදි හුනු පුවරුවේ සටහන් කරන්න.
- පසුව තිරසර සංවර්ධනය යන යෙදුම පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව දෙන්න.
- ඒවා හුනු පුවරුවේ සටහන් කර එහි දැක්වෙන විවිධ අදහස් පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.
- ඉන්පසු 1987 දී එක්සත් ජාතීන්ගේ පරිසරය හා සංවර්ධනය පිළිබඳ කොමිසම ඉදිරිපත් කළ වාර්තාවේ දැක්වෙන නිර්වචනය හුනු පුවරුවේ ලියන්න. එය ශිෂ්‍යයන්ට තහවුරු වෙන ආකාරයට පැහැදිලි කරන්න.

පියවර II

- රටක් සංවර්ධන ක්‍රියාවලියේ දී තිරසර සංවර්ධනයක අවශ්‍යතාව සාකච්ඡා කරන්න.
- එහි දී සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කළ යුතු ආකාරය, සංවර්ධනය කළ යුතු අංශ පිළිබඳ අවධානය යොමු කරන්න.

පියවර III

- තමා ජීවත් වන ප්‍රදේශයේ හෝ ආසන්න පරිසරයෙහි දැනට කෙරෙන සංවර්ධන ක්‍රියාවලියක් උදාහරණයට ගෙන ඉන් ඇති වන ප්‍රයෝජන සාකච්ඡා කරන්න.
- ඉන් පරිසරයට වන හානි පිළිබඳ කෙටි සටහනක් ගොඩනැගීමට ශිෂ්‍යයන්ට අවස්ථාව දෙන්න.
- යහපත් ලෙස පරිසරය සංරක්ෂණය කිරීමට හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීමට යොමු කරන්න

පියවර IV

- ශිෂ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා කාලය ලබා දෙන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ හා නිවැරදි කිරීම් සිදු කරන්න.
- නිර්ණායක පදනම් කර තක්සේරු කරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- තිරසර සංවර්ධනය පිළිබඳ අර්ථකථන ඉදිරිපත් කිරීම
- තිරසර සංවර්ධනයේ අවශ්‍යතාව පිළිබඳ තම අදහස් දැක්වීම
- තිරසර පාරිසරික සංරක්ෂණයේ ප්‍රයෝජන හා ඒ පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම
- සංවර්ධන ක්‍රියාවලියෙන් පරිසරයට සිදු වන හානි හා ඒවා අවම කිරීම පිළිබඳ අදහස් දැක්වීම
- සාර්ථක ව ඉදිරිපත් කිරීමක් සිදු කිරීම

**නිපුණතාව -** තිරසර සංවර්ධනය පිළිබඳ ධනාත්මක ආකල්ප සහිත ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම -** 7.2 පරිසර ආචාර ධර්මවලට අනුගත වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. පරිසර ආචාර ධර්ම යනු මොනවා දැයි හඳුන්වා දෙයි.
2. විවිධ ආගම්වල ඉගැන්වෙන පරිසර ආචාර ධර්ම විස්තර කරයි.
3. පරිසර ආචාර ධර්ම පිළිපැදීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.

**ක්‍රියාකාරකම -** 5.7.3 "පරිසර ආචාර ධර්ම පිළිපැදීමට හුරු වෙමු".

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා සහ කණ්ඩායම් ක්‍රියාකාරකම්

**ආකල්ප හා අගය පද්ධති**

1. යහ පුරුදු අනුගමනය කිරීමෙන් පරිසරය සංරක්ෂණයට දායක විය හැකි බව පිළිගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- පරිසරය පිළිබඳ පින්තූර/පරිසර ගීතය හඬ පටය
- ශිෂ්‍ය සංඛ්‍යාව අනුව සකස් කර ගත් වර්ණ කාඩ්පත්
- ඩිමයි කොළ
- ෆෙල්ට් පෑන්

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

රටක සංවර්ධන ක්‍රියාවලියේ දී සම්පත් භාවිතය අත්‍යවශ්‍ය ය. එහෙත් එහිදී පාරිසරික සමතුලිතතාව බිඳ වැටීමට හේතු වන බොහෝ ක්‍රියාකාරකම් සිදු වේ. ඉන් සිදු වන හානි අවම කර ගැනීමට පාරිසරික ආචාර ධර්ම පිළිබඳව හා ඒවායේ අවශ්‍යතාව පිළිබඳ දැක්මක් ප්‍රජාවෙහි තිබිය යුතු ය. ඒ අනුව පාරිසරික ආචාර ධර්ම පිළිපැදීමේ වැදගත්කම පිළිබඳ ශිෂ්‍ය දැනුවත් කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

පියවර I

- පරිසර ගීතය ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දෙන්න. එසේ නොමැති නම් පරිසරය පිළිබඳ පින්තූර කිහිපයක් ශිෂ්‍යයන්ට පෙන්වා ඒ පිළිබඳ විමසමින් පාඩමට පිවිසෙන්න.

පියවර II

- ආචාර ධර්ම යනු කුමක් දැයි ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- සකස් කර ගත් වර්ණ කාඩ්පත් ශිෂ්‍යයන්ට ලබා දෙන්න. ඔවුන් ආචාර ධර්ම ලෙස අදහස් කරන දේ කෙටියෙන් ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- එම කාඩ්පත් පුවරු මත අලවන්න.
- ශිෂ්‍යයන් ලියන ලද තොරතුරු ඇසුරින් ආචාර ධර්ම යනු මොනවා දැයි පැහැදිලි කරන්න.
- පෙළපොතේ ඇති අර්ථකථනය පහදා දෙන්න.

පියවර III

- පරිසර ආචාර ධර්ම සමාජයේ පවතින විවිධ ආගම් හා දර්ශනවලින් හඳුන්වා දී ඇති බව ශිෂ්‍යයන් සමග සරල ව සාකච්ඡා කරන්න.
- ශිෂ්‍ය කණ්ඩායම් හතරකට බෙදන්න.
- බෞද්ධ, කතෝලික, හින්දු හා ඉස්ලාම් යනුවෙන් ලියන ලද කඩදාසි කැබලි 4ක් අහඹු ලෙස තෝරා ගැනීමට කණ්ඩායම්වලට අවස්ථාව දෙන්න. ඒ අනුව තමාට ලැබී ඇති මාතෘකාවට අදාළ ව පාරිසරික ආචාර ධර්ම පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක්, තොරතුරු ගොනුවක් සකස් කිරීමට අවස්ථාව දෙන්න.

පියවර IV

- ඉදිරිපත් කිරීම සිදු කරන්න.
- ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.
- සෑම පුරවැසියෙකුට ම පරිසර ආචාර ධර්ම පිළිපැදිය හැකි බවත් ඒ සඳහා කැපවීමෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවක් පවතින බවත් අවධාරණය කරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- පරිසර සංවේදීතාව පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කිරීම
- පරිසර ආචාර ධර්ම අර්ථකථනය කිරීම
- විවිධ ආගම්වලින් ඉගැන්වෙන පරිසර ආචාරධර්ම පිළිබඳ තොරතුරු ගවේෂණය කර ඉදිරිපත් කිරීම
- පරිසර ආචාර ධර්ම පිළිපැදීමේ අවශ්‍යතාව අගය කිරීම
- සහයෝගයෙන් කටයුතු කිරීම

**නිපුණතාව -** තිරසර සංවර්ධනය පිළිබඳ ධනාත්මක ආකල්ප සහිත ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම -** 7.3 ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය සඳහා සක්‍රිය ව දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය පිළිබඳ සංවිධාන, ආයතන හා අණපණත් විස්තර කරයි.
2. පුරවැසියෙකු ලෙස පරිසර සංරක්ෂණයට සක්‍රිය ව දායක වීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම -** 5.7.4 "ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය නීති හඳුනා ගනිමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- කණ්ඩායම් ක්‍රියාකාරකම්

**ආකල්ප හා අගය පද්ධති**

1. ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණයේ අවශ්‍යතාව වටහා ගැනීම
2. පරිසර සංරක්ෂණය සඳහා සැම දෙනාට ම නීතිමය බැඳීමක් ඇති බව අණපණත් අනුව අවබෝධ කර ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණ පණත් හා ආයතන පිළිබඳ දැක්වෙන වාර්තා ලිපි හා පොත් පත්, පෙළපොත

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණ පණත් සහ පරිසර සංරක්ෂණයේ අවශ්‍යතාව පිළිබඳව මෙම ක්‍රියාකාරකමෙන් අවධානය යොමු කෙරේ. කණ්ඩායම් ක්‍රමය උපයෝගි කර ගනිමින් ශිෂ්‍ය කේන්ද්‍රීය ව ක්‍රියාකාරකම සිදු කළ යුතු ය.

පියවර 1

- පරිසරය විනාශ වී ගිය දර්ශනයක් දැක්වෙන පින්තූරයක් සහ ඉතා හොඳින් සංරක්ෂණය කෙරුණු පරිසරයක් දැක්වෙන පින්තූරයක් ප්‍රදර්ශනය කරමින් ඒ දෙක අතර වෙනස විමසමින් මිනිසාට හිතකර පරිසරයක් පවත්වා ගැනීමට නම් පරිසර සංරක්ෂණය අවශ්‍ය බව ප්‍රකාශ කරමින් ප්‍රවේශය ලබා ගන්න.
- ඒ මගින් පරිසර සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අණපණත් සහ ආයතන පිළිබඳව කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර II

ශිෂ්‍ය කණ්ඩායම් කර පහත තේමා අනුව කරුණු රැස් කිරීමටත් ඒවා නිසි පරිදි වාර්තා කිරීමටත් යොමු කරන්න.

- ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය හා බැඳුණු අණපණත්
- ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය හා බැඳුණු ආයතන
- පරිසර සංරක්ෂණය සඳහා ප්‍රජා දයකත්වය
- නිරන්තර කරුණු ගවේෂණයට මග පෙන්වමින් අවශ්‍ය උපදෙස් ලබා දෙන්න. එක් කළ කරුණු නිර්මාණාත්මක ව වාර්තා කරවන්න.
- පරිසර සංරක්ෂණය පිළිබඳ ශිෂ්‍ය නිර්මාණ පන්තියට ඉදිරිපත් කරවන්න.
- පන්තියට ඉදිරිපත් කරන නිර්මාණ පිළිබඳව අනෙක් කණ්ඩායම්වල අදහස් ලබා ගන්න.
- ඉදිරිපත් කිරීම් පිළිබඳව ප්‍රබලතා, දුබලතා සාකච්ඡා කරමින් අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- පාඩම සමාලෝචනය කරමින් ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- පරිසර සංරක්ෂණයේ අවශ්‍යතාව ගෙන හැර දැක්වීම
- ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය හා සම්බන්ධ ආයතන, අණපණත් විස්තර කිරීම
- පරිසර සංරක්ෂණයේ දී ප්‍රජාවගේ වගකීම පැහැදිලි කිරීම
- නිර්මාණාත්මක ව අදහස් ඉදිරිපත් කිරීම
- නියමිත කාලයෙහි සාමූහික ව ක්‍රියාකාරකම නිම කිරීම

## 5.8 1:50,000 භූ ලක්ෂණ සිතියම් නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රම හා ප්‍රස්තාර

**නිපුණතාව -** දත්ත හා තොරතුරු විශ්ලේෂණයට කිරීමට අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිත කරයි.

### හැඳින්වීම

භූගෝල විද්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමේ දී සිතියම් හා ප්‍රස්තාර ඉතා වැදගත් වේ. මේ නිසා වර්තමානයේ බහුල ව භාවිත වන අතර තාක්ෂණයත් සමග සිතියම් විද්‍යාත්මක ක්‍රමවල වර්ධනයක් ද සිදු වී තිබේ.

1 : 50,000 භූ ලක්ෂණ සිතියම් විවරණය කිරීම, දත්ත ඉදිරිපත් කිරීමේ ප්‍රයෝගික ක්‍රම, සිතියම් විද්‍යාවේ භාවිත වන නවීන ක්‍රම ශිල්ප පිළිබඳව මෙම පාඩමෙන් අවධානය යොමු කෙරේ.




1 : 50000

**නිපුණතාව -** දත්ත හා තොරතුරු විශ්ලේෂණයට කිරීමට අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිත කරයි.

**නිපුණතා මට්ටම -** 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක තොරතුරු විවරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගෙනුම් පල**

1. 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක භෞතික ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
2. භූ ලක්ෂණ සිතියමක ලක්ෂණ නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම -** 8.1.1 "1: 50,000 සිතියමක භෞතික ලක්ෂණ හඳුනා ගනිමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- ප්‍රයෝගික ක්‍රියාකාරකම
- කණ්ඩායම් / කේවල ක්‍රියාකාරකම

**ආකල්ප හා අගය පද්ධති**

1. විවිධ භූ රූප සිතියම් විද්‍යාත්මක ව හඳුනා ගැනීම
2. සිතියමක, වර්ණ හා සංකේත භාවිතයට හුරු වීම

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රී ලංකාවේ භූ විෂමතා ලක්ෂණ දැක්වෙන වර්ණ සිතියමක්
- ඇමුණුම 8.1.1.2 (පිටපත්) . සිතියම්
- ඇමුණුම 8.1.1.2 (පිටපත්) . කාර්ය පත්‍රිකාව
- විවිධ වර්ණ පැන්සල්

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

ශ්‍රී ලංකා 1 : 50,000 භූ ලක්ෂණ සිතියමකින් දැක්වෙන භෞතික ලක්ෂණ හඳුනා ගැනීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කෙරේ. සම්මත වර්ණ භාවිත කරමින් භෞතික ලක්ෂණ නිරූපණය කිරීම මගින් එම ලක්ෂණ හඳුනා ගැනීම මෙහි දී සිදු කෙරේ.

පියවර I

- ශ්‍රී ලංකාවේ භූ විෂමතා ලක්ෂණ දක්වෙන වර්ණ සිතියම ප්‍රදර්ශනය කරමින් ඒ පිළිබඳව ශිෂ්‍ය අවධානය යොමු කරවන්න. ප්‍රශ්න විමසමින් භූ ලක්ෂණ නිරූපණය සඳහා වර්ණ භාවිත කර ඇති ආකාරය පිළිබඳව අදහස් ලබා ගන්න.

පියවර II

- පාට පැන්සල්වලින් සිතියමක් වර්ණ ගැන්වීමට ශිෂ්‍යයන් යොමු කරවන්න. එහිදී නිවැරදි ව වර්ණ යොදා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

පියවර III

- ඇමුණුම 8.1.1.2 පිටපතක් බැගින් ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
- එහි සඳහන් භූ විෂමතා ලක්ෂණ හඳුනා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- එක් එක් භූ ලක්ෂණයට හා අදාළ අංකයට නිවැරදි ව සිතියමක් මත ලියා දක්වීමට උපදෙස් දෙන්න.
- අවශ්‍ය අවස්ථාවලදී ශිෂ්‍යයන්ට මඟ පෙන්වන්න.

.

පියවර IV

- ශිෂ්‍ය වැඩ පරීක්ෂා කර බලා ඒ පිළිබඳ පොදු සමාලෝචනයක් කරන්න.
- වැරදි ලකුණු කිරීමේ නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- ඇගයීම් නිර්ණායක අනුව ලකුණු පවරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- උචිත පරිදි සිතියම වර්ණ ගැන්වීම
- භූ ලක්ෂණ නිවැරදි ව ලකුණු කර දැක්වීම
- සහයෝගයෙන් කටයුතු කිරීම
- සමස්ත නිමාව සතුටුදායක බවට ඉදිරිපත් කිරීම
- නියමිත කාලයෙහි කාර්යය නිම කිරීම

ඇමුණුම 8.1.1.1




1 : 50,000

**ඇමුණුම 8.1.1.2 කාර්ය පත්‍රිකාව**

පහතින් දී ඇති තොරතුරු සඳහා සුදුසු වර්ණ, සංකේත භාවිත කර සිතියම සම්පූර්ණ කරන්න

1. කඳුවැටිය
2. කඳුමුදුන
3. නිම්නය
4. නෙරුව
5. කපොල්ල
6. කොත්කන්ද
7. තැන් උස දැක්වීම
8. දළ බෑවුම
9. මද බෑවුම
10. අතු ගංගාව
11. ප්‍රධාන ගංගාව
12. තැනිතලාව
13. ගං දඟරය
14. ගං මෝය
15. බොක්ක
16. කලපුව
17. වැලිපරය
18. දූපත
19. පරිමාණය දැක්වීම
20. නියම උතුර දැක්වීම
21. චුම්බක උතුර දැක්වීම
22. ජාල උතුර දැක්වීම
23. ගොඩබිම් ප්‍රදේශයේ පහත් ම ස්ථානය

**නිපුණතාව -** දත්ත හා තොරතුරු විශ්ලේෂණයට කිරීමට අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිත කරයි

**නිපුණතා මට්ටම -** 8.1 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක තොරතුරු විවරණය කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගෙනුම් පල**

1. මෙට්‍රික් සිතියමක භෞතික ලක්ෂණ විස්තර කරයි.
2. මෙට්‍රික් සිතියමක සංස්කෘතික ලක්ෂණ පැහැදිලි කරයි.
3. 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර ඇති සම්බන්ධතා විස්තර කරයි.

**ක්‍රියාකාරකම - 8.1.2** "භෞතික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ අතර සම්බන්ධතාව සිතියම මගින් හඳුනා ගනිමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- කණ්ඩායම් ක්‍රියාකාරකම
- ප්‍රායෝගික ක්‍රියාකාරකම

**ආකල්ප හා අගය පද්ධති**

1. සිතියම් විවරණයට හුරුව ලැබීම
2. භෞතික ලක්ෂණ හා සංස්කෘතික ලක්ෂණ අතර සම්බන්ධතා ඇති බව අවබෝධ කර ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 1 8.1.2.1 සිතියම් කොටස
- ඇමුණුම 2 8.1.2.2 කාර්ය පත්‍රිකාව
- පිළිතුරු ලිවීමට කඩදාසි

## පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්

මෙම ක්‍රියාකාරකම ඇමුණුම 1 සිතියම හා සම්බන්ධ ය. ඇමුණුම 1 හා 2 පිටපත බැගින් කණ්ඩායම්වලට සපයන්න. ප්‍රදේශයේ භෞතික ලක්ෂණ හා මානුෂ ක්‍රියාකාරකම්වල සම්බන්ධතාව විමසා බැලීම මෙම පාඩමේ මූලික අරමුණ යි.

පියවර I

- සිතියම් ඇසුරින් ප්‍රදේශයේ ස්වභාවය පිළිබඳව කෙටි සාකච්ඡාවක් ගොඩ නගන්න. මෙහි දී ප්‍රදේශයේ උසම තැන, පහත් ම ස්ථානය, ප්‍රදේශයේ විශාලත්වය, ගංගා ගලා බස්නා දිශාව, භූ විෂමතාව වැනි කරුණු කෙරේ. ශිෂ්‍ය අවධානය යොමු කරවන්න.

පියවර II

- ඇමුණුම 2හි සඳහන් අභ්‍යාසය සඳහා පිළිතුර සැපයීමට ශිෂ්‍ය කණ්ඩායම් යොමු කරවන්න. කණ්ඩායම් සාකච්ඡාව මගින් පිළිතුරු සෙවීමට පෙළ ගස්වන්න. අවශ්‍ය අවස්ථාවල ශිෂ්‍යයන්ට මග පෙන්වන්න.


පියවර III

- පිළිතුර පත්‍රිකා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න. ඒ පිළිබඳ සමාලෝචනයක් කරන්න. වැරදි පිළිතුරු නිවැරදි කර ගැනීමට හා නිවැරදි පිළිතැුරු තහවුරු කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

## තක්සේරුකරණය හා ඇගයීම

- සිතියමෙහි භෞතික ලක්ෂණ නිවැරදි ව හඳුනා ගැනීම
- සිතියමෙහි සංස්කෘතික ලක්ෂණ නිවැරදි ව නම් කිරීම
- භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර සබඳතාව දැක්වීම
- කණ්ඩායමෙහි අදහස් හුවමාරු කර ගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීම
- සමස්ත ඉදිරිපත් කිරීම සතුටුදායක ය

**ඇමුණුම 8.1.2.1**



1 : 50,000

**ඇමුණුම 8.1.2.2 කාර්ය පත්‍රිකාව**

✻ ඇමුණුම 8.1.2.1හි සඳහන් සිතියම ශ්‍රී ලංකා 1 : 50,000 සිතියම් කොටසකි. එය හොඳින් අධ්‍යයනය කර පහත දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියා දක්වන්න.

1. ප්‍රදේශය හරහා ගලා බසිනා ගංගාව නම් කරන්න
2. ප්‍රධාන ගංගාවෙන් නැගෙනහිර හා බටහිර ප්‍රදේශ අයත් වන්නේ ශ්‍රී ලංකාවේ කවර පළාත්වලට ද?
3. ප්‍රදේශයේ පිහිටි විශාල ම වැව කුමක් ද?
4. එම වැව වටා සිතියමේ දක්වා ඇති සමෝච්ච රේඛාව ආධාර කර ගෙන වැවේ ජල තලාවේ උස මීටර කීයට අඩු දැයි නිශ්චය කරන්න
5. 'අ තීරයේ' දැක්වෙන භූ විෂමතා ප්‍රදේශ අනුව 'ආ තීරය' ගළපන්න

| අ | ආ |
|---|---|
| 1. තැනිතලාව | ගෙවතු වගා |
| 2. ගොඩැලි බිම | වනාන්තර |
| 3. මද උස්බිම් | වී වගාව |
| 4. උස් බිම | ලඳු කැලෑ |

6. බටහිර මායිමෙන් A 26 මහා මාර්ගයට ඇතුළු වන ප්‍රධාන ගංගාව පසුකර B 46 මහා මාර්ගයේ හමු වන මං සන්ධියට පැමිණ එතැනින් උතුරු දෙසට දිවෙන සෙසු මාර්ගය දිගේ කි. මී. 1.5ක් ගමන් කළ විට හමුවන බෞද්ධ සිද්ධස්ථානය නම් කරන්න.
7. ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රධාන නගරය කුමක් ද?
8. එම නගරයේ පිහිටීමට බලපා ඇති හේතු 3ක් දක්වන්න
9. B 46 මහා මාර්ගයත් ප්‍රධාන ගංගාවත් අතර ප්‍රදේශයේ පිහිටි පොදු සේවා ස්ථාන හයක් නම් කරන්න
10. පල්ලෙවත්ත අංක 2 යාබද ප්‍රදේශයේ කෙරෙන වී වගාව සඳහා බලපාන භෞතික සාධක දෙකක් සඳහන් කරන්න
11. ප්‍රදේශයේ නිරිත දිග කොටසේ ජනාවාස හීන වීමට බලපා ඇති භෞතික සාධක දෙකක් දක්වන්න
12. සොරබොර වැවේ වැව් බැම්ම නිර්මාණයට සුදුසු ස්ථානය නිශ්චය කිරීමට හේතු වී ඇති භෞතික සාධකය කුමක් ද?

**නිපුණතාව -** දත්ත හා තොරතුරු විශ්ලේෂණයට කිරීමට අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිත කරයි

**නිපුණතා මට්ටම -** 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක තොරතුරු විවරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගෙනුම් පල**

1. 1 : 50,000 සිතියමක දෙන ලද භෞතික ලක්ෂණ පැහැදිලි කරයි.
2. 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක සංස්කෘතික ලක්ෂණ විස්තර කරයි.

**ක්‍රියාකාරකම -** 8.1.2 "1 : 50,000 සිතියමක ලක්ෂණ හඳුනා ගනිමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද** -

- ප්‍රායෝගික ක්‍රියාකාරකම
- කණ්ඩායම් ක්‍රියාකාරකම

**ආකල්ප හා අගය පද්ධති**

1. සිතියමක වර්ණ සංකේත හා සංඛ්‍යා භාවිතය මගින් භෞතික හා සංස්කෘතික ලක්ෂණ නිරූපණය කළ හැකි බව වටහා ගැනීම.
2. සිතියම් කියවීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන අවබෝධ කර ගැනීම

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 8.1.3.1 (කණ්ඩායමකට 1 බැගින්)
- ඇමුණුම 8.1.3.2 (කණ්ඩායමකට 1 බැගින්)
- පෙළපොතේ 8 පාඩම 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක සම්මත සලකුණු දක්වන සටහන

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

ශ්‍රී ලංකා 1 : 50,000 භූ ලක්ෂණ සිතියමක දක්වෙන සංස්කෘතික ලක්ෂණ හඳුනා ගැනීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂා කෙරේ. මෙහි දී සම්මත හා වර්ණ යොදා ගෙන ඇති ආකාරය පිළිබඳ අවධානය යොමු කරවන්න.

පියවර I

- ක්‍රියාකාරකම ඇරඹීමට පෙර 1 : 50,000 සිතියම්වල භාවිත කර ඇති වර්ණ හා සංකේත පිළිබඳව ශිෂ්‍ය අවධානය යොමු කරවන්න. මේ සඳහා 5 ශ්‍රේණිය පෙළපොතේ 141 පිටුවේ දක්වා ඇති සම්මත සලකුණු සටහන යොදා ගන්න.

පියවර II

- ඇමුණුම 8.1.3.1 සිතියමෙහි සඳහන් කර ඇති සංස්කෘතික ලක්ෂණ කෙරෙහි ශිෂ්‍යයන් අවධානය යොමු කරවන්න.
- එහි ඇති ලක්ෂණ හඳුනා ගැනීමට ශිෂ්‍යයන් උනන්දු කරවන්න.
- එක් එක් ලක්ෂණය සඳහා සිතියමේ යොදා ඇති අංකය ඇමුණුම 8.1.3.2 හි සඳහන් ලැයිස්තුවේ එම ලක්ෂණය ඉදිරියෙන් සටහන් කරවන්න.
- සිතියමේ හඳුනා ගත් භූ ලක්ෂණ ඇසුරින් සිතියම කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- සිතියමක් කියවීමෙන් ලැබෙන ප්‍රයෝජන ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.


පියවර III

- ශිෂ්‍යයන් සටහන් කළ ලැයිස්තුව ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- පත්‍රිකා පරීක්ෂා කර බලා ඒ පිළිබඳ පොදු සමාලෝචනයක් කරන්න.
- වැරදි නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙමින් ඒ සඳහා මග පෙන්වන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- සංකේත නිවැරදි ව හඳුනා ගැනීම
- භූ ලක්ෂණ නිවැරදි ව දැක්වීම
- සංකේත ඇසුරු කරගෙන සිතියම කියවීම
- කණ්ඩායමක සහයෝගයෙන් ක්‍රියා කිරීම
- සමස්ත නිමාව සතුටුදායක වීම

ඇමුණුම 8.1.3.1



Tirappane
Tirappane Bazaar
Ethungama
Morakulama
Hinnawatha Wewa
Habakoda Wewa
Pathirajagama
Sembukulama
(HURULUPALATA SOUTH)
Turuwila Junction
Ethungama Junction
Galkiriyagama
Ulagalla
Karambe
Allisiana
Wannanmaduwa
Kudawewa
Dikwewa
Pillarlakondaragama
Manakkulama
Obadayagama
Wagayakulama
OBADAYAGAMAKANDA
Kuda Kanumulla
Kahagallegama
Mawatawewa
Mongastegama
Karambegama
Pethisrembewa
Bulankulama
Pudukkulama
Walagambahuwa
Badegama
Periyakulama
AVERIYAGAHAGALGE
147.52
Daragama
JAFFNA ROAD
Vendarankulama
Wanamal Uyana
Ihala Puliyankulama
Walagambahuwa
Konapathirawa
Badaheiawewa
Ulankulama
KEKIRAWA DI
Palankulama
Itikattiya
IPALOGAMA DIVISION
(KALAGAMPALATA NORTH)
Mochchagama
Kandubodagama
Pahala Puliyankulama
Kuda Ittikattiya
Kanopathirawa 3 km
Moradankadawala 3.5 km
1 : 50,000

ඇමුණුම 8.1.3.2 කාර්ය පත්‍රිකාව

- ප්‍රධාන පාර
- සෙසු මාර්ගය
- ගුරු පාර
- අඩි පාර
- පාලම
- වැව
- වැව් බැම්ම
- ත්‍රිකෝණමිතික ස්ථානය
- තැන් උස දැක්වීම
- ගල
- ප්‍රධාන ගංගාව
- අතු ගංගාව
- ප්‍රධාන ගංගාව හා අතු ගංගාව සම්බන්ධ වන ස්ථානය
- වී කුඹුරු
- ගෙවතු වගාව
- වෙනත් වගා
- ලඳු කැලෑ
- වනාන්තර
- හේන
- පාසල
- උප තැපැල් කාර්යාලය
- බෞද්ධ සිද්ධස්ථානය
- තානායම
- ඓතිහාසික ස්ථානය
- පොලීසිය
- දේශාංශ අගය
- ජාල අගය
- පරිමාණ සටහන

**නිපුණතාව -** දත්ත හා තොරතුරු විශ්ලේෂණයට කිරීමට අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිත කරයි.

**නිපුණතා මට්ටම -** 8.2 විවිධ සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්පවල ඇති ප්‍රයෝජන සොයා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 01

**ඉගෙනුම් පල**

1. නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප විස්තර කරයි.

2. නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්පවල ප්‍රයෝජන විස්තර කරයි.

**ක්‍රියාකාරකම -** "8.2.1 නව සිතියම් විද්‍යාත්මක ක්‍රමවල ප්‍රයෝජන"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- කණ්ඩායම් ක්‍රියාකාරකම්

**ආකල්ප හා අගය පද්ධති**

1. සිතියම් විද්‍යාත්මක ක්‍රම ශීඝ්‍රයෙන් වෙස් වන බව වටහා ගැනීම

2. නව සිතියම් විද්‍යාත්මක ක්‍රම නිසා එදිනෙදා කාර්යයන් ඉක්මනින් හා පහසුවෙන් කළ හැකි බව අවබෝධ කර ගැනීම.

**ගුණාත්මක යෙදවුම්**

- ඇමුණුම 8.2.1.1

- පෙළපොත, GIS හා GPS ගැන ලියවුණු පත්‍රිකා, වාර්තා ආදිය

## පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්

### හැඳින්වීම

නව සිතියම් විද්‍යාත්මක ක්‍රමවල අංග සහ ප්‍රයෝජන හඳුනා ගැනීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිතය. කණ්ඩායම් ක්‍රමය මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය ව ඉගෙනුම් පල ළඟා කරවිය යුතුය.

ජංගම දුරකථනය හෝ වීඩියෝ පටයක් මගින් ප්‍රදේශයක සිතියමක් ප්‍රදර්ශනය කර ඒ පිළිබඳව විමසමින් පිවිසීම. සිතියම ලබා ගත් ආකාරය හා සිතියම පිළිබඳවත්, පෙර දැනුමත් විමසා සාකච්ඡාව මෙහෙයවන්න.

ශිෂ්‍ය කණ්ඩායම් කර පහත කාර්ය පත්‍රිකාව එක බැගින් ලබා දෙන්න.

ඇමුණුම 8.2.1.1

## කාර්ය පත්‍රිකාව

1. භූගෝලීය තොරතුරු පද්ධතිය GIS යනු කුමක් ද?

2. අවකාශීය දත්ත නිදසුන් සහිත ව විස්තර කරන්න.

3. අවකාශීය නොවන දත්ත නිදසුන් සහිත ව විස්තර කරන්න.

4. භූගෝලීය තොරතුරු පද්ධතියේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න

5. භූගෝලීය තොරතුරු පද්ධතියේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න

6. භූගෝලීය තොරතුරු පද්ධතියේ ප්‍රධාන සංරචක මොනවා ද?

7. භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ GPS මූලික උපාංග මොනවා ද?

8. භූගෝලීය තොරතුරු පද්ධතියේ GIS ප්‍රයෝජන මොනවා ද?

9. භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ GPS ප්‍රයෝජන මොනවා ද?

- කාර්ය පත්‍රිකාව බෙදා දී නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමකට සූදානම් වන ලෙස ශිෂ්‍යයන්ට උපදෙස් ලබා දෙන්න. පෙළපොත හා වෙනත් මූලාශ්‍ර භාවිතයට ශිෂ්‍යයන් යොමු කරවන්න.

- ශිෂ්‍යයන් සකස් කරන ලද නිර්මාණය ඉදිරිපත් කරවන්න.
- අනෙක් කණ්ඩායම්වල ශිෂ්‍යයන්ට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- ප්‍රබලතා, දුබලතා සාකච්ඡා කරමින් අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- පාඩම සාරාංශ කරමින් ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- නව සිතියම් විද්‍යාත්මක ක්‍රම පිළිබඳව විස්තර කිරීම
- GIS හා GPS වල අංග හා ප්‍රයෝජන පැහැදිලි කිරීම
- GIS හා GPS වල ප්‍රයෝජන ඉදිරිපත් කිරීම
- නිර්මාණාත්මක ව ක්‍රියාකාරකම නිම කර ඉදිරිපත් කිරීම
- නියමිත කාලයෙහි සාමූහික ව ක්‍රියාකාරකම නිම කිරීම

**නිපුණතාව -** දත්ත හා තොරතුරු විශ්ලේෂණයට කිරීමට අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිත කරයි.

**නිපුණතා මට්ටම -** 8.2 විවිධ සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්පවල ඇති ප්‍රයෝජන සොයා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 01

**ඉගෙනුම් පල**

1. නව සිතියම් විද්‍යාත්මක ක්‍රම වල විකාශනය පැහැදිළි කරයි.

2. නව සිතියම් විද්‍යාත්මක ක්‍රම භූගෝල විද්‍යාවට වැදගත්වන ආකාරය සාකච්ඡා කරයි.

**ක්‍රියාකාරකම -** 8.2.2 "නව සිතියම් විද්‍යාත්මක ක්‍රම හඳුනා ගනිමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා අගය පද්ධති**

1. නව සිතියම් විද්‍යාත්මක ක්‍රමවල වැදගත්කම වටහා ගැනීම.

2. නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ප්‍රයෝජනවත් ව යොදා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දීම.

**ගුණාත්මක යෙදවුම්**

- GIS හා GPS පිළිබඳව ලියවුණු වාර්තා හා ලිපි

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

**හැඳින්වීම**

නව සිතියම් විද්‍යාත්මක ක්‍රමවල විකාශය හා අවශ්‍යතාව මෙන් ම සිතියම් විද්‍යාත්මක ක්‍රම පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. එමෙන් ම සාකච්ඡා ක්‍රමය යොදා ගනිමින් ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් පල තහවුරු කිරීමට යෝජිත ය.

යම්කිසි ප්‍රදේශයකට ගමන් කිරීම සඳහා මාර්ගය සොයා ගන්නා ආකාරය පිළිබඳව කෙටි සාකච්ඡාවක් මෙහෙය වන්න. තම පාසල් පිරිවෙන් වාර්ෂික අධ්‍යාපන චාරිකාව සැලසුම් කිරීම වුව ද මේ සඳහා යොදා ගත හැකි ය. එහිදී මාර්ග සොයා ගත හැකි විවිධ ක්‍රම පිළිබඳව ශිෂ්‍යයන් ද කරුණු ඉදිරිපත් කරනු ඇත. ජංගම දුරකථනය මගින් නවීන ක්‍රම යොදා ගෙන මාර්ග සොයා ගන්නා ආකාරය පිළිබඳව ද කරුණු ඉදිරිපත් කරන්න. ඒ අනුව''නව සිතියම් විද්‍යාත්මක ක්‍රම'' තේමාවට පිවිසිය හැකිය.

අතීත සිතියම් භාවිතයේ සිට නව විද්‍යාත්මක ක්‍රම අනුව නිර්මිත සිතියම් දක්වා විකාශනය වී ඇති ආකාරය පිළිබඳව කෙටි සාකච්ඡාවක් මෙහෙයවන්න.

නව සිතියම් විද්‍යාත්මක ක්‍රම (භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) හා (GPS) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය) කෙටියෙන් සාකච්ඡා කරන්න.

සාකච්ඡා කරන ලද කරුණු තහවුරු කරමින් කෙටි ප්‍රශ්න කීපයක් ශිෂ්‍යයන්ට ලබා දී පිළිතුරු ලබා ගන්න.

ප්‍රශ්න සඳහා ලැබුණු පිළිතුරු අනුව ප්‍රබලතා, දුබලතා සඳහා ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

- නව සිතියම් විද්‍යාත්මක ක්‍රම මොනවා දැයි පැහැදිලි කිරීම
- සිතියම් විද්‍යාත්මක ක්‍රමවල විකාශය විස්තර කිරීම
- නව සිතියම් විද්‍යාත්මක ක්‍රම භූගෝල විද්‍යාවේදී වැදගත් වන ආකාරය පැහැදිලි කිරීම
- සක්‍රීය ව සාකච්ඡාවට දායක වීම
- අසන ලද ප්‍රශ්නවලට නියමිත කාලයෙහි පිළිතුරු සැපයීම

**නිපුණතාව -** දත්ත හා තොරතුරු විශ්ලේෂණයට කිරීමට අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිත කරයි.

**නිපුණතා මට්ටම -** 8.3 ප්‍රස්තාර යොදා ගනිමින් දත්ත අර්ථ කථනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. සරල ප්‍රස්තාර නිර්මාණය කරන ආකාරය පැහැදිලි කරයි.

2. ප්‍රස්තාරවල ප්‍රයෝජන විස්තර කරයි.

**ක්‍රියාකාරකම -** 8.3.1 ''ප්‍රස්තාරවල අගය වටහා ගනිමු''

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

* සාකච්ඡා හා ප්‍රායෝගික ක්‍රියාකාරකම

**ආකල්ප හා අගය පද්ධති**

1. ප්‍රස්තාර භාවිතයේ අවශ්‍යතාව හා වැදගත්කම වටහා ගැනීම.

2. ප්‍රස්තාර කියවීමෙන් තොරතුරුවල ලබා ගත හැකි බව අවබෝධ වීම.

**ගුණාත්මක යෙදවුම්**

* පෙළපොත
* ඇමුණුම 8.3.1.1 කාර්ය පත්‍රිකාව
* ඇමුණුම 8.3.1.2 ප්‍රස්තාර

පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්

හැඳින්වීම

සරල තීරු, සරල රේඛා සහ වෘත්ත ප්‍රස්තාර හඳුනා ගැනීම මෙන් ම ඒවායේ ප්‍රයෝජන පිළිබඳව අවධානය යොමු කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා සාකච්ඡා මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය ව ක්‍රියාකාරකම සිදු කළ යුතුය.

පියවර I

- සංඛ්‍යා වගුවක් සහ ඊට අදාළ ප්‍රස්තාරයක් ප්‍රදර්ශනය කරමින් ඒවායේ වාසි හා අවාසි වෙන වෙන ම විමසන්න. ඒ මගින් සංඛ්‍යා වගු සහ ප්‍රස්තාර යන්නට පිවිසෙන්න. ඒ පිළිබඳව තවදුරටත් කෙටි සාකච්ඡාවක් මෙහෙය වන්න.
- කාර්ය පත්‍රිකාව හා ඇමුණුම සෑම ශිෂ්‍යයෙකුට ම බෙදා දී ක්‍රියාකාරකම සඳහා උපදෙස් ලබා දෙන්න. මුලින් ම ඇමුණුමෙහි අඩංගු ප්‍රස්තාර ඇසුරින් පහත දැක්වෙන ඒවා හඳුනා ගැනීමට යොමු කරන්න. ප්‍රස්තාර හඳුනා ගත් පසු කාර්ය පත්‍රිකාවෙහි දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගන්න.

- සරල රේඛා ප්‍රස්තාර
- සරල තීරු ප්‍රස්තාර
- බෙදූ වෘත්ත ප්‍රස්තාර

- ශිෂ්‍යයන්ගේ පිළිතුරු පන්තියට ඉදිරිපත් කරවන්න.
- පිළිතුරුවලට අනෙක් ශිෂ්‍යයන්ගේ ප්‍රතිචාර ලබා දෙන්න.
- ශිෂ්‍යයන්ගේ පිළිතුරුවල ප්‍රබලතා දුබලතා සාකච්ඡා කරන්න.
- පාඩම සමාලෝචනය කරමින් සාරාංශ කර ගැනීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.


ඇමුණුම 8.3.1.1

**කාර්ය පත්‍රිකාව**

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. සංඛ්‍යා සටහනක් ප්‍රස්තාරයක් මගින් දැක්වීමෙන් ලැබෙන ප්‍රයෝජන මොනවා ද?
2. ප්‍රස්තාරයක් නිර්මාණය කිරීමේ පියවරයන් අනුපිළිවෙළින් සඳහන් කරන්න.
3. තීරු ප්‍රස්තාරයක සිරස් සහ තිරස් අක්ෂ හඳුන්වා දී ඒවායේ දැක්විය හැකි දත්තයකට නිදසුන් සපයන්න.
4. මූලාශ්‍රය හා යතුර යන ඒවා මොනවා දැයි කෙටියෙන් නිදසුන් දෙමින් විස්තර කරන්න.

ඇමුණුම 8.3.1.2 ප්‍රස්ථාර




**තක්සේරුකරණය හා ඇගයීම**

- ✳ ප්‍රස්තාර භාවිතයේ අවශ්‍යතාව හා වැදගත්කම විස්තර කිරීම
- ✳ සරල ප්‍රස්තාර වර්ග හඳුනා ගෙන නම් කිරීම
- ✳ ප්‍රස්තාරයක් නිර්මාණය කරන ආකාරය පැහැදිලි කිරීම
- ✳ නියමිත කාලයට සාර්ථක ව කාර්ය නිම කිරීම
- ✳ සාකච්ඡාවට සක්‍රීය ව සහභාගී වීම

**නිපුණතාව -** දත්ත හා තොරතුරු විශ්ලේෂණයට කිරීමට අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිත කරයි.

**නිපුණතා මට්ටම -** ප්‍රස්තාර යොදගනිමින් දත්ත අර්ථ කථනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 01**

**ඉගෙනුම් පල**

1. ප්‍රස්තාරයක් පිළිබඳව අවබෝධය ප්‍රකට කරයි.

2. ප්‍රස්තාර භාවිතයෙන් දෙන ලද දත්ත විස්තර කරයි.

**ක්‍රියාකාරකම -** 8.3.2 "ප්‍රස්තාර ඇසුරෙන් ගැටලු විසඳමු"

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද**

* කණ්ඩායම් ක්‍රමය
* ප්‍රශ්නකරණය

**ආකල්ප හා අගය පද්ධති**

1. ප්‍රස්තාර භාවිතයෙන් දත්ත අවබෝධ කර ගැනීම පහසු වන බව අවධාරණය කිරීම.

2. දෘශ්‍ය මාධ්‍යයක් ලෙස ප්‍රස්තාර අගය කිරීම

**ගුණාත්මක යෙදවුම්**

* ඇමුණුම 8.3.2.1 ප්‍රස්තාර සටහන්
* ඇමුණුම 8.3.2.2 කාර්ය පත්‍රිකාව

**පාඩම සංවර්ධනය කිරීම සඳහා උපදෙස්**

**හැඳින්වීම**

ප්‍රස්තාර භාවිතයෙන් දත්ත අවබෝධ කර ගැනීමේ හැකියාව ප්‍රගුණ කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. ශිෂ්‍ය සංඛ්‍යාව අනුව කණ්ඩායම් හෝ කේවල වශයෙන් ඉගෙනුම් පල සාධනය කර ගැනීම සිදු කළ යුතු ය.

පියවර I

- සංඛ්‍යා, වගුවක් කියවීමට දීම හා එම වගුවෙන් දැක්වෙන සුවිශේෂ ලක්ෂණ විමසන්න. එම සුවිශේෂී ලක්ෂණ හඳුනා ගැනීමේ දී වගුවෙන් හා ප්‍රස්තාරයෙන් වඩාත් පහසු කුමක් දැයි විමසීම, ඒ මගින් පාඩමට ප්‍රවේශය ලබා ගන්න.

පියවර II

- කේවල හෝ කණ්ඩායම් ලෙස ශිෂ්‍යයන්ට කාර්ය පත්‍රිකාව හා ඇමුණුම බෙදා දෙන්න. එහි තිබෙන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ශිෂ්‍යයන් යොමු කරන්න. අවශ්‍ය අවස්ථාවල දී මග පෙන්වීම් සිදු කරන්න.

පියවර III

- ශිෂ්‍යයන් සපයන ලද පිළිතුරු ඉදිරිපත් කරවන්න. ඒවායේ ප්‍රබලතා, දුබලතා පිළිබඳව අනෙක් ශිෂ්‍යයන්ගේ අදහස් ලබා ගන්න.

- ශිෂ්‍ය අදහස් ද සැලකිල්ලට ගෙන ප්‍රබලතා දුබලතා ඉදිරිපත් කර ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- පාඩම සමාලෝචනය කරමින් ශිෂ්‍යයන් ඇගයීමට ලක් කරන්න.

**තක්සේරුකරණය හා ඇගයීම**

✳ ප්‍රස්තාර ඇසුරෙන් දෙන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම


✳ ප්‍රස්තාර පිළිබඳ අවබෝධයෙන් තොරතුරු විස්තර කිරීම

✳ පැහැදිලි හා නිවැරදි ව නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම

✳ නියමිත කාලයට සාර්ථක ව නිම කිරීම

✳ සාමූහිකත් ව ගුණාංග ප්‍රදර්ශනය කිරීම

ඇමුණුම 8.3.2.1 ප්‍රස්තාර සටහන්




8.3.2.2 කාර්ය පත්‍රිකාව

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. මෙම ප්‍රස්තාර වර්ගය හඳුන්වන නම කුමක් ද?
2. ප්‍රස්තාරයේ සිරස් සහ තිරස් රේඛා මගින් දැක්විය හැකි විචල්‍ය කීපයක් වෙන වෙන ම දක්වන්න.
3. ප්‍රස්තාරයට අනුව ජන සංඛ්‍යා වර්ධනයේ උපරිම අගයක් වාර්තා කරන වර්ෂය කුමක් ද?
4. ජන සංඛ්‍යා වර්ධනයේ අවම අගයක් වාර්තා කරන වර්ෂය කුමක් ද?
5. ජන සංඛ්‍යා වර්ධනය එක ම අගයක් ගෙන ඇති වර්ෂ 3ක් මෙහි දක්නට ලැබේ. එම අගය කුමක් ද?
6. ජන සංඛ්‍යා වර්ධනය ශීඝ්‍ර ලෙස ඉහළ යාමට ගත වී ඇති කාලය කොපමණ ද?
7. මෙම ප්‍රස්තාරයට අනුව ජන සංඛ්‍යා වර්ධනයෙහි හඳුනා ගත හැකි ප්‍රවණතාව කුමක් ද?